# අංජනම් එළි බැලීම



රොබට් අමරසේන

# අංජනම් එළි
# බැලීම


ඇතගම ඊබට් අමරසේන

(රාජ්‍ය කලා භූෂණ - කලා කීර්ති
කවියට - ලේඛන කලාවට - ආයුර්වේදයට
අභිනන්දන උපහාර ලත් දීපසාම විනිසුරු)


ආපසු භාර ගනු නොලැබේ


ප්‍රකාශනය හා බෙදාහැරීම
ජයසිංහ පොත් ප්‍රකාශකයෝ
කොරනෙල්වත්ත පාර, ඇටියාවල, දන්කොටුව.
ටෙලි. 031-4923523 / 0779038985

මුද්‍රණය : වාසනා ප්‍රින්ටර්ස්, කටුකෙන්ද, දන්කොටුව. 2012 ජූනි

## අතීතයෙන් අපට - අපෙන් අනාගතයට

අපට බාහිරව නොපෙනුණ ද යන්ත්‍ර මන්ත්‍ර ක්ෂේත්‍රය කෙරෙහි ඇල්මක්. ඒ පිළිබඳ සොයා බැලීමක් කරන බුද්ධිමත් පිරිසක් සිටින බව පෙනේ. පසුගිය වසර දෙක තුන තුළ මම එය පැහැදිලිව දුටුවෙමි. එසේම ගුරුකම් කරන අය, ජනතාවගේ සේසත උදුරා ගන්නා ප්‍රසිද්ධ අප්‍රසිද්ධ අය ගැන යන්ත්‍ර මන්ත්‍ර කර ගත් අයගෙන්ම දැන ගත්තෙමි.

අසරණ වූවෙක් වෙත් ද ඔහු හෝ ඇය හෝ පෙනෙන දේවලින් අසාධාරණයක් වන විට නොපෙනෙන දේවල් සොයා යයි. එසේ යන්නේ එය නූගත්කම හෝ මෝඩකම හෝ නිසා නොවේ. තමාගේ සිතට දැනෙන වේදනාවට පීඩාවට පිළිසරණක් ලබා ගන්නා අදහසිනි. සෑම දෙයකින්ම සෑම කෙනෙක්ම සූරා කෑමට සූදානම්ව සිටින සමාජයක් තුළ මේ පිරිස ද සූරා කෑමට භාජනය වේ.

හරියට හරියන කිසිවක් ලොව තුළ නැත. කෙනකුට යමක් හරි ගිය නිසාම, තවත් කෙනකුට ඒ ලෙසින්ම හරි යන්නේ නැත. එසේ වෙත් නම් සියල්ලෝම නිදුක් නිරෝගී සම්පත් ඇති මිනිසුන් වෙති.

බොහෝ දෙනකුගේ ඉල්ලීම පරිදි පැරණි ගුරුකම් සොයා යන මට දසක හයකට හතකට පෙර පොත් කිපයක සටහන් ඉන්ද්‍රජිත් ගුණරත්න නම් මහතකුගෙන් ලැබිණ. කිසිම කෙනකුට ලබා දී නොතිබුණ මෙම සටහන් මගේ කර්තව්‍ය කෙරෙහි පැහැදී ඔහු මා හට ලබා දුන්නේ දැඩි විශ්වාසයකිනි. මෙම පොත්වල සටහන් අතර "මතු පරපුර සඳහා ආරක්ෂා කරනු" යනුවෙන් සඳහන් වී තිබිණ.

ගුරුමුෂ්ටිය සහිතව අත්දුටු සත්‍ය ඒවා බවට ද සහතික කර තිබුණු බව පැහැදිලිය. අංජනම් සෑදීම, බැලීම මෙයින් උගන්වනු ඇත.

ඇතගම ඒබට් අමරසේන

ඇතගම, කළුතර.

දු.අ. 034-4901996



## පටුන

01. අංජනම් එළි ඉතිහාසය
02. අංජනම් එළි පෙනෙන්නේ කාට ද?
03. අංජනම් එළි නාමයන්
04. අංජනම්වලට පෙර සූදානම
05. පන්දමකින් අඳුන් බැස්සවීම සහ අඳුන ගලක ඇඹරීම
06. මල් බුලත් පුටුව සාදා ගැනීම
07. පාන් තිර ඇඹරීම
08. පාන් තිරය අතට ගැනීමට
09. පාන් තිරය ඇල්වීමට
10. බෙහෙත් හෙප්පුවට මැතිරීම
11. අංජනම් එළිය බැලීම
12. මල් බුලත් පුටුවට දුම් ඇල්ලීම
13. මල් බුලත් පේ කිරීම
14. බලන අයට ආරක්ෂාව
15. එළිය වැඩි වීමට සහ අඳුර නැති වීමට
16. අඳුන ගෑ පීරිසි තට්ටුව පසා වී පෙනීමට
17. හනුමා විශාල වී පෙනීමට
18. දෙවි දේවතාවුන් නොසලකනවා නම්
19. එළිය අපැහැදිලි නම්
20. අංජනම් දේවිට එළිය ඇල්ලීමට
21. හනුමන්තා ද අංජනම් දේවිය ද දෙවිවරුන් ද ගෙන්වීම
22. එළිය වුවමනා තැනට යැවීම
23. සියලු අංජනම් ක්‍රියා ආරම්භයට මතුරන ජීවම
24. කපුරු අඳුන සකස් කර ගන්නා අයුරු
25. අඳුන සාදා ගැනීම
26. පහන් ඇල්ලෙන් බලන අංජනම් එළිය
27. වතුර සෙම්බුවෙන් සහ වීදුරුවෙන් අංජනම් බැලීම

28. හනුමා පුද සහිත කපුරු අඳුන
29. විනාඩි කිපයක දී අත්දැකිය හැකි කපුරු අඳුන
30. අංජනම් පලිප්පුවක්
31. පහන් දැල්ලෙන් බලන දිෂ්ටි අංජනමක්
32. නේත්‍ර දිෂ්ටියක්
33. දෙවිවරුන් කනට ඇසෙන්නට කතා කිරීම
34. අංජනම් එළිවලට පෙනී සිටින දෙවිවරුන් කතා කරවීම
35. විෂ්ණු මල් අඳුන
36. විෂ්ණු මල් අඳුනට නියම ජීවම මන්ත්‍ර
37. යක්ෂයින් පේන නේත්‍රාංජනමක්
38. තැඹිලි ගෙඩියේ කපුරු අඳුන
39. භූමි වස්තු පිළිබඳ පාතාල අංජනමක්
40. භූමි වස්තු පිළිබඳ භෛරව අංජනම
41. නියපිට ගා බලන භූත අංජනමක්
42. දවස මුළුල්ලේ වැඩ ගත හැකි ප්‍රේත අංජනමක්
43. සූර්ය අංජනම
44. යක්ෂයින් ගෙන්වන යක්ෂ අංජනමක්
45. ලෙඩ ගුරුවාංග අඳුන
46. දිවා - රාත්‍රී දෙකටම සුදුසු සර්වාංජනම
47. බුලත් ගා බලන තවත් අංජනමක්
48. දේවතා අංජනමක්
49. තවත් ප්‍රත්‍යක්ෂ අංජනමක්
50. උප්පත ගා බලන දිව්‍ය අංජනමක්
51. කන්ද කුමාර අංජනම
52. අමනුෂ්‍යයින් වසඟ කරන දිව්‍ය රාජ අඳුන
53. බුලතේ පොල්තෙල් ගා බලන දිව්‍ය අංජනමක්
54. සෝම අංජනම
55. මහා සෝම අංජනම
56. රාත්‍රී වතුර වීදුරුවෙන් බලන සෝම අංජනම



57. සූර්යය සෝම අංජනම
58. කුඩා සෝම රාජ අංජනම් සර්වාරක්ෂක හා සර්වජන වශීයක්
59. තවත් කුඩා සෝම අංජනමක්
60. තවත් කුඩා සෝම රාජ අංජනමක්
61. තවත් කුඩා සෝම අංජනමක්
62. අංජනම් එළියට පෙනී සිටින පංච දේවතාවෝ
63. දේවතා පිරිසක් එකවර පමුණුවන මහා සෝම රාජ අංජනම
64. ශ්‍රී කාන්තා සෝම අංජනම
65. සිරිදේවි අංජනමට ගෙන්වා මූදේවි පලවා හැරීම
66. වේතාල සෝම අංජනම
67. බලගතු හනුමා දලු අඳුන
68. නැකැත් යෝග බලයෙන් හා ඖෂධ බලයෙන් මන්ත්‍ර රහිතව බලන කන්ද කුමාර අඳුන
69. මන්ත්‍ර නැතිව බෙහෙත් සහ නැකැත් බලයෙන් එළිය බැලීමට විෂ්ණු අංජනමක්
70. කුජ දින - කුජ හෝරා බුද දින - බුද හෝරා
71. නාථ, සමන්, විභීෂණාදී දෙවිවරුන් වැඩ කර දෙන මහා විෂ්ණු අඳුන
72. අංජනම් මුද්‍රව
73. කිලි කුණු වැළැක්වීම
74. පංචෝපචාරය

## 1. අංජනම් එළි ඉතිහාසය

රාම රාවණා යුගයෙන් අංජනම් එළි බැලීම ආරම්භ වී ඇතැයි ඒ පිළිබඳ තතු දත්තෝ සටහන් තබා ඇත. මෙයට ප්‍රධාන හේතුව වන්නේ අංජනම් එළි බැලීමට මුල් වන්නේ අංජනම් දේවිත්, හනුමන්තාත් යන දෙදෙනාය. රාම රාවණා යුගයේ සහ යුද්ධයේ වීරයා වූයේ හනුමන්තාය. හනුමන්තා අංජනම් දේවියගේ පුතා වෙයි. මේ මවත්, පුතාත් අංජනම් එළියේ නායකත්වය දරනු ඇත. අංජනම් දේවි අවකාශයටත්, හනුමන්තා වායුවටත් ප්‍රධානීන්ය. එනිසා මේ දෙදෙනාගේ මග පෙන්වීමක් නොමැතිව අංජනම් එළි බැලීම කළ නොහැකිය.

## 2. අංජනම් එළි පෙනෙන්නේ කාට ද?

ඖෂධ සොයාගෙන අඳුනක් සාදා ගත්ත ද එළිය බැලීමට සුදුස්සෙක් අවශ්‍යය. සෑම අයෙක්ම සුදුස්සෙක් නොවේ. එළිය හොඳින් පෙනෙන කෙනකු සොයා ගැනීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

බල්ලන් විසින් සපා කෑ පුද්ගලයන්ට ද, සර්පයින් විසින් දෂ්ට කළ අයට ද, ගින්දරෙන් පිලිස්සුණු අයට ද, කිඹුලන් අත ගැ අයට ද, ශරීරය කෙට්ටු අයට ද, අපිරිසිදු කිලි සහිත මස් කන අයට ද, එළිය නොපෙනේ. මනුෂ්‍ය ගණ හෝ වානර යෝනියේ උපන් අයටත්, දුඹුරු ඇස් ඇත්තන්ටත් විශේෂයෙන්ම අංජනම් එළි පෙනෙන බව සඳහන් කර ඇත්තේ පැරණිම ග්‍රන්ථවලය. ඇස් රෝගීන් ද, වයස අවුරුදු 12 න් පහළ 50 න් ඉහළ අය ද අංජනම් එළි නොබැලිය යුතුය. එහෙත් හොඳ මානසික තත්ත්වයක් ඇති 50 න් ඉහළ අය පේන කීමේ වරදක් නැත.

## 3. අංජනම් එළි නාමයන්

විවිධ නම්වලින් හඳුන්වන අංජනම් එළි අතර සර්වාංජනම් අංජනම, පාතාල අංජනම, යක්ෂ ප්‍රේත අංජනම, භූතාංජන අංජනම, දිව්‍යාංජනම, දේවතා අංජනම, හස්ත අංජනම, නේත්‍ර

අංජනම, සූර්ය අංජනම, විෂ්ණු අංජනම ආදිය වේ.

**සර්වාංජනම් :-**

සියලු දෙනාටම පෙනෙන අංජනමකි. අනෙක් අංජනම්වලට වඩා ඒවා බලන බොහෝ දෙනාට පළමු දවසේ සිටම පෙනෙතත් සියලු දෙනාටම පෙනෙන්නේ සිද්ධි කර ගත් විට දීය. කාටත් පේන බැලීමට සිද්ධි කර ගන්නේ කෙසේ ද යන්න නවකයින්ට ප්‍රශ්නයකි.

දිනකට පැය බාගයක් පමණ අඳුන දෙස බලාගෙන ඒ දෙසටම සිත යොමු කර තබා ගැනීමෙන් කෙනකුට මසකින් පමණ ද, තවත් කෙනකුට තෙමසකින් පමණ ද, තවත් අයට දොළොස් මසකින් පමණ ද පෙනේ. ඒ අනුව අංජනම් සිද්ධිය ලැබේ. ස්ත්‍රී පුරුෂයින් අතර නිසැකයෙන්ම අංජනම් එළි පෙනෙන අය සිටිති. උත්සාහය තුළින් ඉහත සඳහන් අයුරු ක්‍රියා කිරීමෙන් තමන්ට අංජනම් එළි බැලීමට හැකියාව ඇති කර ගැනීමට පුළුවන් වන බව සිහි තබා ගත යුතුය.

**පාතාල අංජනම :-**

පාතාල අංජනම යනු පොළොව යට නොහොත් පාතාලයේ තිබෙන රන්, රිදී, මුතු, මැණික් නිධන් යනාදිය බලා ගත හැකි අංජනමකි.

**යක්ෂ ප්‍රේත අංජනම :-**

නිවෙස් තුළ නොබැලිය යුතුය. ඒ අංජනම බලන අය ආපසු යැවිය යුත්තේ ආරක්ෂාවක් කිරීමෙනි. අංජනම බලා අවසන් වූ වහාම දිෂ්ටිය පිටමං කළ යුතුය. යකැදුරන් සඳහා මෙම අංජනම යෝග්‍යය.

භූත අංජනම්, දිව්‍ය අංජනම්, දේවතා අංජනම්, හස්ත අංජනම්, නේත්‍ර අංජනම්, සූර්ය අංජනම්, විෂ්ණු අංජනම් සියලු සුබ වැඩට යහපත්ය. ලෙඩ රෝග දැන ගැනීමට, බෙහෙත් කිමට ද මෙම අංජනම් සුදුසුය.



## 4. අංජනම්වලට පෙර සූදානම (හෙවත් සියලු අංජනම්වලට සාධාරණ න්‍යාය)

*1. ගස්වැල්වල මුල් ගලවා ගැනීමට :-*

අඳුනට අවශ්‍ය වන ගසක හෝ වැලක මුලක් ගලවා ගැනීමට ප්‍රථම මේ මන්ත්‍රයෙන් 7 වරක් මතුරා ගලවා ගන්න.

"ඕං හ්‍රීං හ්‍රීං සර්වේ සර්වේ රහිතේ රහිතේ ක්ලිං ක්ලිං සර්වේ සර්වේ හිතේ හිතේ සර්වේ ඖෂධ ප්‍රාණ හිතේ විතරෙ නමෝ නම ස්වාහා"~

*2. වෙනත් ද්‍රව්‍ය ගැනීමේ දී*

අංජනම් සඳහා ගන්නා වෙනත් ද්‍රව්‍යයන් පහත මන්ත්‍රයෙන් 7 වරක් මතුරා ගන්න.

"ඕං කාලි කාලි මහාකාලි රක්ෂේදමංජනං නමෝ සිධෙ ස්වාහා"~

*3. ගින්දර ගැනීමේ දී*

පාතාල අංජනම, යක්ෂ අංජනම, ප්‍රේත අංජනම්වලට ගින්දර ගැනීමට නියම කර ඇත්තේ රදා ගෙදරකින් හෝ සොහොන් පිටියකිනි.

"ඕං ජ්වලිත දෲතිඃ දෙදිංෂාය ස්වාහා"~ මෙම මන්ත්‍රය 7 වරක් කියවා ගින්දර ගත යුතුයි.

*4. ගින්දර රකිනා මන්ත්‍රය*

ගින්දර ඇවිළෙද්දී අඳුන බස්සමින් මෙම මන්ත්‍රය 7 වරක් කියවිය යුතුයි.

"ඕං නමෝ භගවතෙ වාසුදේවාය රථ රථ බන්ධ බන්ධ ශ්‍රී පතේ කුලපතේ වසුමතේ ස්වාහා"~

## 5. පන්දමකින් අඳුන් බැස්සවීම සහ අඳුන ගලක ඇඹරීම

අංජනමට නියමිත ඖෂධ ඉහතින් සඳහන් කළ අයුරු මතුරා අමු ද්‍රව්‍ය නම් වේළා කුඩු කර පළල රෙදි පටියකට දමා

දෙකට නවා පන්දම ලෙස ඔතා නියම කළ තෙල් වර්ගයක් නොමැති නම් දුම්මල තෙලින් හෝ එඬරු තෙලින් පොඟවා ගිනි අවුළවා සුදුසු භාජනයකට අඳුන බස්සවා ගන්න. එය එක් ක්‍රමයක් වේ. දෙවන ක්‍රමය නම් බෙහෙත් කුඩු කර ඒ ඒ අංජනමට නියම මන්ත්‍රය ජප කරමින් ගලේ ලා අඹරන්න. එසේ සාදා ගත් අංජනම හෙප්පුවක ලා (පෙර දවස නම් බෙහෙත් ද්‍රව්‍ය දමන වෛද්‍යවරු පාවිච්චි කළ භාණ්ඩයකි. අද එයට සුදුසු භාණ්ඩයක් සොයා ගත යුතුය.) තබා ගත යුතුයි.

## 6. මල් බුලත් පුටුව සාදා ගැනීම

යකඩ ඇණ නොගැසූ පුටුවක කෙසෙල් කොළයක් එළා මල් බුලත්, නියම පුද පූජා තබා අඳුන තබන්න. පළමුවෙන් ජීව වරමෙන් වරම් ගෙන දෙවනුව ශ්‍රී රාම දිෂ්ටියෙන් සහ හනුමා දිෂ්ටිවලින් ද දිෂ්ටි කර එයට නියම මූල මන්ත්‍රයෙන් 108 වරක් ජප කොට බිසිබිල්ලා මන්ත්‍රයෙන් ද මතුරන තුරු අංජනම් එළි බැලීම සුදුසු නොවේ. මල් බුලත් පුටුව සෑදීමට ප්‍රථම පුටුව කහ දියරෙන් සෝදා ගන්න. පුද පූජා නියම කර නැත්නම් පහත සඳහන් ද්‍රව්‍ය ගත යුතුය.

මල් පස් වර්ගයයි, බුලත් කොළ පහයි, හඳුන්කූරු පහයි, කපුරු කැලි පහයි, කෙසෙල් ගෙඩි පහයි, උක් ගස් කෑල්ලයි, තැඹිලි ගෙඩි එකයි, මැටි පහන් එකයි, පිනි දියර, කට්ටකුමංජල් කැමති නම් කැවුම් ආදී කැවිලි, අඹ ආදී පලතුරු තැබීම ද වරදක් නොවේ. අඳුන ජීවම් කිරීමේ දීත්, බැලීමේ දීත් ඉහත පුද පූජා සුදුසුය.

## 7. පාන් තිර ඇඹරීම

අඹරන පාන් තිරි වෙනුවට තමන් විසින්ම පාන් තිරයක් පහත මන්ත්‍රයෙන් 7 වරක් මතුරමින් අඹරා ගන්න.

"වල වලනේ ස්වාහා"



## 8. පාන් තිරය අතට ගැනීමට

අංජනම් එළිය බැලීමට පාන් තිරය අතට ගත යුත්තේ මෙම මන්ත්‍රය 7 වරක් සිහි කිරීමෙනි.

"ඕං රක්ෂ රක්ෂ විජේස්වාහා"

## 9. පාන් තිරය දැල්වීමට

පහත මන්ත්‍රය 7 වරක් සිහි කර පාන් තිරය දල්වනු.

"ඕං ආතාල බන්ධ පාතාල බන්ධ මා බලා බන්ධ බන්ධ ඒස්වාහා"

## 10. බෙහෙත් හෙප්පුවට මැතිරීම

පහත මන්ත්‍රයෙන් හෙප්පුවට 21 වරක් මතුරනු. (අද පීරිසි තට්ටුවේ යට රවුම)

"ඕං සර්ව සිද්ධි බෝ නමෝ විබෙ ස්වාහා"

## 11. අංජනම් එළිය බැලීම

පෙරදිග ක්‍රමය අනුව එළි බැලීමට සුදුසුම පෙදෙස වන්නේ වයඹ දිශාවය. සුදුසු කාලය රාත්‍රියයි. වර්තමානයේ අංජනම් එළි බැලීමට උදය කාලය යොදා ගෙන ඇත්තේ පහසුව මතය. මල්, පලතුරු, බුලත් ආදී සියලුම පුද පූජා මැදින් පහන තබා ඉන් වැටෙන එළිය අංජනමට වැටෙන පරිදි පීරිසි තට්ටුව යමකට හේත්තු කර සුදුස්සකු ලවා එළිය බැලිය යුතුයි. අංජනමට නෙත සිත යොමු කර අංජනමට නියමිත මූල මන්ත්‍රයෙන් මැතිරිය යුතුය.

## 12. මල් බුලත් පුටුවට දුම් ඇල්ලීම

"ඕං බ්‍රහ්ම විෂ්ණු අංජනම් දේවිවා අනග ප්‍රලීවා හනුමන්තා වා, ලෝක මහා දේවී වා වා"

කට්ටකුමංජල්වලට මෙම මන්ත්‍රයෙන් 21 වරක් මතුරා දුම් අල්ලනු.

## 13. මල් බුලත් පේ කිරීම

"ඕං ජීවප්‍රාණ භූතප්‍රාණ අභූතප්‍රාණ අජ්වො ජීවො ප්‍රාණ ඒස්වාහා"~ මන්ත්‍රයෙන් 7 වරක් මතුරා මල් බුලත් පේ කරනු.

## 14. බලන අයට ආරක්ෂාව

"ඕං ත්‍රිසූලධාරී ආකාශ බන්ධ පාතාල බන්ධ පාතාලේ වාසුකී බන්ධ ඊශ්වර ආසු බන්ධ බන්ධ ඒස්වාහා"~ එළිය බලන අයගේ රෙද්දේ පටක් හෝ කෙස් රොදක් 21 වරක් මතුරා ගැට ගසනු.

## 15. එළිය වැඩි වීමට සහ අඳුර නැති වීමට

"ඕං නමෝ මහමෙර සත්කට්ටුව පළා ගෙන භූත නාග බින්දවාපු සූර්ය දිව්‍ය රාජයා කළුවර බිඳ තුන් ලොව එළිය කළ ආනුභාවයෙන් මහ පොළොව පළා ගෙන නාග ලොව එළිය වෙන්ඩ සූර්ය දිව්‍ය රාජයාගෙන් වරම්"~

මෙම මන්ත්‍රය පාවිච්චි කළ යුත්තේ පාතාල අංජනම සඳහා පමණි. පොළොව මතුපිට පෙන්වන අන්‍ය අංජනම්වලට මතුරන විට ඊටම "නාලොව එළිය වෙන්ඩ" වෙනුවට "තුන්ලොව එළිය වෙන්ඩ" කියා යොදා ගත යුතුය. රාත්‍රියට මතුරන විට 7 වරක් ද දවල්ට මතුරන විට 21 වරක් ද මතුරනු. එළිය විශාල වී අඳුර මැකී යන්න සිතා ගත යුතුයි.

## 16. අඳුන ගෑ පිරිසි තට්ටුව පසා වී පෙනීමට

"ඕං ඉරපලා ඕඩු භූමිපලා ඕඩු මෙරගල් පලා ඕඩු ඕඩු ඒස්වාහා"~ 21 වරක් මතුරා අංජනමට පෙනී සිටීමට දෙව් දේවතාවුන්ට ආරාධනා කරනු.

## 17. හනුමා විශාල වී පෙනීමට

අංජනම් එළියට පෙනී සිටින දෙව් දේවතාවුන් කුඩාවට පෙනෙන කල යමක් තෝරා බේරා ගැනීම අපහසුය. ඒ නිසා ඔවුන්ට මනුෂ්‍ය ප්‍රමාණවලින් පෙනී සිටීමට ආරාධනා කළ යුතුය.



"ඕං සිව කදිර නාරායනේ හනුමා දිෂ්ටි වර වර ඒස්වාහා"~ මෙය 7 වරක් මතුරා කට්ටකුමංජල් දුම් අල්ලනු. හනුමා විශාල වී පෙනෙනු ඇත.

## 18. දෙව් දේවතාවුන් නොසලකනවා නම්

හනුමා හෝ අංජනම් දේවිය හෝ වෙනයම් දෙව් කෙනෙක් තමාගේ ඉල්ලීම නොසලකා හරින විට පහත මන්ත්‍රයෙන් 7 වරක් කට්ටකුමංජල් මතුරා දුම් අල්ලනු.

"ඕං අග්නිප්ප්‍රාණ ජලප්ප්‍රාණ දේවප්ප්‍රාණ දිෂ්ටිප්ප්‍රාණ ඒ ස්වාහා"~

## 19. එළිය අපැහැදිලි නම්

අංජනම් එළි බැලීමේ දී බොහෝ අයට පෙනෙන්නේ තනි එළියකි. එය විශාල වීමට සිතීමට හැකියාව ඇත. ඊට පසු එළිය පසා කරගෙන යන දෙවිවරු පැමිණ වැඩ අවැඩ කියත්. සමහර විට තැනින් තැන එළි කීපයක් පෙනෙනු ඇත. එම එළි එකට එකතු වෙන්ට කියා සිතා ගත යුතුය.

"ඕං නිලමණී නිල බින්දු දිෂ්ටි දිෂ්ටි ඒස්වාහා"~ 21 වරක් මතුරන්න. එළිය එකට එකතු වේ.

## 20. අංජනම් දේවිට එළිය ඇල්ලීමට

අංජනම් දේවිට එළිය ඇල්ලීමටත්, එළිය විශාල කිරීමටත් මෙය 7 වරක් මතුරනු.

"ඕං විෂ්ණුකාලි ශර පත්‍රකාලි අම්මා මා කෙරේ දිෂ්ටි - කල සභා දිෂ්ටි - ඕං නිල පත්‍ර කාලී නීලමේග හනු මේශ්වරී - ගවරි - කවසි හනුමා - රාවණා අවතාර සීඝ්‍ර සීඝ්‍ර නම නම ඒස්වාහා, ඕං ගිනි මංග්‍රකාලීගේ නාසෙන් ගිනි කඳක් ඇරිය ආනුභාවෙන් නාග තල් කඳක් සේ ගිනි කඳ විහිදුවන්ඩ වරම්. ඕං ලක්ෂ්මි අංජන දේවි නඹුවේ තාක්කු තාක්කු නම නම නමඃ"~

නියමිත මන්ත්‍ර ඇති අඳුන්වලට ශ්‍රී රාම දිෂ්ටියෙන් මැතිරිය යුත්තේ නියමිත දිෂ්ටියෙන් මැතිරීමට පෙරය. ඇල්වීමට ගන්නා කපුරු, හඳුන්කුරු තටුව මත තබා දිෂ්ටියෙන් පසු දල්වනු. දින හතක් අඳුන ජීවම් කරතොත් එසේ දිනපතා කළ යුතුයි.

අඳුනක් තුන්යාමයක් මතුරන විට යාම තුනේම දිෂ්ටි මන්ත්‍රවලින් මැතිරිය යුතුයි. පටන් ගැනීමේ දී පමණක් දිෂ්ටි කරනු.

## 21. හනුමන්තා ද අංජනම් දේවිය ද දෙවිවරුන් ද ගෙන්වීම

අංජනම් බැලීමට බොහෝ දෙනා හනුමන්තා සහ අංජනම් දේවි පමණක් ගෙන්වා අංජනම්වලින් වැඩ ගනිති. විෂ්ණු ගෙන්වීමෙන් ද හනුමාගෙන් වැඩ ගැනීමට පහසුය. සතුරු කරදර පිළිබඳව එළිය බැලීමේ දී කාලි අම්මා ද ගෙන්වා ගැනීම ප්‍රයෝජනවත් වේ. සූනියම් දේවතාවා පමණක් ගෙන්වීමෙන් ද අංජනම් බැලිය හැකිය. මේ නිසා කැමති දෙවිවරුන් ගෙන්වා ගැනීමට මන්ත්‍ර පහත සඳහන් වේ. මේ මන්ත්‍ර සියලුම අංජනම්වලට සාධාරණ නිසා අවස්ථාවේ හැටියට ප්‍රයෝජනයට ගැනීම ඔබ සතුය.

### 1. විෂ්ණු ගෙන්වීමට මන්ත්‍රය

"ඕං ජල ජල විෂ්ණු රාජයා වාරුං වාරුං ත්‍රිලෝකයාධිපති රාජයා වාරුං වාරුං වර වර ඒස්වාහා ඕං ජල පූර්වනාහධාරි වාරුං වාරුං වාරුං වර වර ඒස්වාහා ඕං ජල ජල විෂ්ණු රාජයා වාරු වාරුං තිභුවන රාජයා වාරුං ත්‍රිලෝක රාජයා වාරුං වාරුං වාරේ ස්වාහා"෴ 21 වරක් මතුරනු.

### 2. අංජනම් දේවී ගෙන්වීමට මන්ත්‍රය

"ඕං සඩකාලී මහාකාලී දේවී ආසෝර අංජනදේවී ඕඩාම් ඕඩේ ස්වාහා"෴ 21 වරක් මතුරනු.

### 3. ඊටම තවත් මන්ත්‍රයක්

"ඕං නමෝ ඕං කාලි අංජනකාලි ඕඩිවා ඊශ්වර කාලී



ජේසුම් ඕඩිවා ඕඩිවා ඕං හ්‍රීං ජේසි ජේසි ගිඩි ගිඩි ඕඩිවා එන්තඹිරානේ ඕඩිවා නමෝකාලි අංජන දේවි වා වා සෝර හද්‍රකිං කට්ටු තෙන්ත්‍රි ජේසු ජේසු පිසාෂි සායුං අංජනදේවි වා වා ඕඩිවා ඕං රාං රාං හ්‍රීං හ්‍රීං විසි විසි ඕඩිවා එන් තඹිරානේ ඕඩිවා"෴ 21 වරක් මතුරනු.

### 4. ඊටම තවත් මන්ත්‍රයක්

"ඕං බ්‍රහ්ම විෂ්ණු අංජනදේවි වා හනුමන්තා දේවි වා ලෝක මහා දේවි වා වා" ෴ 21 වරක් මතුරනු.

අංජනමට මැතිරීමට නියමිත මන්ත්‍රයට අංජනම් දේවි නොපැමිණි කල ද මින් එක මන්ත්‍රයකින් 21 වරක් මතුරනු. අංජනම් දේවි එළියට පැමිණේ.

### 5. හනුමන්තා ගෙන්වන මන්ත්‍රයක්

"ඕං නමෝ හනුමන්තා වාපෙපවා - කිඩ හනුමා වා පෙපවා - භූත හනුමා වාපෙපවා - ඉන්ද්‍රකාර හනුමා වාපෙප වා - චන්ද්‍ර හනුමා වාපෙපවා - අඩ හනුමා වාපෙපවා - කඩ හනුමා වාපෙපවා - කෛරාඩි ඕඩිවා හනුමා සිව සිවායනේ දිෂ්ටි දිෂ්ටි වර වර සිවේ සිවේඩා"෴ හනුමා ගෙන්වීමට 21 වරක් මතුරනු.

### 6. ඊටම තවත් මන්ත්‍රයක්

"ඕං ත්‍රිපච්චි වා වා - ත්‍රිකාල් හනුමා වා වා ඕං ත්‍රිංපෙයාල් හනුමා වා වා – ඕං ත්‍රි කට්ටු ආකාශ හනුමා වා වා - ඕං හ්‍රීං ආකාශ දේව හනුමා වා වා - ඕං හ්‍රීං විසි විසි හනුමා වා වා - ඕං හ්‍රීං හ්‍රීං විසි ඉගිල ඉගිල ඕඩි ඕඩි එන් තඹිරානේ ඕඩිවා - ඕං ඕං රාං රාං රීං රීං හ්‍රීං හ්‍රීං ඕඩිවා"෴

21 වරක් මැතිරීමෙන් හනුමා පැමිණේ. අංජනම් දේවි සහ හනුමන්තා ගෙන්වන මන්ත්‍ර හැකිතාක් පාඩම් කර ගන්න. ඒ දෙදෙනාම අංජනමට මූලිකයෝය.

### 7. ඊටම තවත් මන්ත්‍රයක්

"ඕං නමෝ හනුමන්තා දිෂ්ටි දිෂ්ටි ඒස්වාහා" හනුමන්තා පමණක් ගෙන්වීමට 21 වරක් මතුරනු.

8. වෙන කැමති දෙවියකු ගෙන්වීමට අවශ්‍ය නම් මෙම මන්ත්‍රය සුළු වෙනසක් කර 21 වරක් මතුරනු.

"ඕං නමෝ................දිෂ්ටි දිෂ්ටි ඒස්වාහා"~ ක්‍රිස්තු භක්තිකයකු අංජනම් කිමේ දීත්, එවැන්නෙක් අංජනම් ඇසීමේ දීත් "ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා" එම මන්ත්‍රයෙන් ගෙන්වා ගන්න.

9. කාලි ගෙන්වන මන්ත්‍රය

"ඕං ත්‍රි තාජාතා බූලාවා කාලි යන්ත්‍ර කාලී මන්ත්‍ර කාලි ජොතිරංග කාලී නිල පුලි හරිනා ඕං ඕං තාකාලි පෙසරාහු පෙරුං මදරා හ්‍රීං කෙන්ද්‍රකාලි නිසරාහු නිසකාලි කාලි දිෂ්ටි දිෂ්ටි වා වා"~

කාලි අම්මා ගෙන්වීමට 21 වරක් මතුරන්න. කාලි ගෙන්විය යුත්තේ සතුරු කරදර සතුරු උවදුරු ගැන බලන විට පමණි.

10. සූනියන් දේවතාවුන් ගෙන්වීමට

"කුරු කුරුප්පන් කන්නෝම් කොන්නාඩි කලයුම් කන්ටියුම් කච්චිල සර කෝමල මුට්ටියේල් යේරුක මලයාල් කොංචි කොංචි හෝල් කොන්නාඩි වාවා කලු කොන්නාඩි වා වා උරුවිරේ වා වා කොන්ත්‍රි තෙරංවාල්කරි මුරි තායුම් පුප්‍රේන් පුප්‍රේන් ඔරුවාල් තෙරුවන්ති වා වා තුබ්බෙපට්ට කෝල් වරතේර පෙරකෝල් කර කරනේ වා වා අරච්චිල පුච්චායුම් ලල් ලාලා ලිල් ලිලී ජේයා ජේසුල් හුම්දී හර ධරණී පුරපාසනීවර තොසිවීර කෙරන් සරස්වති අම්මේ දිෂ්ටි ප්‍රධාරනේ වාවාත් සර සපුර දිෂ්ටි දිෂ්ටි නමඃ"~

ප්‍රථමයෙන් 7 වරක් මතුරා සූනියම් දෙවියන් නොපැමිණේ නම් 21 වරක් මතුරනු. සූනියන් දෙවියන් එළියට එයි. අනවින කොඩිවින පිළිබඳවත්, යමක ජය පරාජය පිළිබඳවත් දැනගන්නට උවමනා වූ විට පමණක් සූනියන් දේවතාවා ගෙන්විය යුතුය. ගෙන්වූ විට බොහෝ අයට සිහි නැතිව යන බැවින් කලින් ආරක්ෂා කරන ලද වතුර වීදුරුවක් සූදානම් කර තබා ගැනීම යහපත්ය.



11. සිහිමූර්ජාවල දී මැහිරීමට ආරක්ෂක මන්ත්‍රයක්

"ඕං හ්‍රීං ඕං භගවතී ඕ පූන්ඩරි කක්ෂා ඕං ස්වස්ති සිද්ධම් ර ර ර ර ඒස්වාහා. ඕං හ්‍රීං මිනිලකාලවසන්තුප්පාන් තෝස්වාහා ඕං හ්‍රීං ඉන්ද්‍ර කුලන්ද්‍ර හැර පලයන් තෝස්වහා"~

මූර්ජාවට 21 වරක් වතුර මතුරා මූණට ඉසිනු.

12. තවත් ආරක්ෂා මන්ත්‍රයක්

"ඕං ශ්‍රී විෂ්ණු ප්‍රලාඩී තුලා පෝරුකි හත්ති සංක්‍රෙස් බහුලාඩී විෂ්ණු දේස් දේස් ඕං ආදේස් කිමාරේ උර්ලාඩී දේහෝ ආක්‍රොන්තු ගා හේස් ශ්‍රී විෂ්ණු නාරායනේ දේස් දේස්"~ මෙය විශේෂ දිෂ්ටි ඉගිල්ලීමකි. තෙල් මතුරා ගානු. වතුර මතුරා ඉසිනු. 21 වරයි.

13. හනුමාට පුද දීම

"ඕං ත්‍රිවාරුම් රූපි තබුදා ඌම් හිරහින් නිලවාරුං වර වර තෝස්වාහා. ඕං පළමු බද්‍රකාම දිෂ්ටි ඉගිල වර වර ඒස්වාහා ඕං රූස් ගුරු ධාරණී එර්දි දිෂ්ටිලා වර වර ඒස්වාහා ඕං බ්‍රහ්ම ධාරණී නීලංකවෙ යක්ෂයෝ දස දහසක් සක්වළින් යක්ෂයින් පිරිවරා වරේන්ද්‍ර වර වර ඒස්වාහා ඕං කෙවීර හනුමා වෙයිරඩ්ඩු මක්කයිරේ පොයිලේ වෙත්තිලේ සුංනාම්බුං පනියාරුං වාලප්පලං තෙක්කා අවුරාල් අවුරාල් කෙවිරාල් ත්‍රිනාල් ආරාම් තින්නවා තින්නවා තින්නු තින්නු"~

හනුමා උදාසීනව වැඩ කරන විට බුලත්, පුවක්, හුනු, කෙසෙල් ගෙඩි ආදි පුද තබා මේ මන්ත්‍රයෙන් කැප කරනු. හනුමා සතුටු වේ.

## 22. එළිය වුවමනා තැනට යැවීම

අංජනම් එළි වුවමනා තැනට යැවීමට අවශ්‍ය වුව ද සමහරවිට අංජනම් දෙවිවරු පැමිණෙන නමුත් වුවමනා තැනකට යන්නට කියූ විට නොසෙල්වී සිටිති. හනුමන්තා, අංජනම් දේවී නොයන කල එළිය ද නොසෙල්වේ. එබඳු දුෂ්කර අවස්ථාවල දී ප්‍රයෝජන ගැනීමට එළිය පිටත් කරන මන්ත්‍ර

කිපයක් පහත සඳහන්ව ඇත.

**1. එළිය යැවීමට**

"ඕංහරා හෝධ්‍යාඩ උරිච් පාවා බලා හනුමන්තා දිෂ්ටි ස්වාහා"෴ මෙය එළිය යැවීමටයි. දේවතාවාට එළිය රැගෙන යන්නට 7 වරක් කියනු.

**2. තවත් මන්ත්‍රයක්**

"ඕං නමඃ ඕං හ්‍රීං නමඃ ස්වාය නමඃ"෴ 7 වරක් මතුරා හනුමන්තාට අංජනම් දේවිත් සමග යන්ට සිතනු. නික්ම යනු ඇත.

**3. තවත් මන්ත්‍රයක්**

"ඕං ත්‍රි ත්‍රික්කුංච සඩයුං කොරත්ගුරු පමං අංජනදේවි පුත් තිර හනුමන්තා රූප උච්චාඩු උච්චාඩු"෴ 7 වරක් දුම්මල මතුරා අඳුනට මල් බුලත් පුටුවට දුම් දෙනු. හනුමා කියන ස්ථානයකට යයි. වුවමනා විස්තර දැනගත් පසුව දෙවිවරුන්ට එළියත් රැගෙන අංජනම බලන තැනට එන්න සිතනු.

**4. එළිය බලන විට යකුන් දුරු කිරීම**

"ඕං ජනක හගවා හරිහරං හල්ලාබි සුල්ලා පිහික භාරේ දූරේ ස්වාහා"෴

යක්ෂ දිෂ්ටි, හොල්මන් ඇති ස්ථානවල එළිය බැලීමේ දී මෙය 21 වරක් මතුරනු. යක්ෂ ප්‍රේත දිෂ්ටි දුරු වේ. මග දී යකුන් දැක හනුමන්තා ප්‍රමාද වන කල ද මිත් දුම් දිය යුතුයි.

**5. හනුමා ලවා යකුන් ඇල්ලීම**

"ඕං මූතිතා නාරායනා පාච නාරායනා යාපා සුප්පතේරියේන් වෙන්ඩක්කි කුඩිච්ච කුඩිම්මාම් පචණ්ඩ කාලියුම් සාඩා වා වා සාඩා හනුමන්තා වා වා තාක්කු තාක්කු මුක්කු මුක්කු පූඩී තාටඩේරු තට්ටු එලුක්කේම් කොන්ඩෝඩීවා අඩු අඩු පේසු පේසු වාලප්පලං පතියාරුං වෙත්තිලේ පෝයිලේ සුන්නාඹු මඩාල් පන්කේම් වෝරුවේන් විත්තේන් තින්නා තරුවේන් වා වා කින්නා කට්ටු පූට්ටු පූඩි හනුමා පූඩි"෴



බත්, කෙසෙල් ගෙඩි, බුලත් පුවක්, හුනු තබා හනුමාට යකුන් අල්ලන්නට කියනු. අල්ලයි. ඊට පසු තළා පිට කරන්නට කියනු. පිට කරයි. ඒ අතරතුර ගේ දොර සහ ආතුරයින් ආරක්ෂා කර ගත යුතුයි. නැතහොත් නැවතත් පැමිණෙන්නට පුළුවන. 7 වරක් මතුරනු.

**6. සැඟවුණු යකුන් ගෙන්වීම**

"ඕං හරා දහරා දේවතාවේ නිඤාන වර වර ඒස්වාහා"෴ හනුමාට සැඟවුණු යකුන් සොයන්නට කියා 7 වරක් මතුරනු.

**7. යකුන්ට දඬුවම් දීම**

"ඕං ජාකා බීනා භ්‍රාං තට්ටු හ්‍රීං ඕඩුකෙට්ටු දහඃ" 7 වරක් මතුරා හනුමා ලවා යකුන්ට පහර දෙන් කියනු.

"ඕං ජංකං බීනා හීරාංහී ඕඩු සෙට්ටු කාලියුං කොල රාත්‍රියුම් නීලයුම් නීලකඩියුම් අයුත්තුක්කුං ඔට්ටු"෴ හනුමා යකාට තළයි. 7 වරක් මතුරනු.

**8. යකුන් විසින් අඳුරු කළ එළියට**

"ඕං නමෝ ප්‍රාණ පිහිටි අස්මූණක් ඇති දේවතාවාගේ ආනුභාවයෙන් ආඥාවෙන් ප්‍රාණ ප්‍රාණ දිෂ්ටි දිෂ්ටි ඒස්වාහා"෴ 7 වරක් මතුරනු.

**9. සතුරන් විසින් හිර කළ එළියට**

"ඕං ටං වං ශිං ශ්‍රී වීරබද්‍ර දේවි අම්මා ඕඩිවාරුම් ඕං නමෝ මා ශරී නීලකමේ හරවසංතර කපා සුං සුං තේස්වාහා"෴

මෙම මන්ත්‍රයෙන් දෙහි ගෙඩි 3 කට 21 වරක් මතුරා එළිය දෙසට අල්ලා කපනු. සමහරවිට සතුරන් විසින් එළිය හිර කළ නිසා දේව දිෂ්ටි නොපැමිණේ. සතුරා විසින් කළ හිරය අස් කර ගැනීමට ඉහත සඳහන් මන්ත්‍රයෙන් දෙහි කපනු.

**10. තවත් මන්ත්‍රයක්**

"ඕං හරිහර බ්‍රහ්ම විෂ්ණු ඊශ්වර කන්ද කුමාර සර්ව සූතියන් කිඩ කිඩ වෙට්ටු වෙට්ටු කපාල කපාල තින්දු තින්දු ඒස්වාහා"෴

දෙහි ගෙඩි 3 කට 21 වරක් මතුරා කපනු. හිර ඇරේ. දෙහි කැපුවාට පසු පහත සඳහන් මන්ත්‍රයෙන් 7 වරක් මතුරා දුම්මල දුම් අල්ලනු.

"ඕං ආඩි වා වා වෙබුරග මාලේවා."~ දිෂ්ටි පෙර සේම පෙනේ.

11. *අංජනම් ආරක්ෂාවක්*

"ඕං ජය හනුමන්තා හා කන්තා හා ඕරෝ ගිරේ ඔග්ගිරේ කර්දේ කොද්දේ කොරා හාරේ වීරා හාරේ හනුමන්තා දක දක පුනකු පුනකු රං රං භාග්‍ය කෙල්ලා මෙල්ලාටේ ජය ප්‍රෝදේ කෙරේ මහා සාබා දරන ඕම් දරන ඕන් තිරදෝ හෝ තිර හෝ උප්‍රහො උප්‍ර හෝ සර හනුමන්තා ඊශ්වර වා වා"~ 21 වරක් මතුරනු.

12. *එළිය නිවීම*

එළිය බලා අවසානයේ දෙවියන්ට පින් දී ගෞරව ස්තුති පූර්වකව යන්ට ආරාධනා කරනු. ඊට පසු මේ මන්ත්‍රය කියා පාන නිවනු.

"ඕං සුරාසුර ගරුඩා විදන් තරාදි සත් ඒස්වාහා"~ එක්වරයි.

13. *යක්ෂ - ප්‍රේත අංජනම් බලා අවසානයේ දිෂ්ටි පලවා හැරීම*

මෙරටේ බොහෝ අය යක්ෂ ප්‍රේත අංජනම් දිෂ්ටි තොට යකුන් ප්‍රේතයින් ගෙන්වා අංජනම බැලූ නිවසේම නතර කර යන අවස්ථා ඇත. මෙය කාලයත් සමග අපරාධයක් වන හෙයින් එම අංජනම් පහත මන්ත්‍රයෙන් අවසාන කළ යුතුය.

"ඕං අරි අරි ශුක්‍රාං ගුරු ගුරු ශක්ක්‍රාං ශ්‍රී විෂ්ණු නාරායනේ ගිනි කුලම්බු දිෂ්ටි සුං."~21 වරක් මතුරා පානටත්, ගෙටත් දුම් අල්ලනු. දුම් ඇල්ලීමට පෙර අංජනම ඉවත් කළ යුතුය. (අංජනම් පීරිසිය හෝ හෙප්පුව)

## 23. සියලු අංජනම් ක්‍රියා ආරම්භයට මතුරන ජීවම

"ඕං ගුරුවරං ගුරු පත්‍රකාලී වරං - සුර වරං සුර පත්‍රකාලී



වරං - අසුර වරං අසුර පත්‍රකාලී වරං - දේව වරං දේව පත්‍රකාලී වරං - නාග වරං නාග පත්‍රකාලී වරං - කයිලාසන වරං - කයිලාසන ගුරුධාරනේ වරං - යන්ත්‍ර වරං - යන්ත්‍රමන්ත්‍ර වරං - මන්ත්‍ර තන්ත්‍ර වරං - ශ්‍රී විෂ්ණු වරං - ශ්‍රී විෂ්ණු නාරායනේ වරං - ආකාශවරං - ආකාශ සූර්යානේ වරං - චන්ද්‍ර වරං - චන්ද්‍රපත්ම කයිලාසනේ වරං - භූමවරං - භූමජල මහීකාන්තා දේව ගුරු ඈපනේ වරං - ඊශ්වර වරං - ඊශ්වර මහේශ්වර වරං - ක්‍රතේස්වර නාථෙස්වර වරං - ශ්‍රී විෂ්ණු වරං - ශ්‍රී විෂ්ණු කන්දකුමාර වරං - සත් පත්තිනි වරං - සත් පත්තිනි ගිනි දෙවොල් වරං - වෙසමුනි වරං - වෙසමුනි ඇඩිමුණ්ඩ වරං - නවග්‍රහ වරං - නවග්‍රහ නවදෙනා වරං - හනුමා වරං - හනුමා පත්‍රකාලී වරං - සරස්වතී වරං - සරස්වතී මෝහිනී වරං - බහිරවී වරං - බහිරවී ශ්‍රියාදේවී වරං - ඔඩ්ඩියා වරං - ඔඩ්ඩියා ඉරලා වරං - යක්ෂයා වරං - යක්ෂණී වරං - හිමාල වරං - හිමාල ජලවරං - පර්වත වරං - පර්වත වෘක්ෂ වරං සර්වාංග වරං - සර්වාංග ප්‍රානා වරං - ඉරු රැස් වරං - සඳ රැස් වරං - බුදු රැස් වරං - බුද්ධ රශ්මීන් ආලෝක ජීවප්‍රාණ සර්වලෝක දේවාරාධනා නමස්කාර වර වර නමාමි නමඃ"~ එක්වරයි. මෙය කියා දුම් අල්ලනු.

*අඳුන් පිඹුම් කරන ශ්‍රී රාම දිෂ්ටිය*

"ඕං ශ්‍රීරාම් ඊශ්වර බ්‍රහ්ම සුරේන්ද්‍ර ශක්‍ර දිෂ්ටි වා වා නවනාථ නව ග්‍රහ දිෂ්ටි වා වා - ශ්‍රී විෂ්ණු අයියනාරාමේ දිෂ්ටි වා වා- කන්දස් ස්වාමි මුලු දෙවොල් ගිනි පත්තිනි ඇඩිමුණ්ඩරාමේ දිෂ්ටි වා වා - දේව රජ්ජුරු හනුමා භද්‍රකාලී මංගර දිෂ්ටි වා වා - සමන් බහිරව ඔඩ්ඩියාරේ ගොපලු කඩවර දිෂ්ටි වා වා - මලලවර මුණ්ඩ ශෑඩකම්බිලි උඩයක් ඉරලා මෝහනි දිෂ්ටි වා වා - ආසෝර - මදුර මාල සීලම්බරි ඉරසඳ භූමදේවි දිෂ්ටි වා වා - කල්ලම්බේරි සරස්වතී ජලමේසකාලි ශ්‍රියා දේවි අංජන කුමාරි දිෂ්ටි වා වා - වවු කපිල්ලී සූනියන් යක්ෂයො දිෂ්ටි වා වා - දෙමළ භාෂා සෑම යක්ෂ යක්ෂණියෝ ආරූඪ දිෂ්ටි වා වා අහස පොළොව මුළු සක්වළ හිමාල පර්වත ගස් ගල් වෙව්ලුවා වර වර යන්ත්‍ර මන්ත්‍ර තෙල් බෙහෙත්, අඳුන් හඳුන් ජීවත් දිෂ්ටි ලා වර වර - ආවේශ වර වර - නැගී වර වර - විගස වර වර -

සැණෙන් වර වර - මා කෙරෙහි දිෂ්ටි වර වර - දිෂ්ටි වර වර නමඃ - ඕ කාලි දිෂ්ටි ගං භද්‍ර කාලි දිෂ්ටි ගං - බහිරවකාලි දිෂ්ටි ගං - ආනන්ද බහිරව කාලි දිෂ්ටි ගං - මෙ කියන දේවතාවියෝ සතර දෙනා දිෂ්ටි ගං - තොස්වාහා"෴

"ඕංකාලි මහාකාලි - පර්වතකාලි - අංජනකාලි - ඊශ්වර කාලි - ඒ සියයක් බලා - ඒ සියයක් ප්‍රාණ බලා - අජීව ප්‍රාණ - ජීව ප්‍රාණ - ජීව ජීව ප්‍රාණ - තෝස්වාහා - ඕං හතේ වා වා - දේවරාජා වා වා - අයසට නාස දේවි වා වා - විෂ්ණු දේවො වා වා - කතරගම දේවො වා වා - පත්තිනි දේවො වා වා - කාලිදේවි වා වා ගිනි කුරුම්බු දේවතාවා දැපනේ ගිනි දේවතාවියන් සැණෙන් දිෂ්ටි ලා වර වර තෝස්වාහා"෴

නියමිත මන්ත්‍රයක් නැති අංජනම්වලට මෙයින් 108 වරක් ද නියමිත මන්ත්‍ර ජීවම ඇති අවශේෂ අඳුන්වලට 21 වරක් ද මතුරනු. යන්ත්‍ර මන්ත්‍ර තෙල් බෙහෙත්වලට මැතිරීමට මෙය සුබය.

## 24. කපුරු අඳුන සකස් කර ගන්නා අයුරු

"අරාබි අංජනම් ක්‍රමයට අයත් මහා බිසිබිල්ලා මන්ත්‍රය"

මුස්ලිම්වරු අතර ඉතාම ජනප්‍රිය කපුරු අඳුන සහ මෙම මන්ත්‍රය මගින් ඕනෑම පරණ අංජනමක් අලුත් කිරීමට, අංජනම් ආලෝකය වැඩි කර ගැනීමට, ඕනෑම දෙවි කෙනෙක් ගෙන්වා ගැනීමට, කිලි අසු වී යල් පැන ගිය අඳුන් අලුත් කිරීමට, බලවත් ආරක්ෂා කිරීම්වලට ඉතාම ප්‍රබල බිසිබිල්ලා මන්ත්‍රය සිංහල අඳුන් බලන අය අතර ඉතාම ජනප්‍රිය සුබවාදී මන්ත්‍රයක් බව පැහැදිලි කර ඇත.

"බිසිබිල්ලා හර හී මාං - නරෙහි අල්ලාහුම් ඉන්ති - අසු අහු - කයාලලා හුයා ලලා - හුයාලලා - හුයාලලා - හුයාරජා මාං සාරහි - මාං යාරහිං - සෙයිං යාහි යාහිං - යාරබ්බාහුයා - රබ්බාහුයා - සකින්දාහුයා - සකින්දාහුයා හුයා හුයා කියාකි එෙයි. දෙන්ඩයානි - එෙයින්ද - වලින් ද නියල්ලා - හුයල්ලා - හු අල්ලා - හු හිලාත ඉල්ලා - අහු අල් - හෙයුලා - කයියුයුයා



- හයිහුයා - කෙයුං යාමං - තකුමුස්ස - මා වාත්තුවෝ - අරලු බියම්ති හියා මාජම් උල් - මකුළු කාතිතෙ - හිනක හුරි - හිමන්ත කුමුස්ස - මාවාන්තුවෝල් - අරළු බියම බිරිනිහි - අසු අලුක අන්තුසකරලි - මනිරුහානි - යතිකමං - මයිය කතුමුලිනි - වයකුනුලී - එෙයිනන් - ඇලා කලායි - හාජනි - යාමල්ලා - නෞහු - දූහු - සිතුංඩලා - නහුං - ඉහිදි ඉලා - තරිකල් කෞම් හැස්තා අස්ටීරි හම්නත් - නෞම් ඉලා - හිලා - කඉල්ලා අන්ද සුහාහා - නක ඉන්තී - කුන්තු විනලාලි - මියා - මලල හුඹා - පිස්ස මාවාති - මාපිල් අරදි මන්දල් - අන්ද ඉසිපහු - ඉන්දහු - ඉල්ලා - බිඳ නහී - අල්ලාහි මජපුපයිල් - පිමාපි - උරුදූම් - තාමාම් - අම්රි වෙයි නිමාම් කම්බිලි වෙයි මානි අමලි - ඹබාදි කිලිපි - අකලි යාමං යෙලම්මා - බයින එදිහිත් - උමා කල්පහුං - උලායු හෙතුන බිසයින් - මිං ඉල් - මිහියා - මං යෙලබුමා - පිලම්රි අබ්ධි - හිසරං - මජහුරං - අසු අලුක අන්දූ - සකරලි හුද්දා - මහදි හිල් - අයිත - ශරිපති - ඩයිද්දතිල් - වධිල් මුනිපත්තියේ - බුරුසුනලි - ඓනන් - අලාමා - උරිදූ මිංගලායි - හාජනී - හයාලාහයලා - හවලා - හවලා - වලක්කා - මලක්කා - ඉල්ලා බිමා සාහා - වසියකුරු - සිවුස්සමාවාති වොල් - අරලයා - මන්ව සිවකුරු සීහුස්ස මාවාති - හැත්තැයු හානි මිනි මයිත්තිමමල් - මාදූරිම් -හෙරිරින් මාමලි වදකලයි - හජනිය මල්ලා - යසුදූහු - හැබල හුමාඩ හුවල් - අලියුල් - ඇලයියා - බා ඉසු යස හී දූය - හික්කයා - වකිමයා - කෙයියු යාම තීනු කුලලි - අහුනත් ඇලාමා -උරිදූමිංශලා - හාජනි ඇල්පී - ඇල්පිල්ලා - හහුලවොලා - කුත ඉල්ලා - බිල්ලා - හිල් ඇලියුල් - ඇලි නවක්කල් - යාමල කකණ්ඩියාස් - බිහිම්රි කහාදිලා ඕමා අම්රු සායති ඉල්ලා - කලාහෙල් බසිරි - අහපුව - අකණ්ඩ ඉනාල්ලා - හඅලා කුලලි - සෙයි - කදිකේප්"෴

## 25. අඳුන සාදා ගැනීම

පිරිසිදු හෙප්පුවක් (වර්තමානයේ පීරිසි තට්ටුවේ යටි පැත්ත) අඩියේ එඬරු තෙල් ටිකක් ආලේප කර, කපුරු කැලි කිපයක් දල්වා ඉන් නැගෙන දුමට. එරඬු තෙල් ගෑ පැත්ත

අල්ලන්න. එසේ ඇල්ලූ විට අඳුනක් බසී. එම අඳුන මල් බුලත් තටුව මත තබා කට්ටකුමංජල් දුම් අල්ලමින් ඉහත මන්ත්‍රයෙන් 108 වරක් මතුරා ආරක්ෂිතව තබාගනු. අවශ්‍ය වූ විට මල් බුලත් තටුව මත අඳුන තබා 21 වරක් මතුරා කැමති දෙවිවරුන්ට ආරාධනා කරන්න. අංජනම් එළිය පෙනේ.

කිලි කුණු පවිත්‍ර වීමට 7 වරක් මතුරනු. පරණ අංජනම් ප්‍රකෘතිමත් කිරීමට 21 වරක් මතුරනු. ආලෝකය විශාල වීමටත්, අඳුර නැති වී එළිය පැහැදිලි වී ආලෝක වීමටත් 3 වරක් මතුරනු. ඕනෑම දිව්‍ය අංජනමකට, දේවතා අංජනමකට, පාතාල අංජනමකට මෙම මන්ත්‍රයෙන් මතුරනු.

## 26. පහන් දැල්ලෙන් බලන අංජනම් එළිය

හනුමාගේ දිෂ්ටි මන්ත්‍ර :

1. "ඕං කෙයිමෙත්ත උල්ලුම් හනුමා දේව දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
2. "ඕං සිව කදිරනාරායනේ හනුමා දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
3. "ඕං සැරවීර පත්‍රකාලී වර වර ඒස්වාහාඃ"
4. "ඕං ශ්‍රී ලංකාදේවි දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
5. "ඕං අසුර හනුමා ගිනි දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
6. "ඕං ගුරුරාම හනුමා සර්ව ගිනි දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
7. "ඕං සැරගිනි නාරායනේ දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
8. "ඕං සැර කයියේරු ගිනි සැර දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
9. "ඕං විභීෂණ ගිනි ගිනි ධාරණ දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
10. "ඕං කදිරනාරායනේ භගතා භගවේරි දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
11. "ඕං වයිරගිනි නාරායන ගිනි සැර දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
12. "ඕං නාග දිෂ්ටි නාරායනේ වා හනුමා පත්‍රකාලි වර වර ඒස්වාහාඃ"
13. "යෝම පේසලාඩි දිෂ්ටි වර වර ඒස්වාහාඃ"



14. "හනුමා ගිනි දිෂ්ටි වර වර ඒස්වාහාඃ"
15. "ඕං සිද්ධ හනුමා පාතාල දිෂ්ටි පල පල ඒස්වාහාඃ"

මල් බුලත් තටුව මත පලතුරු, කැවිලි පුදා පහනක් දල්වා තබා කට්ටකුමංජල් දුම් අල්ලමින් 108 වරක් මතුරනු.

ඊට පසු එළිය පෙනෙන කෙනකුට පහන් දැල්ල දෙස බලා සිටීමට කියනු. එළිය විශාල වීමට සිතූ විට විශාල වේ. "මට හනුමේශ්වරයෝ පෙනෙත්වා" යයි සිතූ විට එළිය දෙපළු කරගෙන හනුමා පැමිණේ. අවශ්‍ය නම් අංජනම් දේවි ද තමන් කැමති නම් දෙවි කෙනකුන් ද හනුමන්තා ලවා ගෙන්වා ගත හැකිය. එළිය යම් තැනකට යැවීමට අවශ්‍ය නම් එළිය යවන මන්ත්‍රයකින් මැතුරූ කල හනුමා එළිය රැගෙන නික්මේ. සියලු අංජනම්වලට සාධාරණ එළිය අරින ක්‍රම ප්‍රථමයෙන් සඳහන් කර ඇත.

මෙය සියලුම අංජනම්වලට හනුමාගේ බල පිහිටුවන සාධාරණ දිෂ්ටි මන්ත්‍රයක් වශයෙන් ද භාවිත කරන්න. වෙනත් අංජනම් සඳහා 21 වරක් දිෂ්ටි කරනු.

## 27. වතුර සෙම්බුවෙන් සහ විදුරුවෙන් අංජනම් බැලීම

හනුමා දිෂ්ටි මන්ත්‍රය

"ඕං හරි ඕං ශිව ශිව අනුමානුකේ පූට්ටු සිවසංගු සැක්‍රං මා මුනි පෝංට කදිර මා මුනි අයිරං අංඩා දේවි පෙච්චි නාග දේවි තායි අංජනදේවි තංගප්පන් සර්ව සැක්කි එන් සැක්තියතෙයි කප්පාදේ අප්පා හනුමා වා වා අන්ද්‍ර විෂ්ණුම් වා වා තුදේ වා වා අග්නි තුමා රාජා වා වා අප්පු අප්පු විසි විසි මරුත්තුවා ආකාස මලෙයි ආවේස ආවේස අයියුං කිලියුං සව්වුං කිලියුම් ආවේස ආවේස ස්වාහා. ඕං අංකාර හනුමන්තා ඕඩි වා වා ඉංකාර හනුමන්තා ඕඩි වා වා - උංකාර හනුමන්තා ඕඩි වා වා - එංකොර හනුමන්තා ඕඩි වා වා - ඕංකාර හනුමන්තා ඕඩි වා වා - අංජන දේවි පුත්‍රා හරිරාම තුද්‍රා ආකෝර වීරා අං ඉං හනුමන්තා රාජා වරග වරග ස්වාහා - වයනමසි සිවයනම

- නවසිවය - අං අං ශිව ශිව වශීකරි හනුමා ආකර්ෂය ආකර්ෂය සීඝ්‍ර වේච වරග වරග ස්වාහා - ඕං වෙට්ටුං - පොඩිවෙට්ටුං - ඤාගල් පරිඤාගල් වෙන් ශිව ශිව ශිවායනේ මූර්තු කායෙල් කාලම වින පේසුං ඕඩි ඕඩි හනුමන්තා මහේශ්වරානුභාවෙන් ඕඩිවා ඕඩිවා ඉමං මමංජනාටෙ සිද්ධිං කුරු කුරු ස්වාහාඃ"

මෙයින් 108 වරක් මතුරා තබා ගනු. අංජනම් එළි පැහැදිලි වෙයි. තව ද වතුර වීදුරුවකට පිච්ච මලක් දමා මින් 108 වරක් මතුරා පහනක් ඉදිරියේ තබා අංජනම බලනු. පෙනේ. සෙම්බුවටත් එසේයි. දවල් කාලයේ සෙම්බුව හෝ වතුර වීදුරුව ඉරට අල්ලා ඉන් වැටෙන එළියෙන් අංජනම කිව හැකිය.

## 28. හනුමා පුද සහිත කපුරු අඳුන

හනුමා දිෂ්ටි මන්ත්‍ර

"ඕං හ්‍රීං කාය මේ කෝයිලාගුම් - කඩිය තෝරේ ලිඟමාගුම් - වාද මේනිබතුබම් - චන්ද්‍රනිරාසෙස - කෝල්වීර ඊසනාර් - ආ සෙනා ඊ සනාර් - කුවම් තේත්තු වාමේ මුත්සෝල් - පගරත් දනුලායි මුරුක්ක්‍ය කෙගල් රෙදුම් - කොරොංජිය පාද නාලුං - කුවලත් තොර්මඩත් - දෙවිරාජන දේවි මුත්තේං - හනුමනේ - තෝඩවායේ - ඕං හ්‍රීං ශිවං මිංගුං ධුම් - ශිව ලිඟනවම් - මිංගුංධුම් - නාරායන මිංගුංධුම් - ඕං අර හරා ශිව ශිවාය - සගුසත්ති කුරුත්තිට්ටිධුම් - පුඩි ආකාස මුරත්ති සර්වලෝක ඊ සනාර් මුත්නික්ක එන්විතෙත පලික්ක - විහිසනාර් මුනිනික්ක මුප්පත්ති මුක්කෝඩි දෙවගීල් මුනික්ක - නාපිත්ති යෙන් කෝඩිර්සර් ගල් යේලුන්දරු ලකන්දර් කෙලාසර් මුත්නික්ක - කනපදි මුත්නික්කවේ ශිවානා."

ඕං හ්‍රීං හ්‍රීං කඩ් පුඩ් මඩලී - කපාල වෛරවා - ඕගම්පිරල - ඕගම් පිරල - ඔරුකෙලේ සුලම්මුම් - ඔරුකෙලේ කපාලමුම් - තිලක්කච්චයුම් - කිංකිනි මාලයුම් - පාදසිලඹුම් - විරලිල්කගතෙයාලි - ආනෙන්ද්‍ර පිරපට්ටු - වාර වඩිවුතන් - නෛප්පාරු පාරු - ඉඩක්කෙලේ එන්දිය එම් රාජනුම් වලද කෙලේන්දිය - වීරපත්‍ර මුම් - වීරපත්‍රනේයුම් - යෙඩුපුඩි



කොන්ඩෝඩි සංගුරුල සක්‍රම් - උරුල ඉඩකාඩු - රුල සුඩුකාඩු - රුල කොඩු තරඩුරල පුඩිත්තවන් තඩුමාරි කොන්ඩෝඩි - අලග ඉත්තවරාග වරුගවේ සිවාකා."

"ඕං නෛරෙප්පු නෙයියාලේ - පෝ ගවරත් - කෙට්ටවලෙයි - අප්පාල් තංඩනෙලි උංතායේ - තංගප්පනේ - පරමේශ්වරනානේ - පෝනයින්ඩුම් - පේට්කුඩුම් - බෙයුම් - වා වා - උත්දාර සිංහාරු සිවනලි - සිවා නලිකලි - කල්ලාලින්ද්‍ර - අංජලින්ද්‍ර වරලින්ද්‍ර - තඩං තඩං - මෝරින්ද්‍ර ඕඩි වර වර වේ සිවඃ"

"ඕං බින්ද්‍ර බින්ද්‍ර ඊශ්වර බින්ද්‍ර - ආසෝර සංහාර සිවන්දමේනියුම් - තිංඩු නංඩුම් කිනින්ද පුංඩලමුම් - හනුමා වා වා - අංජනදේවි වා වා - මා සත්ත පුල්ලියාරේ - වා වා - අංදං පොලොක්ක - ආකාශං පොලොක්ක - ආරත් කෙ පොලොක්ක - පෝරත් කෙ පොලොක්ක - නිලත් පොලොක්ක - නිල කං මනානේ - නිලං පොලොන්ද හනුමා හනුමා අංජන දේවි ඕඩි වා ඕඩිවා."

හනුමාට පුද

මල් වර්ග 9 යි, බොඩ ජාති 9 යි, දලු ජාති 9 යි, කොඩි 9 යි, පලවැල 9 යි, බුලත් 9 යි, පුවක් 9 යි, රිදී පඬුරු 9 යි, තඹ පඬුරු 9 යි, සඳුන් ගුළි 9 යි, කැවිලි ජාති 9 යි, පහන් 9 යි, කපුරු පෙති 9 යි, හඳුන්කූරු 9 යි, කඩල සේරු එකයි, විලඳ සේරු එකයි, හබල පෙති සේරු එකයි, තැඹිලි කුරුම්බා එකයි.

කපුරු අඳුන සාදා ඉහත සඳහන් පුද පූජා තබා 7 ක් හෝ 21 වරක් මතුරනු. එදිනට වුවමනා වෙලාවක එළිය කිව හැකියි. මෙයින් අනෙක් අංජනම්වලට ද මතුරන්නට හැකියාව ඇත.

## 29. විනාඩි කීපයක දී අත්දැකිය හැකි කපුරු අඳුන

හනුමා සෙයියඳුව මන්ත්‍රය

"ඕං ඉන්දිරනානේ වා වා - සෙන්දිරනානේ වා - නීලපරමේශ්වරී නානේ වා වා - සිවකදිර තම්බිනානේ වා වා - නිලරාම කොන්ඩුප්පුරත්තිල් - ප්‍රමාලයිල් රාම හනුමා සෙල්ලුම් - තින්නෙ රායිරං - පෙනුගුති හනුමා - නීලකොදඬ පෙරුත්කුත්

තුරුං - හනුමා ආදි සත්ති - පරම කල්‍යාණ - ආදි ආනන්ද වෛරවා - ආසෝර වෛරවා - ආසෝරච්චීර පරන්ද්‍ර පදිනාරු හනුමා - උලන්ද්‍ර කයි මුක්කා චනත්ති කාවාල් - අරමයිත්ත හනුමා - තිරි තිරි වීරපත්‍ර කොණ්ඩු අංජනදේවී - තායෙ ස්වාගු වාගු හනුමා - කයිවීර කාවාල් - ආකාශ හනුමා - නඩංගු නඩංගුවා - තිරි තිරි ඉගිලවා - දෙබුරැල් සරා - සහීර්ලා - හා ඉල්ලා දිල් ලල්ලා - හනුමා වක්කුං - ඉරි ඉරියුං - අංජන වයිරවී - පාතාල මුල වයිරවී - නයන කපාල වයිරවී පාතාල කොංඩු වාරුං - ශරිශරි මුක්කු හනුමා අංජන කාවාල් - භ්‍රාන්ති භ්‍රාන්ති හනුමා - ජීහ්අංස හර්ලා - ජීහ් ඉංසරා ජීහ්ඉං කනාරාජ්හ්ඉං - අබරාජ්හ්ඉං - සහර්ලා - හඉර්ල්ලා හියිල්ලල්ලාහි - කිඩත්තු කිඩවයියනේ - භූමි ඉරි ඉරික්කුං - ඉරවීර රමුක්කවං හනුමා - ශ්‍රී රාමදූත හනුමා පෙරුගප්පොයෙල් ආදි හනුමා වෙට්ටු වෙට්ටු - පාතාල මුරුගු - පාතාල මුරුගු - තිරුපිඩකාලි - සකල ලෝක පරමේශ්වරී - එරි එරියුං - ක්ලි ක්ලියුං - හාපා සිරිඩ හනුමා කයිවීර කාවාල් - ගිනිරාම හනුමා - අරු අරු ඉරි ඉරි මුරි මුරි - බිල දූල් කල් බීල් හනුමා - පෙරයේරු කොංඩු පපිස වීසා පිල්ලු සූනියන් පෙර ලුවචරිත්තුප්පට්ටුන්ද්‍ර ඉරි ඉරි වෙට්ටු හනුමා - පරිප්පුඩක්කු තිපුර එරියුං - එංකුඩ පාතාල වයිරවා - කොඩුං ඉලිප්ප ඉංජයුං - ඉර වඩියුකයිමෙත්ත හනුමා - උර්ලගිනිකාලි වීර හනුමා - පුඩි කොන්ඩුවා - පුද පුරත්තිල් - සෙයිර වර කාලි - අංජන වයිරවී - ත්‍රිපුර හනුමා කාලි වා වා ආවේස ආවේස ගිනි ගිනි කෛලාස කොංඩු වර හනුමා කාලි වා වා ශ්‍රී විෂ්ණු නාරායනේ ඉගිල ඉගිල වර වර විසි විසි - තෝගු තෝගු - සරි සරි හනුමා - කදිර ගුරු තම්බිරානේ වා වා අයියේන් ත්‍රිසුල ත්‍රිසුල හනුමා - ඔරුප්පච්චීර එරියුං - බන්ධ සූනියං වෙට්ටු ජහරේ හනුමා - අප්පා වා වා තාක්කු තාක්කු - ඉරවීර කුමාර හනුමා - අංජනවාරුං - පේසගුරු හනුමා වා වා - කයිකඩ - හනුමා වා වා - ඉරි ඉරි යුං - ක්ලි ක්ලි යුං - සිවමෙත්ත පරපුද සංහාර හනුමා - පාසහික්කං - ත්‍රිසූලත්ති හනුමා - අංජන සුලපේස කයිමෙත්ත වාරුං - කාවේස ගිනි ගිනි කාබීරි හනුමා - සෙයියාද්‍ර ජබිර ඉදුරේ ශිවාත් - සලා ඉල්ලල්ලා හර හරාම්"~



කපුරු අඳුන සාදා ඉහත මන්ත්‍රයෙන් 41 වරක් මතුරා බැලූ විට අංජනම පෙනේ. විෂ්ණු, කතරගම දෙවිවරුන්, හනුමා, අංජන දේවීත් එළියට පැමිණ කී සැටි කරත්.

අංජනමට කොඩිවින හූනියම් හිරබන්ධන කළ විට දෙහි ගෙඩි 3 ට මිත් 21 වරක් මතුරා කපනු.

පරණ වූ බෙහෙත් අංජනම්වලින් වැඩ ගන්ට බැරි වූ කල ද එළිය යකුන් විසින් අඳුරු කරන කල ද ඉහත මන්ත්‍රයෙන් 7 වරක් මතුරා කට්ටකුමංජල් දුම් අල්ලනු. යථා තත්ත්වයට පැමිණේ.

## 30. අංජනම් පලිප්පුවක් (හනුමා වෛරෝඩිය)

1. "ඕං හ්‍රීං ගජමදරන දිල්ලි පිල්ලි බාහේස් - සාහේස් - හූර්ලාන්තුපුරදේව ගිරිරාම ඉන්ද්‍රපුර වාන්ද්‍රතමේ දේවරාජ අණින් පලිප්පු පලිප්පු - යමක රුවාල් ගිරිහන්ති දෙරණ තර්ජනා වා වා - සර්පම්බු මුහුදු කම්පා වලිත වා වා - දේවගිනි මුද්දාසනි අහස තර්ජනා වා වා - කල්ලෝඩි බාහේස් ගිනි කදිර මාලාසනේ පෙරලී වා වා රාමනාරායනේ අණින් කදිර දේවමාලා ගිනිකරවා හනුමන්තා පලිප්පු වෛරෝඩි වා වා - බ්‍රාබුසාලා හෝ හෝ වීරුල්හමේ දේවරාජා අණින් හනුමා පලිප්පු වෛරෝඩි වා වා - අෂ්ටපුලෝක ඉරන්ද්‍රක්කාල් ශරගිනි බන්ධ විරූපාක්ෂ දේවරාජා අණින් හනුමා පලිප්පු වෛරෝඩි වා වා - ශර්දිකුලම්බිම්බ ගජවරන මුද්‍රාසනී - බිහිරි තෝඩා මා කාලි බජිරු බජිරු - කුංසුඩාප්පෝර පෙරියෙල් මරු මරණ තෝඩ මූඩොන් කුවේර වෛශ්‍රවණ දේවරාජා අණින් හනුමා පලිප්පු වෛරෝඩී වා වා - පාලු ජාමී හෝරා ජා මහා යූල් ගජහල් හක්මී දෝලාසී හනුමා පලිප්පු වෛරෝඩි වා වා - නවග්‍රහ දිෂ්ටි මුලු පලිප්පු බ්‍රාමී වර රාජා - සැඩිමුඩි තෙරියෙල් වා වා - තන්කෝ ජෝකාකි ජිලි මිලි සෙයියද්‍ර හනුමා පලිප්පු වෛරෝඩි වා වා - කිසිරැලි උපුල්වන් සමන් බොක්සැල් කැලණි විභීෂණ ජයශ්‍රී නාරායන අණින් විමන් ගිනි කොට හනුමා පලිප්පු වෛරෝඩී වා වා

- දේව ගුරුවාල් කන්තිච්චි වීර පත්‍ර නාරායනේ - ඉරිසුරුංඩු හනුමා පලිප්පු වෛරෝඩි වා වා - අෂ්ට ගජේන්ද්‍ර හස්ති සිංහ වෛරෝඩි වා වා - දේල ගුරුවාල් කන්කිච්චි වීරපත්‍ර නාරායනේ - ඉරි සුරුංඩු හනුමා පලිප්පු වෛරෝඩි වා වා - අෂට ගජේන්ද්‍ර හස්ති සිංහ වෛරෝඩි වා වා - දේල ගුරුවාල් කන්කිච්චි වීරපත්‍ර නාරායනේ - යමකාල් මුද්‍රාසනී සප්තකුල පර්වත අභිමාල සප්තරුඃ අසුර භවන වෙවුල්ලා හනුමා පලිප්පු වෛරෝඩි වා වා - අටමහ නිරේ ගින්නෙන් දැවීම් - සතර දිවයින් පිරිවරා - කොදෙව්වල නොරදා එං එං තම්බිරානේ - ඕඩි වර වර නමඃ"~

2. "ඕං පත්‍රකාලි වජ්‍රා දිෂ්ටි මරුමරණ දෙරණ කපාල හනුමා කලම්බු නමෝ වෛරෝඩි වා වා - එන් එන් නමඃ"~
3. "ඕං හ්‍රීං දෙහෙඳු දරනවේ ගුරුමාලා - කිලම්බු ගව්ඩී පලිප්පු වර වර නමඃ"~
4. "ඕං හ්‍රීං අම්බාරුඃ දෙරණ ගිනි කර - දෙහෙඳු දෙහඳු යමදොර වලිතකර - හනුමා වෛරෝඩි නේත්‍ර දිෂ්ටි කයියේල් සුරුඹු වවෙර කිඩ තෝටුප්පුලේ - අංජනම් දිෂ්ටි දිෂ්ටි ඒ අඤින් වර වර නමඃ"~
5. "ඕං හ්‍රීං ජල්ලා - අල්ලල්ලාහු හා හා - තෙයි තෙයි සෙයියඳු ආ ආ ඊ ඊ - සිව සිව හනුමා - කන්දනේ වෛරෝඩි දිෂ්ටි ශං වර වර නමඃ"~
6. "ඕං හ්‍රීං පාජුලී - පදක්කන්නා පිහාකුන් - ජේ ජේ පෝස්ටු ජෝම් හිම්කාර නමෝ - ප්‍රමුනි බලනු - මුකුලු ප්‍රේති - හනුමා පලිප්පු වෛරෝඩි දිෂ්ටි නාරායනේ නමඃ"~
7. "ඕං හ්‍රීං හවුඩී හලුඩී සෙල්ලුම් - ග්‍රමාහිභූමි සෙල්ලුම් කදිර මාලා සෙල්ලුම් - වීර හනුමා සෙල්ලුම් - වීර පත්‍රකාලී සකිරන දෙරන සෙල්ලුම් - වල්ලි අම්මා සෙල්ලුම් - භද්‍රකාලී සෙල්ලුම් - අංජනදේවි සෙල්ලුම් - ශ්‍රීයාකාන්තා දේවී සෙල්ලුම් - සබරි කුංජරී සෙල්ලුම් - තත්‍රවීර කොන්ඩේන් හනුමා වෛරෝඩි ශං නමෝ නමඃ"~



භූත විද්‍යාව දන්නා අය අතර මන්ත්‍ර පලිප්පු, යන්ත්‍ර පලිප්පු පිළිබඳව ද අවබෝධයක් ඇත. එහෙත් අංජනම් පලිප්පුව දුර්ලභය. දුර්ලභ ගණයේ අංජනම් පලිප්පුවක් වූ මෙය විභීෂණ, කතරගම, කිහිරැලි, උපුල්වන්, සමන්, බොක්සැල්, වීරපත්‍ර ආදී දෙවි දේවතාවරුන් මෙම මන්ත්‍රයට ඇතුළත් වීම අංජනම් පලිප්පුවේ වටිනාකම වැඩි වීමකි. පලිප්පු දැමීම යනු ඔප මට්ටම් කිරීමයි. හනුමා වෛරෝඩියෙන් අංජනම් පලිප්පු දැමීමෙන් පසු අංජනම බැලීම සුදුසු වේ. සියලුම අංජනම්වලට මේ මන්ත්‍රය සුදුසුය. අංජනමක් අඹරා ගත් අවස්ථාවේම 21 වරක් ද එළිය බලන විට 7 වරක් ද මතුරනු.

## 31. පහන් දැල්ලෙන් බලන දිෂ්ටි අංජනමක්

හනුමා ඉනා කර ගෙන්වන හනුමා උම්මෙය්යාව. හෙවත් හනුමා දිෂ්ටි මන්ත්‍ර

1. "ඕංගුරු - මහාගරු - ද්ව හනුමන්තා ගුරු - සිරිගුරු ඒස්වාහා"~
2. "ඕං නමඃ ශ්‍රී සත්හාරී - දේවගුරු හනුමන්තා සිව සිවායනේ වර වර නමඃ"~
3. "ඕං කාල හනුමා - ආකාශ හනුමා - සිවකාල හනුමා - උම්මෙය්ය වා වා අම්මා අංජනදේවි - හනුමා - වා වා - අප්පොච්චි වා වා - ගිඩි ගිඩි - සලිත සලිත - ගිනි හනුමා දිෂ්ටි වා වා"~
4. "ඕ ඉරවෙන්ද හනුමා - ආකාශ හනුමා ඔඩි ඔඩි උම්මෙය්ය හනුමා - ආයි ආයිංගනී හනුමා - අප්පා වා වා - සෙංග නාරායනේ ඔඩිවා ඔඩිවා"~
5. "ඕං පුවෙන්ද රහස් හනුමා - පුදංග හනුමා - කවිසි ගිනි හනුමා - ඔඩිවා - පාතාල හනුමා - කයිසුනිංඩු වා වා - උම්මෙය්ය හනුමා - අයියා අයියානේ ඔඩි ඔඩිවා"~
6. "ඕ කෙ කොංඩු - කෙරන්ද කොංඩු - වඩයේ සේරි හනුමා - ගිඩි ගිඩි - සලිත සලිත - ජේශ ගුරු නාරායනේ

හනුමා වා වා - අප්පා - අංජනදේවි උම්මෙය්‍ය වා වා - ඔඩ්වා ඔඩ්වා"

7. "ඕග ඕගනං කෙරන්ද කොංඩු හනුමා - සිවන්ද නාරායනේ වා වා - අවර ගිරි හනුමා ගිඩි ගිඩි - සලිත සලිත - වර වර දිෂ්ටි ගිනි ධරණ - මෙර සලිත - ආකාශ සලිත හනුමා විසි විසි වර නමඃ"

අංජනමක් අඹරා ඉහත මන්ත්‍රවලින් 108 වරක් ද එළිය බලන්නට පෙර 7 වරක් ද නැතිනම් 21 වරක් ද මතුරනු. මෙය සියලුම අංජනම්වලට වශී දිෂ්ටි මන්ත්‍රයකි. හනුමා කෝපයකින් කලබල කරන්නේ නම් මින් 7 වරක් මතුරනු. අංජනම් බැලීමේ දී 21 ක් වරක් මතුරනු. තනිකර මෙම මන්ත්‍රවලින් පානට මතුරා අංජනම් බැලිය හැකිය. පාන් දැල්ල දෙස බලාගෙන සිටිය යුතුය.

## 32. නේත්‍ර දිෂ්ටියක්

"ඕං වජ්‍රකාලි අංජනදේවි දිෂ්ටිමුඛ දිෂ්ටි නේත්‍ර දිෂ්ටි - දිෂ්ටි කාලි නම නම නමඃ"

අංජනම් එළිය බලන අයගේ මූණට දුම් ඇල්ලීමට මේ මන්ත්‍රය සුබයි. 21 වරක් කට්ටකුමංජල් මතුරනු.

## 33. දෙවිවරුන් කනට ඇසෙන්නට කතා කරවීම

### මුඛ දිෂ්ටියක් සහ ආවේශයක්

"ඕං අරු අරු චන්දතේයුම් - කාමිල ප්‍රලයුම් - ආඩාකුංඩවානේ - ප්‍රලචන්ද සූනියං - ආල්පේශනි - උරුන්ද්‍ර පේශනි - සර්වපේශනී - සිලිප් පේශනි - ශිව පේශනි - ශ්‍රීරාෂ්ට පේශකාලි - ඕරාෂ්ටකාලි - දිෂ්ටි වර වර - ලලිත වර වර - ජීව වර වර - ප්‍රාණ වර වර - නැගී වර වර - මාකරා වර වර කිලඹු වර වර - සලිත වර වර - පේසු වර වර - ආවේග වර වර - නවස්සි වර වර - දිෂ්ටි වර වර - ඒස්වාහාඃ" 7 වරක් පමණි.

1. දෙවි දේවතාවුන් ලවා කතා කිරීමට ප්‍රමාද වන විට එය ඉක්මන් කරවීමට



2. අංජනම් එළි බැලීමෙහි පළපුරුද්දක් නැති අය ආවේශ කිරීමට
3. අංජනම් බලන අය ආවේශ කිරීමට

අංජනම් එළි බැලීමෙහි පළපුරුද්දක් නැති අය මෙය මැතිරීමට නොයා යුතුය. සමහර අය අංජනම් දෙස බලා ගත්වනම අසන ප්‍රශ්නවලට පිළිතුරු නොදී ගොළුවකු මෙන් සිටී. එසේ වන්නේ අංජනම් තුළින් දිස් වන දෙවි දේවතාවුන්ගේ අලංකාර රූප දෙස අංජනම් බලන්නාගේ ඇස, කන, සිත සම්පූර්ණයෙන් යොමු වීමය. එවැනි අවස්ථාවල දී ඉහත මන්ත්‍රයෙන් කට්ටකුමංජල්වලට 7 වරක් මතුරා දුම් අල්ලනු. තත්ත්වය වෙනස් වනු ඇත. ඒ අතරම මේ මන්ත්‍රයෙන් 108 වරක් (සමහර අයට 21 වරක්) කට්ටකුමංජල් අල්ලා දුම් ඇල්ලීමෙන් ආවේශ වේ. එළි බලමින් සිටිය දී නම් විනාඩි 10 කට වඩා ආවේශ නොපවතී. ඒ කාලය තුළ කියන දෑ සත්‍ය වන්නේය. ආවේශයෙන් මිදෙන්නට ළං වූ විට පැත්තකට හෝ උඩුබැල්ලෙන් අතට වැටේ. මේ නිසා ඔහු අල්ලාගන්නට තුන්දෙනෙක් තුන් පැත්තෙන් සිටිය යුතුය. සිහිමුර්ජා වූ විට නියමිත මන්ත්‍රයකින් වතුර මතුරා මූණට ඉස ටිකක් බොන්නට දෙනු. කලින් වතුර මතුරා තබා ගනු. දෙවිවරුන් කතා කරවීමට මල් බුලත් පුටුවට 21 වරක් මතුරා දුම් අල්ලනු.

### සිහිමුර්ජාවලට මැතිරීමට ආරක්ෂා මන්ත්‍රයක්

"ඕං හ්‍රීං ඕං භගවති ඕං පුණ්ඩරී කක්ෂං ඕං ස්වස්ති සිද්ධම්. ර ර ර ර ඒස්වාහා ඕං හ්‍රීං මිනිලකාලව සන්තුප්පාන් තොස්වාහා ඕං හ්‍රීං ඉන්ද්‍ර කුලන්ද්‍ර හැර පලයන් තොස්වාහා" වතුර මතුරා ඉසිනු. (තුන් වරක්)

### තවත් මන්ත්‍රයක්

"ඕ ශ්‍රී විෂ්ණු ප්‍රලාඩී තුලා පෝරුකි හන්ති සංක්‍රෙස් බහුලාඩී විෂ්ණු දේස් දේස් - ඕං ආදේස් කිමාරේ උර්ලාඩී දේ හෝ ආක්‍රොන්තු ගාහේස් ශ්‍රී විෂ්ණු නාරායනේ දේස් දේස්" 21 වරයි.

## 34. අංජනම් එළිවලට පෙනී සිටින දෙවිවරුන් කතා කරවීම

"ඕං නමෝ දිව්‍යකාම රාක්ෂ දේවතාවී එර්දිකාලී යන දේවතාවී යන ගමනේ දී යුයුර්ධවන්ත දේවතාවා කෙළ ලක්ෂයක් පිරිවරා පෙරමග දී කතා කෙරෙව් අනුහසයෙන් කිං කිං දේශං කරේ ස්වාහාඃ"~

මෙම මන්ත්‍රයෙන් කට්ටකුමංජල් 21 වරක් මතුරා මල් බුලත් තටුවට දුම් අල්ලා එළිය බලන අයට තමාගේ කනට ඇසෙන්නට කතා කරන්නට යයි දෙවියන්ට සිතෙන් කන්නලව් කරන්නට කියනු. කනට ඇසෙන්නට කතා කරත්. ඇසීම දුර්වල නම් තවත් 21 වරක් මතුරනු.

## 35. විෂ්ණු මල් අඳුන

ඖෂධ :

කොබෝලීල මල්, රණවරා මල්, නා මල්, සපු මල්, වැල් රුක් මල්, කිනිහිරිය මල්, පෙතන් මල්, ඕලු මල්, නෙළුම් මල්, එළවරා මුල්, එළ බිංතඹුරු මුල්, එළ කටරොලු මුල්, බුලත් මුල්, සාරණ මුල්, පිල මුල්, තුංබෝ අත්තන මුල් හෝ ගලිස් මුල්, දුම්මල, කට්ටකුමංජල්, නිල්, හිරියල්, මනෝසීල

1. මුල්වලට මතුරන මන්ත්‍රයෙන් 7 වරක් මතුරා මුල් ගලවා ගත යුතුයි.
2. මල් සහ අනෙකුත් බෙහෙත් වර්ග ද්‍රව්‍ය දපනා මන්ත්‍රයෙන් මතුරා ගත යුතුයි. දෙවනුව මල් සහ මුල් අව්වෙන් හොඳාකාර වේළා ගත යුතුයි. ඊට පසු වට්ටෝරුවේ සියලුම බෙහෙත් වර්ග සම සමව ගෙන වංගෙඩියක ලා කොටා පිරිසිදු ගලක ලා දුම්මල තෙලෙන් සිනිඳුව අඹරා ගත යුතුය. කුඩු කරන විට රෙද්දකින් හෝ පෙනේරයකින් හලා ගැනීමෙන් ඇඹරීම පහසු වේ.

අඹරන විට ජප කළ යුතු මන්ත්‍රය

"ඕං නමෝ ජාලිත අතිදීඝ යේස්වාහාඃ"~

"ඕං ජීවප්‍රාණ අජීවප්‍රාණ භූතප්‍රාණ ජීව ජීව ඒස්වාහාඃ"~



108 වරක් මැතිරිය යුතුයි. මෙම මන්ත්‍රයෙන් මතුරමින් අඹරා ඊට පසු අංජනමට නියමිත ජීවම මන්ත්‍රවලින් ද මතුරමින් අඹරන්නට ඕනෑ වේ.

## 36. විෂ්ණු මල් අඳුනට නියම ජීවම මන්ත්‍ර

1. "ඕං හ්‍රීං සර්වකාම දිෂ්ටි දිෂ්ටි නමඃ"~
2. "ඕං හ්‍රීං ටං කාරණී ඒස්වාහාඃ"~
3. "ඕං හ්‍රීං ජලරුදුනි හද්‍ර ප්‍රමෙශ්වර කාලී නමඃ"~
4. "ඕං හ්‍රීං පච්චිල ප්‍රනන්ද සර්වගිනි කාලී නමඃ"~
5. "ඕං හ්‍රීං හද්‍ර සටික විෂ්ණු නාරායනේ නමඃ"~
6. "ඕං හ්‍රීං සෝරාෂ්ටකාලි වර වර නමඃ"~
7. "ඕං හ්‍රීං අංජනකූට ගිනිබ්‍රාඩී සීලම්බරකාලී ජීව වර වර ඒස්වාහාඃ"~

අඳුන අඹරා ගත්තාට පසුව පිරිසිදු පීරිසියක ආලේප කර සියලු අංජනම්වලට සාධාරණ න්‍යාය යටතේ නියම කරන ලද ලෙස මල් බුලත් පුටුව තනා මෙහි කලින් සඳහන් කර ඇති ජීව වරම 7 වරක් කියා එහි සඳහන් රාම දිෂ්ටියෙන් 7 වරක් මතුරනු. හනුමා දිෂ්ටි මන්ත්‍රයෙන් 108 වරක් මතුරනු. බිසිබිල්ලා මන්ත්‍රයෙන් 21 වරක් මතුරනු. හනුමා සෙයියදුවෙන් 21 වරක් මතුරනු. අංජනමට නියම ජීවම් මන්ත්‍රවලින් 1000 වරක් මතුරනු. හනුමා වෛරෝඩියෙන් 21 වරක් මතුරනු. ඉන්පසු අංජනම බලනු. කිලි කුණු නොවදින සේ අංජනම ආරක්ෂා කර ගෙන අංජනම් එළියක් බලන්ට වුවමනා වූ විට නැවතත් මල් බුලත් පුටුව තනා අංජනම් පීරිසිය එහි තබා පහනක් තබා 7 වරක් මැතුරූ හැටියේ එළිය පෙනේ.

පළමුවෙන් එළිය බලන අයට නිල් එළියක් පෙනෙන්නට වේ. එය ලොකු වෙන්ට හිතුවාම විශාල වී එළිය දෙපළු කරගෙන දෙවිවරු පැමිණෙත්. හනුමාව යම් තැනකට යැවීමට අවශ්‍ය නම් සියලු අංජනම්වලට සාධාරණ න්‍යාය යටතේ සඳහන් එළිය අරින මන්ත්‍රයකින් යවා වුවමනා දෙයක් දැන ගනු.

## 37. යක්ෂයින් පේන නේත්‍රාංජනමක්

අවශ්‍ය දේ :-

බළල්, සිවල්, දිවියන්ගේ දකුණු ඇස බැගින් අවශ්‍යයි.

ක්‍රමය :-

මෙකී ද්‍රව්‍යයන් වියළා තරුණ වියෙහි සිටින කුළඳුලේ වැදූ ස්ත්‍රියකගේ කිරෙන් අඹරා ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් බැගින් ජාම තුනක් මතුරා දකුණු ඇස පිහාටුව මත ගා පාන් ඇල්ල බලනු. යක්ෂයෝ පෙනෙත්. මෙය නිවෙස්වලත්, මිනිසුන්ගේත් අමනුෂ්‍ය උපද්‍රව බැලීමට හා එයට සුදුසු ප්‍රතිකර්ම කිරීම පිණිස යකැදුරන්ට සුදුසුය. අඳුන ඇස් පිහාටුවේ ගා පහනක් තබා එහි ඇල්ල දෙස බැලිය යුතුය. එවිට යක්ෂ, ප්‍රේත, පිශාචයින් ගැන මිස අන්‍ය කරුණු ගැන නොබැලිය යුතුය.

පුද පූජා :-

හඳුන්, කුකුල් ලේ, මල්, බුලත්, බඳින ලද ඇට් ඇට පස්වගය යන මේවායි.

වැඩිහිටි යකැදුරන් මිස වෙනත් අය නොබැලිය යුතුයි. (මෙම අංජනම සත්ත්ව ඝාතනයකට නැකම් කියන අංජනමකි.)

## 38. තැඹිලි ගෙඩියේ කපුරු අඳුන

ඇඳිය යුතු යන්ත්‍රය






මෙම යන්ත්‍රය වටේ කවයක් ද ඉරිවල මුදුන්වල ත්‍රිශූලය ද ඇඳ ගත යුතුය. මෙම යන්ත්‍රය තැඹිලි ගෙඩියේ පත්තිඳකින් හෝ කටුවකින් ඇඳ ඒ මතුපිට එරඬු තෙල් ටිකක් ගා දැල්වෙන කපුරුවලට අල්වා අඳුන බස්වා ගනු.

මන්ත්‍රය :-

"ඕං කයිකඩදේස් - සිවදේස් - රාජා හනුමන්තා රාජා ස්වාමියානේ වා වා නාරායනේ - ස්වාමියානේ - නිල්දිෂ්ටි සිවනේ රාජා වා වා"...

මල් බුලත් පුටුව සාදා අඳුන බැස්ස වූ තැඹිලි ගෙඩිය පුටුවට හේත්තු කර ඒ ඉදිරිපිට පහනක් දල්වා ඉහත කී මන්ත්‍රයෙන් 21 වරක් දිෂ්ටි කරනු. ඉන් පසුව,

"ඕං ඕං ශ්‍රීං ශ්‍රීං වං වං යං යං යකුපුට පුළ පුළ ඒස්වාහා"...

මේ මන්ත්‍රයෙන් එළිය බලන ළමයාගේ මුණට කට්ටකුමංජල් 21 වරක් මතුරා දුම් අල්ලා එළිය දෙස බලන්න කියනු.

විෂ්ණු, හනුමන්තා, අංජනම් දේවි යන දෙවි දේවතාවෝ පෙනී සිට වැඩ අවැඩ කියත්. ළමයාට ප්‍රලය විය හැකි බැවින් දුම් අල්ලන මන්ත්‍රයෙන් 21 වරක් මතුරන්න. ආවේශ කිරීම අවශ්‍ය නම් වැඩියෙන් මතුරන්න. දීර්ඝ පළපුරුද්දක් නැති අය ආවේශ නොකළ යුතුයි.

## 39. භූමි වස්තු පිළිබඳ පාතාල අංජනමක්

ඖෂධ :- දූ සමන් කැකුළු, එළ මිලිඳ මුල්, රත්හිරියල්, කපු ඇට තෙල්. මුල් මතුරන මන්ත්‍රයෙන් ද සමන් කැකුළු, රත්හිරියල් දපනා මන්ත්‍රයෙන් ද මතුරා ගනු. එම මන්ත්‍ර සියලු අංජනම්වලට සාධාරණව ගත හැකි ලෙස ප්‍රථමයෙන්ම සඳහන් කර ඇත.

ඊට පසුව එම බෙහෙත් පෙර කී ලෙස වියළා කුඩු කර රෙද්දකින් හලා කපු තෙලින් අඹරා ගානු. අඹරන විට මතුරන මන්ත්‍රය පෙර සඳහන් කර ඇත. අඹරන ලද අඳුන මල් බුලත්

පුටුවක තබා ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වර බැගින් තුන් යාමයක් මතුරා බැලූ විට පාතාලය පෙනේ. මෙය පොළොව යට වස්තු සඳහා සුදුසුය.

හනුමා දිෂ්ටි මන්ත්‍රයෙන් 108 වරක් ද, බිසිබිල්ලා මන්ත්‍රයෙන් 21 වරක් ද මීටම මතුරා ගැනීම සුදුසුය. හනුමා පාතාලයට යැවීමේ දී මෙහි පෙර සඳහන් කළ එළිය පිටත් කරන මන්ත්‍ර තුනෙන් එකකින් මැතිරිය යුතු වේ.

## 40. භූමි වස්තු පිළිබඳ හෛරව අංජනම

ඖෂධ :-

පාවට්ටා පංචාංගය, තඹලපුංචි (ඉස්ගෙඩි) ගෝරෝචන, වෙඩි ලුණු, අශ්ව නියපොතු, තුත්තනාගම්, වෙල්පාසානම්, අංජනකැට, කස්තුරි, රසදිය, රිදී, රත්‍රං, නවසාරං, සීනක්කාරං, සමුව්ර, රස කර්පූර් ආදියයි.

මෙයින් අමුද්‍රව්‍ය වියළා ගත යුතුයි. ඊට පසු සියල්ල සම භාගව ගෙන පිරිසිදු ගලක දමා මීට නියමිත දිෂ්ටි මන්ත්‍රයෙන් 21 වරක් කියා දුම් අල්ලා නියමිත ජීවම් මන්ත්‍රය කියමින් සත් දිනක් අඹරනු.

*1. හෛරව පාතාල දිෂ්ටිය*

"ඕං ආතාල දිෂ්ටි, පාතාල දිෂ්ටි, සර්වයක්ෂ රාක්ෂ භූත අභූත ප්‍රේත දිෂ්ටි - අං ඉං උං එං ඕ ස්වාහාඃ - සර්ව අංජන දිෂ්ටි - ගල් උඩින් - මුල් උඩින් - හෙල් උඩින් එන් - සප්ත කුල පර්වතය වෙවුලවා එන් එන් - හිමාල සත වෙවුලවා එන් - මුහුදු සත සලිත කරවා - ආකාශ ගර්ජනා කර එන් භූමි කම්පා කර එන් - මන්ත්‍ර රාජයා එන් - හනුමා එන් - අංජනම් දේවි එන් - පත්‍රකාලි එන් - ඊශ්වර - මහේශ්වර - ක්‍රතේශ්වර - නාටේශ්වර - සරස්වතී - ගණපති - පාර්වතී - ශ්‍රියාදේවි එන් - අංජන ගිනිබ්‍රාඩි ශිව දිෂ්ටි නාරායන අඞින් - නවග්‍රහ විමාන දිෂ්ටි ගං - කැපගං සිටු - එන්හන්ද්‍රසුං - සර්වධර්මේන් අඩංගු බන්ධවර නාරායනේ - සූර්යදැපනේ - අඩංගු - ඉරුදිෂ්ටිගං - සැට කෙළක් දෙවි දේවතාවෝ සර්වඥ තේජසින් දිෂ්ටිගං - මා ජය රක්ෂන්තු දිෂ්ටි දිෂ්ටි තෝස්වාහාඃ" ~ 21 වරකි.

*2. හෛරව පාතාල අංජනමේ නියමිත මන්ත්‍රය*

"වාරන අයියුම් නමෝ භගතියේ - ඕංමාකාරූපී - මාකාමායි - මත්වා සත්ති - අරුලාලේ - ඕං ආම් - හ්‍රීයුම් - ක්ලියුම් - අරියේඩී - කාන්තියේහී - විරිච්චූනස් වාංකං කනවෙ ඕං පරුවදා - තරුණ දාකා - නිවාකා ඕං පටිස්වාකා - ඕම් හ්‍රීම් හ්‍රීම් මෙනරු උන්නවෙ - කිලියුම් - අයියුම් - පටිස්වාකා - ඕං පටිස්වාකා - ඕං ඕං සින්දු - යන්දි යාදි - කාලියේ - පූරනියේ - අංජන - දේවී තායියේ - සිරියාන අංජනන් පච්චි ස්වාකා" ~ 108 වරයි.

එසේ ජීවම් මන්ත්‍රය සත් දිනක් ජපකර ගත් පසු අඳුන පිරිසියක ලා මල් බුලත් තටුවේ තබා ශ්‍රීරාම දිෂ්ටියෙන් 7 වරක් ද, හෛරව පාතාල දිෂ්ටියෙන් 21 වරක් ද, හෛරව පාතාල ජීවම මන්ත්‍රයෙන් 108 වරක් ද, හනුමා වෛරෝඩියෙන් 21 වරක් ද, මතුරා සුරැකි තැනක තබනු.

මෙයට නියමිත පූජා :-

තැඹිලි ගෙඩි 1 යි, පලතුරු වර්ග 5 යි, එකට ඇඳුණ කෙසෙල් ගෙඩි 6 යි (එකට ඇඳුත්ත කෙසෙල්)

පොළොව යට ධන නිධන්, මිනිරන්, මුතු මැණික්, වස්තු බලා ගැනීමට මේ අංජනම විශේෂයි. එසේ වුව ද පොළොව මතුපිට වස්තුව ඇතුළු සියලු දේ ද බලා ගැනීමට හැකියාව ඇත.

පොළොව යට වස්තුවක් බලා ගැනීමට අවශ්‍ය වූ විට මල් බුලත් පුටුව මත අඳුන තබා පහනක් තබා අංජනම් දිෂ්ටියෙන් 21 වරක් ද, හෛරව පාතාල ජීවමෙන් 4 වරක් ද මැතුරූ විට එළිය පෙනේ. හනුමන්තා සහ අංජනම් දේවිත් සියල්ල පෙන්නා දෙත්. පොළොව යට වස්තුව තිබෙන තැන් සියල්ල දැනගත් පසු හෛරවයින් සතුටු කොට හෝ හෛරවයින් බන්ධනය කොට හෝ හෛරවයින් පන්නා හැර හෝ ඒවා ගත යුතුයි. හෛරවයින් පැන්නීමත්, බන්ධනය කිරීමත් අනතුරුදායකය. හෛරවයින්

සතුටු කිරීමෙන් පොළොව යට වස්තු ලබා ගැනීමට ඔවුන්ගෙන්ම සියලු ආධාර ලබා ගන්නට හැකියාව ඇත. ඊට කළ යුත්තේ භෛරවයින්ට විශේෂ පූජාවන් දී ඔවුන් අංජනමට ගෙන්වා සියලු කතා දැන ගැනීමයි. අංජනමට භෛරවයින් ගෙන්වන මන්ත්‍රත්, ඊට දෙන විශේෂ පුද පූජාත් පහත සදහන් වේ.

*3. අංජනමට භෛරවයින් ගෙන්වන මන්ත්‍රය*

"ඕං සැරයා මුක්තා මුක්තා වා වා - ආදි සෝවා වා සෝදියෝ වා වා - මුක්තියෝ වා වා - වාලනත්වයෙන් වා වා - භද්‍රකාලි වා වා - ආකාල භෛරවී වා වා - පාතාල භෛරවී වා වා - උණ්ඩාණ්ඩ භෛරවී වා වා - තින්නා කාලි වා වා - ශ්‍රියා දේවී වා වා - ඕං කාලි ආකාල භෛරවී වා වා - ඕං භද්‍රකාලි පාතාල භෛරවී සර්ව බුද්ධානුභාවයෙන් වා වා"~

භෛරවයින් ගෙන්වීමට මින් 21 වරක් මතුරා මල් බුලත් පුටුවට දුම් අල්ලනු. මල් බුලත් පුටුවට යටින් කෙසෙල් කොළයක් තබා පහත සඳහන් පුද තබන්න.

පොල් රටුම් 1 (පොල් බෑයක්) , පහන් 1, පලතුරු වර්ග 5, බුලත් 10, කැවුම් 1, ඇට් ඇට වර්ග 5, පඩුරු 10, කෙසෙල් ඇවරි 1, පාට පහේ රෙදි 1, ඊතණ, සඳුන් - පුදවලට පහත සඳහන් මන්ත්‍රවලින් 21 වරක් මතුරා දුම් අල්ලනු.

"ඕං අයිං - ක්ලාං - ක්ලිං - ක්ලුං - හ්‍රාං - හ්‍රීං - හ්‍රූං - සඃ - ධඃ - ආපදා හරනාය - ජාමලි වද්ධාය - ලොකේශ්වරාය - මරෝග විද්වංශනායඃ"

1. "ඕං හ්‍රීං ජයන්ත භෛරවාය නමඃ"~
2. "ඕං හ්‍රීං මා බුබ භෛරවාය නමඃ"~
3. "ඕං හ්‍රීං ආසිතාංග භෛරවාය නමඃ"~
4. "ඕං හ්‍රීං ප්‍රචණ්ඩ භෛරවාය නමඃ"~
5. "ඕං හ්‍රීං කෙචර භෛරවාය නමඃ"~
6. "ඕං හ්‍රීං භුව භෛරවාය නමඃ"~
7. "ඕං හ්‍රීං භුවර භෛරවාය නමඃ"~



8. "ඕං හ්‍රීං ක්ෂණ භෛරවාය නමඃ"~
9. "ඕං හ්‍රීං ඔහී ශක්ති භෛරවාය නමඃ"~
10. "ඕං හ්‍රීං ආදි සත්‍ය භෛරවාය නමඃ"~

මෙසේ මතුරා අංජනමෙන් බලා පුද කැප ගත් පසු භෛරවයින් ප්‍රසන්න වන බැවින් ඔවුන්ගෙන්ම නිධන්, මැණික්, රන්, මිනිරන් ආදී පොළොව යට තිබෙන වස්තුව ගැන දැන ගනු. පූජා දී භෛරවයින් සතුටු කළ යුත්තේ ඔවුන්ට භාර කොට හෝ භාර වී තිබෙන පොළොව යට වස්තු ගැන පමණකි. අනිත් වස්තු ගැන භෛරව පුද දීමෙන් ඵලක් නොවනු ඇත. ඔවුන්ට අයිති වස්තු හනුමන්තාගෙන් කලින් දැන ගැනීමට ඉඩ ඇත.

## 41. නියපිට ගා බලන භූත අංජනමක්

පිටවක්සා මුලට කනසා නූල් පටක් බැඳ දෙවියන්ට පොල් බිඳ උදුරාගෙන අවුත් කැවුම් වළඳක පුලුස්සා බිඳපු පොලෙන් තෙල් සිඳ එම තෙලින් අඹරා අඳුන සාදා ගත යුතුයි. කනසා නූලට මතුරා ගැට හිර කළ යුත්තේ සියලු අංජනම්වලට සාධාරණ න්‍යායයේ මුලට සඳහන් මුල් මතුරන මන්ත්‍රයෙනි. ඉන් පසුව මල් බුලත් පුටුවක් තනා අඳුන එහි තබා ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් දිෂ්ටි කර පහත දැක්වෙන භූත අංජනම් ජීවයෙන් 108 වරක් මතුරා මහපටැඟිල්ලේ නියපොත්ත මතුපිට හෝ අල්ලේ ගා බලනු. පෙනෙනු ඇත.

භූත අංජනම ජීවම :-

"පුම් - විච්තෙකනි - අංජනමුලි - ගර්ධ පතානිම් - තොරිය ජය ස්වාහා"

[කනසා නූල යනු විවාහ නොවූ තරුණියක් ලවා අඹරවා ගන්නා නූලකි.]

## 42. දවස මුළුල්ලේ වැඩ ගත හැකි ප්‍රේත අංජනමක්

ඖෂධ :-

නාග පාසානන්, ගලිස්, ගොරෝචන, අමු කපුරු, සුදු පාසානන්, අංජන කැට, රන්හිරියල්, වියළි කහ

මේ සියල්ල සම බරට ගෙන පිරිසිදු ගලක ලා පස් තෙලින් අඹරා ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් ජීවම් කර එම ගල ලිප් ගල් දෙකක් පිට බෙහෙත් පැත්ත යටට හිටින්නට හරවා තබනු. ඉන් පසු පහත සඳහන් බෙහෙත් පස් තෙලින් වෙනම ගලක අඹරා පන්දම ඔතා පත්තු කර ඉහත පිළියෙල කළ බෙහෙත් සහිත ගලට යටින් අල්ලා අඳුන බස්සා ගනු.

පන්දමට අවශ්‍ය ඖෂධ :-

මිනි ඇට, හිරියල්, කහ, අංජන කැට, සුදු පාසානන්, කපුරු, ගලිස්, තුන්බෝ, අත්තන ඇට, පඹුරු මුල්, පල්මාණික්කම්, හොඬල ඇට අඹරා පන්දමේ ඔතනු.

පන්දමෙන් නැගෙන දුම් ශරීරයට නොවැදීමට වග බලා ගත යුතුය. අඳුන බස්සා අවසන් වූ හැටියේ ගලේ බෙහෙත් පැත්ත උඩට හරවා තබා ගල යට රුපියලේ කාසියක් දමා නැවතත ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් මතුරා අංජනම පෙනෙන කෙනකු ලවා ගලේ තිබෙන අඳුන දෙස බැලෙව්වාම ගල යට දැමූ රුපියලේ කාසිය අඳුනෙන් පෙනේ. නොඑසේ නම් පෙනෙන තුරු මැතිරීමෙන් පදම ලැබේ.

ඉන් පසුව අඳුන ආරක්ෂිතව තබාගෙන එළියක් බලන්නට වුවමනා වූ විට මල් බුලත් පුටුවක් සාදා පුද සමග අඳුන තබා පහනක් දල්වා ශ්‍රීරාම දිෂ්ටියෙන් 7 වරක් දිෂ්ටි කර පහත සඳහන් මන්ත්‍රවලින් 41 වරක් මැතුරූ විට අංජනමට තමන්ගේ මළ ගිය කෙනෙක් නොහොත් ප්‍රේතයෙක් ආරූඪව සියල්ල කියා දෙයි. මෙයින් ඕනෑම වේලාවක අංජනම බලාගත හැකිය. දිව්‍ය අංජනම්, දේවතා අංජනම් ආදියෙන් දවසකට පැයකට වඩා එළිය බැලීමට නොහැකිය. දවස පුරා වෘත්තියක් වශයෙන්



අංජනම් බලන අයටත්, තොවිල්වල දී සවස පටන් එළිවන තුරු එළිය බලවන යකැදුරන්ටත් ප්‍රේත අංජනම ප්‍රයෝජනවත්ය.

ප්‍රේත අංජනමේ ජීවම් යන්ත්‍ර

1. "ඕං ජවිලාඩා ගුරුවන්ද පේසලාඩී ශ්‍රී විෂ්ණු අණින් කියාපන්."~
2. "ඕං සශ්‍රිලාඩී වේලායන් කදිර කුමාර කන්ද ස්වාමි අණින් කියාපන් කියාපන්."~
3. "ඕං ප්‍රලාඩී ජලතල ඉගිල ඉගිලී වර වරාඩි ප්‍රාන්දතේ ගිනිගිනි අංජනම් දේවතාවී අණින් කියාපන් කියාපන්"~
4. "නමෝ කකුසඳ, කෝනාගම, කාශ්‍යප, ගෞතම සතර බුදුවරයින්ගේ ආඥාවෙන් ආනුභාවෙන් කියාපන් කියාපන්."~
5. "ඕං හර හරා ඩි ගිනි ගිනි සීලම්බරී වර වරාඩි තේවර වර වාරුම් ශ්‍රී ලංකාධි වෙසමුනි මුණ්ඩෙ අණින් ප්‍රේත යක්ෂයා යක්ෂණී මා කෙරේ නැමි නැමී කියාපන් කියාපන්."~
6. "ඕං හර හරාඩි කේජලං කුම්භලාඩි පේසල පේසලාඩී ඊශ්වර මහේශ්වර අණින් ප්‍රේත යක්ෂයා යක්ෂණී මා කෙරේ නැමි නැමී කියාපන් කියාපන්."~

යකැදුරකුට මේ අඳුනෙන් බොහෝ ප්‍රයෝජන ගැනීමට හැකියාවක් ඇත. මෙම අඳුනෙන් යක්ෂයින්, ප්‍රේතයින් ගැන ද ලෙඩ රෝග ගැන ද, ඉනා කැවීම්, වස විෂ කැවීම් තිබේ නම් ඒ පිළිබඳවත් හොඳාකාර දැන ගැනීමට හැකියාව ඇත. ප්‍රේතයින්ට අනාගතය නොපෙනෙන නිසා රේස් ගැන ලැබෙන්නට තිබෙන ලාභ ප්‍රයෝජන ආදිය ගැන ඉදිරියට විය හැකි අපල උපද්‍රව ගැන ඇසීමෙන් කරදරයෙන් මිදීමට ඔවුන්ට හිතෙන හිතෙන බොරු කිම සිදු වේ. එනිසා එවැනි නිෂ්ඵල කරුණු ගැන විමසීම නොකළ යුතුය.

එකම කෙනකු ලවා බොහෝ වේලා අංජනම් බැලවීම නුසුදුසුය. එසේ කිරීමෙන් ඇස් පෙනිම දුර්වල වීමට ඉඩ ඇත.

ප්‍රේත අංජනමෙන් බොහෝ වේලා එළිය බලන විට පැයෙන් පැයට අංජනම් බලන්නන් මාරු කළ යුතුය.

පුද වර්ග :-

බුලත්, පුවක්, කැවිලි වර්ග 7 ක්, පලතුරු වර්ග 7 ක්, එළවළු ව්‍යංජනයක්, රා, අබිං, කංසා, පඬුරක්, බතක්, මල් 7 වර්ගයක්, තැඹිලි ගෙඩියක් පුද වර්ගවලට අයත්ය.

## 43. සූර්ය අංජනම

"ඕං හ්‍රීං හ්‍රීං හ්‍රීං අංජන ගිරිකූට ධාරණී - බඹදිෂ්ටි - දිවස් දිෂ්ටි දිෂ්ටි දිෂ්ටි ඒස්වාහාඃ"

සූර්යයා දෙස බලා ඇස් පියාගෙන 108 වරක් දපනු (මතුරනු). එළිය පෙනේ. වෙනත් කෙනකු ලවා බලන විට ඔහුට ඉර දෙස බලා ඇස් පියාගෙන වාඩි වී සිටින්නට කියා කට්ටකුමංජල් මතුරා දුම් අල්ලනු. මෙයින් පැය බාගයකට වඩා එළිය නොබැලිය යුතුයි. මෙයට පුද පූජා වුවමනා නැත. පළමු දවසේ එළිය නොපෙනුණත් සතියක් දෙකක් ජප කරගෙන යෑමෙන් සිද්ධිය ලැබේ. නිසගයෙන් දෙවිවරුන්ට තිබෙන දිවැස් මනුෂ්‍යයා විසින් උත්සාහයෙන් ලබා ගත යුතුය. අංජනම් පෙනීම යනු දිවැස් පහළ වීමකි. ඉහත ජේන මන්ත්‍රයෙන් "දිවැස් දිෂ්ටි" කියන්නේ දිවැස් පහළ වීමටය. සූර්ය අංජනම බැලිය හැක්කේ දිවා කාලයේ පමණි.

## 44. යක්ෂයින් ගෙන්වන යක්ෂ අංජනමක්

ඖෂධ :

රත්තරන් කුඩු, මිනි ඇට කුඩු, සස්සඳ මුල්, එළ බිංතඹුරු මුල්, රත්හිරියල්, වසූරිය සෑදී මැරුණු මිනිසකුගේ මිනි ඇටයක් සොයා ගැනීමට හැකි නම් වඩාත් සුදුසුය.

සස්සඳ මුල්, එළ බිංතඹුරු මුල්, මුල් මතුරන මන්ත්‍රයෙන් මතුරාගෙන වේළා ගත යුතුයි. ඊට පසු එම මුල් කුඩු කරගෙන අනෙක් ඔසු කුඩු සමග රෙදි කැල්ලක බැඳ තල තෙලෙන් පොඟවා ගලක් උඩ තබා පුලුස්සා අඹරා ගත යුතුයි. අඹරන



විට ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් දිෂ්ටි කර ඊට නියම ජීවම මන්ත්‍රයෙන් 108 වරක් මැතිරිය යුතුයි.

**යක්ෂ අංජනම් ජීවම මන්ත්‍රය**

"ඕං හ්‍රීං - සිව වෛබ්‍රංගුඳගුරු - කාම ඉරලා - දිෂ්ටි ගිනි නාරායනේ - වාරුම් - පේශල කොණ්ඩුම් - බ්‍රහ්ම ගුරුවායි - බ්‍රෝම් - ආනික්‍රාම් - බාහුම් දේවාම් - හ්‍රීං හ්‍රීං - හරහර - ලංකාප්‍ර නම සිව - වෛබ්‍රංගු සර්වකුමාර - බත්චෝඩි සේසං - බ්‍රන්තු කිම් - ප්‍රාන්හාන් හ්‍රීං ශ්‍රී ලෝක තම්බිනාරායනේ ඕඩ්වා"

දුම් දීමට ගන්නේ දුම්මලය. මීට ඉරලා යක්ෂයා හෝ සූනියන් යක්ෂයා හෝ යක්ෂයෙක් එන්නට හැකියාව ඇත. භය නොවන ශාන්ත විලාසයකින් පෙනී සිටින්නට ආරාධනා කළ යුතුය. යකැදුරන්ට ප්‍රයෝජනවත් අංජනමකි.

පුද වර්ග :-

බිත්තරයක්, මල්, බුලත්, කැවිලි, පලතුරු, තැඹිලි ගෙඩියක් තබනු.

## 45. ලෙඩ ගුරුවාංග අඳුන

ඖෂධ :-

තනිවැල්ල පෙරුමාලෙ, එළ කටරොලු මුල්, රුද්‍රාෂ්ටක, රත්එරඬු මුල්, බිත්තල් අල, බිම්පොල් ඇට, මයිල මල්, විෂ්ණුක්‍රාන්ති මුල්, දුටු සතුටු මුල්, නෙළුම් ඇට, මානෙල් අල, බෝ ඇට, සවුකෙන්ද මුල්, නා මල් රේණු, සපු ඇට, සස්සඳ ඇට, ඉරමුසු ඇට

මෙහි මුල් වර්ග මුල් මතුරන මන්ත්‍රයෙන් ද අනෙක් ද්‍රව්‍ය - ද්‍රව්‍ය මතුරන මන්ත්‍රයෙන් ද මතුරාගෙන කබලේ බැද පිරිසිදු ගලක දුම්මල තෙලෙන් අඹරා තඹ කරඬුවක ලා බෝ මැඩ මුල දී මල් තටුව තනා ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් දිෂ්ටි කර මෙම පොතේ වෙනත් ස්ථානයක සටහන් වන "මුඛ දිෂ්ටියක් සහ ආවේශයක්" යන ශීර්ෂය යටතේ ඇති "ඕං අරු අරු වන්දතේයුම්" යනාදී මන්ත්‍රයෙන් 108 වරක් මතුරා ගානු. ඊට පසු අංජනමක් බලා ගැනීමට අවශ්‍ය වූ විට "ඕං අරු අරු

චන්දතේයුම්" මන්ත්‍රයෙන් 40 වරක් මතුරා අඳුන ඇසිපිය පිට ගා බලනු. අංගං පෙනේ හා පිල්ලි පෙනේ. (අංගං - පිල්ලි ආදි කාලීනව ප්‍රයෝජන ගත් ඒවාය අද යටපත්ව ඇත. උදාරහණ ඇත.) බතට බුලතට වින කරන්නවුන් පෙනේ. බලන අයට කට්ටකුමංජල් මතුරා දුම් ඇල්ලීමෙන් ආවේශ වේ. එවිට වුවමනා දේ ඉක්මනින් දැනගෙන ඔහු අල්ලා බිම නිදි කරවා සිහි මූර්ජා වූ විට මතුරන්නට නියම කර ඇති මන්ත්‍රයකින් වතුර මතුරා මූණට ඉස සිහි කරවනු. කට්ටකුමංජල් මතුරා ශරීරයට දුම් ඇල්ලුවොත් ආවේශ වන්නේ නැත. අඳුන ඇස පිට ගා වුවමනා දේ අසා ගත හැකි වේ. ආවේශ කිරීමක් අනවශ්‍යය. දීර්ඝ පළපුරුද්දක් ඇති අය පමණක් ආවේශ කරනු.

## 46. දිවා -රාත්‍රී දෙකටම සුදුසු සර්වාංජනම

එළ කටුපිල ගස මුලට වැලි ලා මල් පුදා කන්‍යා නූල් වටේ ඇද පානක් දල්වා සවස පේ කොට සියලු අංජනම්වලට සුදුසු න්‍යාය යන මාතෘකාව යටතේ දැක්වෙන මුල් මතුරන මන්ත්‍රයෙන් 7 වරක් මතුරා පසුදා නැවතත් එම මන්ත්‍රය 7 වරක් කියා මුල් ගෙන ඉන් කොටසක් පවිත්‍ර තැනක දී දවා අළු ගැනීම කළ යුතුය. රදා තොටකින් සිවුරුපට කැල්ලක් සෝදා වේළාගෙන පන්දමක ඔතා මීතෙල්, තල තෙල්, දිවි තෙල්වලින් පොඟවා අඳුන බස්සවා ලනු. මුලින් දැවූ අළු සහ පසුව බස්සවා ගත් අඳුන ද පිරිසිදු ගලක එකී තෙල්වලින් එකට අඹරා ගත යුතුය.

අඹරා ගත් අඳුනට ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් ද, හනුමා දිෂ්ටි මන්ත්‍රයකින් 108 වරක් ද, බිසිබිල්ලා මන්ත්‍රයෙන් 21 වරක් ද, හනුමා සෙයියදුවෙන් 21 වරක් ද, හනුමා වෛරෝඩියෙන් 21 වරක් ද මතුරා සුරැකිව තබාගෙන අංජනම බැලීමට අවශ්‍ය වූ විට තල තෙලින් ඇස් පිහාටුව මතුපිට ගා පහන් ඇල්ල දෙස බලනු. දවල් තරු පෙනේ. ඌ පාතාලේ පෙනෙයි. පොළොව යට සත් රියනක් පෙනෙයි. සිතන සියලු දේවතාවුන් පෙනෙයි. මෙය බොහෝ දෙනෙකුට පෙනෙන අංජනමකි. සියලු දෙනාටම පෙනීමට දිනකට පැය භාගයක්වත් නොකඩවා බැලිය යුතුය.



## 47. බුලතේ ගා බලන තවත් අංජනමක්

ඖෂධ :-

කළු එළු පිත, මොනර පිත, අමු කපුරු, ගෝරෝචන, උතුරට ගිය එරබදු මුල්

එරබදු ගස් පළමු දින පේ කොට මල් පහන් පුදා සුවඳ දුම් දී පංචෝපචාර කොට පසුවදා උදුරා මුල් මතුරන මන්ත්‍රයෙන් මතුරා ගනු. ඉන් පසුව සියල්ල වේළා සම බරට ගෙන පාතාල මධුවෙන් (හුඹස් මී පැණියෙන්) අඹරා හෙප්පුවකට ගෙන (වර්තමානයේ පීරිසියකට) ඇඹරූ ගල ළඟම මල් බුලත් පුටුව තනා එහි තබා ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වර බැගින් තුන් යාමයක් මතුරා සුරැකිව තබා ගන්න.

එළිය බැලීමට අවශ්‍ය වූ විට

"ඕං භගවතේ සිද්ධාය. කාර ජ්වල ජ්වල පාතාල පනිකොට බන්ධසංහාර සංහාර සිද්ධෙ ස්වාහාඃ"

යන මන්ත්‍රයෙන් 7 වරක් මතුරා බුලතේ අඳුන ගා

"ඕං කා කියන මන්ත්‍රයේ ආනුභාවයෙන් ජීවතේරි මනේ ස්වාහාඃ"

යන මන්ත්‍රයෙන් අංජන පත්‍රයට (අඳුන් ගෑ බුලතට) 21 වරක් මතුරා බලනු. ආතාලේ පාතාලේ සෑම තැන් පෙනේ. බුලතේ අඳුන ගාන මන්ත්‍රයත්, පත්‍රයට මතුරන මන්ත්‍රයත්, පත්‍රයේ ගා බලන සියලු අංජනම්වලට යොදා ගත හැකිය.

## 48. දේවතා අංජනමක්

ඖෂධ :-

යොන් තුඹ මුල්, නිදිකුම්බා මුල්, එළ කටරොලු මුල්

මල් පහන් දුම් පුදා පංචෝපචාර කොට මුල් මතුරන මන්ත්‍රයෙන් මතුරා උදුරාගෙන කබලෙන් බැද පාතාල මධුවෙන් අඹරා පීරිසියක දමා මල් බුලත් පුටුවක තබා ශ්‍රීරාම දිෂ්ටියෙන් යාම තුනට 108 වර බැගින් මතුරා ගනු.

එළියක් බැලීමට අවශ්‍ය වූ විට ශ්‍රීරාම දිෂ්ටියෙන් 21 වරක් මතුරා මෙහි මුලින් සඳහන් කරන ලද සූනියන් දේවතාවාගේ දිෂ්ටියෙන් මතුරන විට සූනියන් දේවතාවා පෙනේ. සුදු දේවතාවා, සපුමල් දේවතාවා, වාහල දේවතාවා, කලුකම්බිලි දේවතාවා, රන්කම්බිලි දේවතාවා ආදී කැමති දේවතාවෙක් මේ අඳුනට ගෙන්වා ගන්නට ඉඩ ඇත. ඊට වුවමනා දේවතාවාගේ නම මැදට අසු කර මේ මන්ත්‍රය මතුරනු.

"ඕං නමෝ......දිෂ්ටි දිෂ්ටි ඒස්වාහාඃ"~

ඉඩ හැර තිබෙන්නේ දේවතාවාගේ නම අඩංගු කළ යුතු තැනය. ශුද්ධ වූ අන්තෝනි මුනිවරයා ද මේ ක්‍රමයෙන් ගෙන්විය හැකිය. දේවතා ආත්ම ලබා සිටින ඥාති මිත්‍ර මළවුන් ගෙන්වීමට මෙය ඉතාම සුදුසු අංජනමකි.

## 49. තවත් ප්‍රත්‍යක්ෂ අංජනමක්

ඖෂධ :-

මුතු කුඩු, කහ කුඩු, පළිඟු කුඩු, රිදී කුඩු, තුත්තං කුඩු, යහුනු, රසදිය, සූර්යකාන්ත මල්, තුන්බෝ අත්තන මල්, ගුරුල්ල මුල්, සස්සඳ මුල්, ඉරිවේරිය මුල්, මුඩ මහණ මුල්, කවුඩු බෝ මුල්, කන්සා මුල් - කොළ සහ ඇට, කටුපිල මුල්, විෂ්ණුක්‍රාන්ති මුල්, පිල මුල්, මොනර පිල්

මුල් මතුරන මන්ත්‍රයෙන් ද, අනික් ද්‍රව්‍ය - ද්‍රව්‍ය දපනා මන්ත්‍රයෙන් ද මතුරා කබලේ බැද පිරිසිදු ගලක ලා එඬරු තෙලින් අඹරනු. ගල යටට රුපියලේ කාසියක් ලා පහත දැක්වෙන මන්ත්‍රයෙන් මතුරමින් අඹරන විට රුපියලේ කාසිය අඳුනෙන් දිස් වේ.

**අඹරන විටත්, මතුරන විටත් මතුරන දිෂ්ටි මන්ත්‍රය**

"ඕං ජීව ප්‍රාණ - අජීව ප්‍රාණ - අභූත ප්‍රාණ - යක්ෂ ප්‍රාණ - අජීව ජීව ඒස්වාහාඃ"

"ඕං දිෂ්ටි - මහා විෂ්ණු දිෂ්ටි - කන්දකුමාර දිෂ්ටි - සුරදිෂ්ටි - අසුර දිෂ්ටි - යක්ෂ දිෂ්ටි - ප්‍රාණ දිෂ්ටි - ජීව දිෂ්ටි - අංජන දිෂ්ටි



- අවුසද ප්‍රාණ දිෂ්ටි - දිෂ්ටි ඒස්වාහාඃ"~ 324 වරක් මතුරනු.

පෙර යාමයට 108 වර බැගින් 324 වරක් මතුරා පසුව එළිය බලන විට 21 වරක් මතුරනු.

## 50. උප්පත ගා බලන දිව්‍ය අංජනමක්

ඖෂධ :-

අමුක්කරා මුල්, විෂ්ණුක්‍රාන්ති මුල්, කුප්පමේනිය මුල්, මුඩ මහණ මුල්, කටුපිල මුල්

"සියලු අංජනම්වලට සාධාරණ න්‍යාය" මත මුල් මතුරන මන්ත්‍රයෙන් මෙකී මුල් මතුරා උදුරා කබලෙන් බැද සම බරට ගෙන තොට පියල්ලේ ඔතා දැවූ අඟුරු එඬරු තෙලින් හෝ දුම්මල තෙලින් උදලු තැටිල්ලේ අඹරා උප්පත ගා බලනු. අංජනම පෙනෙනු ඇත.

තොට පියල්ල (රදා තොට) යනු රදා මිනිසුන් රෙදි ගලේ ගහන විට කැඩී විසි වන රෙදි කැබැල්ලයි. උදලු තැටිල්ල යනු උදලු තලයයි. උප්පත නම් උක් ගසේ කොළයයි.

මන්ත්‍රය :-

"ඕං ජීව ප්‍රාණ - අජීව ප්‍රාණ - භූත ප්‍රාණ - අභූත ප්‍රාණ - අජීව ජීව ස්වාහාඃ"~ අඹරන ගමන් 324 වාරයක් මතුරන්න.

ජීවම මන්ත්‍රය :-

"ඕං හර හර රාම රාම - කදිරවේලාම් - සිව සිවා - කන්දස්වාමි - ගුරුමන්ත්‍රකාලි - හනුමා දිෂ්ටි - වීරභද්‍රකාලි දිෂ්ටි - මහා මන්ත්‍ර රාජයා දිෂ්ටි - සුර දිෂ්ටි - අසුර දිෂ්ටි - බ්‍රහ්ම දිෂ්ටි - නාග දිෂ්ටි - ගරුඬ දිෂ්ටි - දේව දිෂ්ටි - සූර්ය දිෂ්ටි - චන්ද්‍ර දිෂ්ටි - සක්භුම දිෂ්ටි - ප්‍රල ප්‍රල දිෂ්ටි - විෂ්ණු මහා විෂ්ණු දිෂ්ටි සිද්ධ විද්‍යාධර දිෂ්ටි - වීරනාරායණේ සරස්වතී දිෂ්ටි - යන්ත්‍ර මන්ත්‍ර රාජයානේ දිෂ්ටි දිෂ්ටි වර වර නමඃ"~ 1000 වාරයක් මතුරනු.

මෙහි වෙනත් ස්ථානයක සඳහන් වන අයුරින් පුද සහිත

මල් බුලත් පුටුව සාදා ඉහත කී ලෙස අඹරා ගත් අඳුන හෙප්පුවක ලා එහි තබා දහස් වර මැතිරීමෙන් සිද්ධි වේ.

එළිය බලන්නට වුවමනා වූ විට අඳුන් ටිකක් උක්පතක උලා (උක් කොළයක කෑල්ලක්) මල් බුලත් පුටුව පිට තබා 7 වරක් මතුරා පානට අල්ලා හෝ පහන් දැල්ල කෙළින් තැන්පත් කොට බලනු. තොට පියල්ලක් ගන්න විට සෝදා පිරිසිදුව ගැනීමට අමතක නොකළ යුතුය. මෙය මනුෂ්‍ය ගණයේ බොහෝ දෙනකුට පෙනෙන අංජනමකි.

## 51. කන්ද කුමාර අංජනම

නා කොළ, නුග කොළ, බෝ කොළ, සමන් පිච්ච කොළ, ඉරිවේරිය, සැවැන්දරා, සුවඳ කොට්ටන්, කස්තුරි, ගෝරෝචන, කුංකුමප්පු, නා මල් රේණු, නෙළුම් රේණු, රුක් මල්, තුවරලා, සුදුහඳුන්, රත්හඳුන්, කපුරු, කට්ටකුමංජල්, කළු අගිල්, ජටාමාංශ, රතු අරලිය මල්, මොනර කුඩුම්බිය මල්.

සාදන ක්‍රමය :-

මේ සියල්ලම සමබරව ගෙන වේළා කොටා රතු පච්චවඩම් රෙද්දෙන් පන්දම් ඔතා එඬරු තෙලෙන් පොඟවා හෙප්පුවක අඳුනක බස්සවා ගනු. ඊට පසු හෙප්පුව මල් බුලත් තටුවක් මත තබා පහත දැක්වෙන දිෂ්ටි මන්ත්‍රයෙන් 108 වරක් මතුරා ජීවම් මන්ත්‍රවලින් 108 වර බැගින් යාම තුනක් මතුරනු.

### කන්ද කුමාර දිෂ්ටිය

"ඕං හර හර - ශ්‍රී කුමාර ගුරුවේල - අයියෝ ත්‍රි නෛතාරේ වා වා - දේවනේ - වල්ලි අම්මා වා වා - ත්‍රිපුර සම්මුඛාය - පරිපූර සම්මුඛා සය ලෝලි සම්මුඛා කදිර කුමාර ගුරු තම්බිරානේ අංජනකූට පර්වතය ගුගුරුවා වා වා - ආගුරු - කුමාර ගුරු - සම්මුඛා - ත්‍රිපුර සම්මුඛා - පරිපූර සම්මුඛා - සයලෝලී සම්මුඛා - මයුරාසනං ඒරි ඒරි - ආ - ඊ - ඌ - ඒ - ඕ - හ්‍රීං හ්‍රීං - ශ්‍රීං ශ්‍රීං කොණ්ඩු - මසිල් මෙලේ - කන්දප්පේ වා වා - සූර සංහාර ජේසුං වා වා - නීලගුරු කම්බිලි එන්නේන් - භූමි භූමි සලිත සලිත - සැඩිදි සැඩිදි - විසි විසි - සීස්‍ර සීස්‍රාම් - ඔඩි ඔඩි වා වා - රාම සැර මෝහනි - රාජගුරු මෝහනි - දේවගුරු මෝහනි වා වා - ත්‍රී සූලමුන් වේලායුං - කොංඩු - මයිල්මේල් ඒරි - කන්දප්පේ වා වා - ඒරි ඒරි වේලා - හ්‍රීං හ්‍රීං වේලා - හ්‍රීං හ්‍රීං වේලා - ගිඩි ගිඩි - සැඩිදි සැඩිදි - විසි විසි - සීස්‍රාම් - ඔඩිවා ඔඩිවා - හරහර - කන්දස්වාමි - ඒන් නේන් - මා කෙරේ වා වා - මෙල්මයිල් උරුට්ටු උරුට්ටු - කිලම්බු කිලම්බු - ජෝ හෝ - ජෝ හෝ - ප්‍රමාද ඔට්ටු ඔට්ටු - තිල් තිල් - කුමාරගුරු වේලේ - ගණපති වේලා - අයියෝ පාරේ වා වා - දිෂ්ටි දිෂ්ටි මේ ශිවාබා"~ 108 වරක් මතුරනු.

### කන්ද කුමාර අංජන ජීවම

"නමෝ නාමාෂ්ඨ සංජීව දේව සහාය - මනෝන්මනි පරිපූරාන - සිව කමල අනුමාර් - ශ්‍රී අංජන දේවි - පරම සිවතා මන්ද අරුවචත - පාර්වදි කදිර දේවානේ - නමස්කුතා - සරුව පරාපර පමණඩාල - ආශිර්වාදං - හර හරා - සිව සිවා - නාමගුරු සමන්ත බහිරාෂ්ඨ - භූම දේවී - නමෝ නමඃ"~

"සහාදේව රාජාංගනාමාෂ්ඨ - කාරුනිස - පරමණ්ඩල - මහමුනි - සිව සිවා - වඩිවේලායුදම්- ශීතාලෙච්චම් නමෝ නමඃ"~

"අයියුම් කිලියුම්- අංජන දේවි - පාර්වදි - නමෝ නමඃ"~ 324 වරක් මතුරනු.

පුද පූජා :-

බුලත් 12, පඩුරු 12, මුළු පුවක් මලයි, කෙසෙල් ගෙඩි 12 ඇවරියයි, රන් තැඹිලි ගෙඩියයි, කපුරු පෙති 12, හඳුන්කූරු 12, රතු පාට රෙදි කෑල්ලයි, කිරිබත්, සක්කර, වී පොරි, රතු මල් 12 වර්ගයයි.

### ජීවම් කිරීම

ජීවම් කරන විට අඳුන් හෙප්පුව රතු රෙදි කෑල්ල පිට තබනු. මෙසේ ජීවම් කර ගත් අඳුන ආරක්ෂිතව තබාගෙන එළියක් බලන්නට වුවමනා වූ විට මල් බුලත් පුටුවක් සාදා බුලත් කොළ 6 ක් ද, කෙසෙල් ගෙඩි 6 ක් ද, තැඹිලි ගෙඩියක්

ද, මල් 6 වර්ගයක් ද පුදා ඉහත කී දිෂ්ටියෙන් 7 වරක් දිෂ්ටි කර ජීවම් මන්ත්‍රවලින් 21 වරක් මැතුරූ විට අංජනම පෙනේ. කතරගම දෙවියෝ ද හනුමන්තා ද අංජනම් දේවිය ද පැමිණ සියලු වැඩ අවැඩ කියා දෙත්. යුද්ධ, සටන්, ජයග්‍රහණ කටයුතුවලට, නඩුවලට යාමට පෙර මේ අඳුනෙන් විචාරනු.

## 52. අමනුෂ්‍යයින් වසඟ කරන දිව්‍ය රාජ අඳුන

බෙහෙත් ඖෂධ :-

ජටාමාංශ (අල වර්ගයක්), රසදිය, මනෝසිල, වේළිච්ච කහ කපුරු.

සාදන ක්‍රමය :-

ජටාමාංශත්, කහත් කලං 2 බැගින් ගෙන නැවුම් වළඳක බැද ගත යුතුයි. ඊට පසු සියල්ල කුඩු කර ගලක ලා අංජනම් එළිය බැලීමට සුදුසු ලකුණු පේන තුරු රෑ දවල් අඹරා ජීවම් කරනු.

දිව්‍යරාජ අඳුනට මතුරන වෙසමුනි ප්‍රධාන දිව්‍ය සමාගමට අයත් දිෂ්ටි මන්ත්‍රය :-

"ඕං කාර්තිමුත්ති ශ්‍රී විෂ්ණු අරවලි වා වා - වීරභද්‍ර හනුමා වා වා - පත්‍රකාලි අංජන දේවී වා වා - සිද්ධ සත් පත්තිනි වා වා - අසුර සමන් සත්කට්ටු වා වා - ඊශ්වර නාරායනේ වා වා - දේව බණ්ඩාර - කුමාර වාසල බණ්ඩාර - දේවතා බණ්ඩාර - අයියනායක බණ්ඩාර මහා දේව සමාගම සෑණෙන් දිෂ්ටි දිෂ්ටි - කතරගම ඇතුළුව 1400 ක් මහා දේව සමාගම් වර වර - දේවතාවෝ දේවතාවියෝ - සෑණෙන් දිෂ්ටි ලා වර වර - නවලක්ෂ අට සැට දහසක් යක්ෂ සේනාධිපතියන් ඇතුළුව වෙසමුනි මහා දේවරාජයා - දිෂ්ටි ලා වර වර නමඃ" ෴ 1000 වරක් මතුරනු.

පුද පූජා :-

මල්, බුලත්, කෙසෙල් ගෙඩි, තැඹිලි ගෙඩියක්, පලතුරු වර්ග 5, කැවිලි වර්ග 5, කිරිබත්.

අඳුන හෙප්පුවක ලා සුරකිව තබාගෙන එළිය බලන්නට



වුවමනා වූ විට මල්, බුලත්, පුටුවට තබා 21 වරක් ජීවම් කළ විට අංජනම පෙනේ.

මීට විෂ්ණු, හනුමන්තා, අංජනම්දේවි, පත්තිනි, සමන්, ඊශ්වර, දේවතා බණ්ඩාර, වාහල අයියනායක, කතරගම, වෙසමුනි ආදී මහා දේව සමාගමට අයත් සියලුම දෙවිවරු පැමිණෙත්. අමනුෂ්‍ය උපද්‍රව ගැනත්, පිස්සන් ගැනත්, ලෙඩ රෝග ගැනත් බැලීමට ඉතා ප්‍රත්‍යක්ෂය. අංජනමෙන්ම දෙවිවරු ලවා ආරක්ෂා කරවන්නට ද පුළුවන. එය මෙසේය.

යම් කෙනකුට අමනුෂ්‍ය උපද්‍රවයක් ඇති වී නම් අඳුන් ටිකක් ගෙන බුලතක ගා මල්, බුලත් පුටුව පිට තබා වෙසමුනි දිව්‍ය රාජයාට ආරක්ෂා කර දෙන්නට යයි අංජනම් බලන අය ආරාධනා කළ යුතුය. වෙසමුනි දිව්‍ය රාජයා අඳුන් සහිත බුලත් කොළය අතට ගෙන ආරක්ෂා කර දෙනු ඇත. ආරක්ෂා කරන ආකාරය අංජනමෙන් බලා ගත හැකිය. ඊට පසු එම අඳුන් ටික ගෙන අමනුෂ්‍ය උපද්‍රව ඇති අයගේ නළලත තිලක දූන් විට අමනුෂ්‍ය උපද්‍රව දුරු වී සනීප වේ.

යම් කෙනකුට ලෙඩ රෝගයක් තිබේ නම් කෂාය කෝප්පය මල්, බුලත් තටුව මත තබා විෂ්ණු දෙවියන්ට සෙත් කර දෙන්ට යයි ආරාධනා කළ විට එසේ කර දේ. එම කෂාය පානය කිරීමෙන් ලෙඩාට ගුණ ලැබේ. පිස්සන්ට ද එසේම ආරක්ෂා කරවන්ට පුළුවන. යක්ෂ, ප්‍රේත, පිසාචාදී සියලු අමනුෂ්‍යයෝ මේ අඳුන අත ඇති අයට වසඟව දපනේ වෙතැයි සඳහන් කරයි. මෙය විශේෂයෙන් වෛද්‍යවරුන්ට සහ යකැදුරන්ටත් සාමාන්‍යයෙන් සියලු දෙනාටත් ප්‍රයෝජනවත් මහා බලගතු අංජනමකි.

## 53. බුලතේ පොල්තෙල් ගා බලන දිව්‍ය අංජනමක්

1. "ඕං කජ්ජජ්ජා හිජහ" ෴
2. "ඕ සිවන්ද නාරායනේ අංජනම්දේවි දිෂ්ටි දිෂ්ටි වර වර නමඃ" ෴

3. ඕං පෙරුමංකාලි ශ්‍රී නාරායනේ හනුමා දිෂ්ටි දිෂ්ටි වර වර නමඃ~

පොල් ගෙඩියක්, කහ හඳුන් ලා අත්තෙල් සිඳ මල්. බුලත් පුටුව පිට තබා ඉහත ජේන මන්ත්‍ර දැහැන් තුනෙන් 216 වරක් මතුරා පහන දල්වා එයින් තෙල් ගෙන බුලතේ ගා බලනු. අංජනම පෙනේ. මෙය කුඩා වුවත් ඉතා ප්‍රත්‍යක්ෂ අංජනමකි. හනුමන්තා සහ අංජනම් දේවි පැමිණ සියලු වැඩ අවැඩ කියා දෙත්.

## 54. සෝම අංජනම

දිෂ්ටිය :-

"ඕං හ්‍රීං ශ්‍රීං ශ්‍රී ධරාජලිතාධාර ස්වාහුම් සේ සෝමා" 108 වරක් පමණි.

ජීවම් මන්ත්‍ර :-

1. "ඕං හ්‍රීං ශ්‍රීං නාගධාර හුම් සේ සෝමා"~
2. "ඕ හ්‍රීං ශ්‍රීං වේතාල රාජා හුම් සේ සෝමා"~
3. "ඕං හ්‍රීං ශ්‍රීං ඇඩිමුණ්ඩ මාලා රාජා හුම් සේ සෝමා"~
4. "ඕං හ්‍රීං ශ්‍රීං නාගසිරා හුම් සේ සෝමා"~
5. "ඕං හ්‍රීං ශ්‍රී හරණ සර්ව හුම් සේ සෝමා"~
6. "ඕං හ්‍රීං ශ්‍රී තුරඟාරූඪ හුම් සේ සෝමා"~
7. "ඕං හ්‍රීං ශ්‍රී නාග හරණ සර්ව සිද්ධි රක්ෂමා හුම් සේ සෝමා"~

108 වරක් මතුරනු.

ඕනෑම දේවතා අංජනමකට මේ මන්ත්‍රවලින් මැතුරූ විට සූනියන් දේවතාවා පෙනී සිට වැඩ අවැඩ කියයි.

මල් බුලත් පුටුව සාදා කෙසෙල් ගෙඩි 5 ක්, තැඹිලි ගෙඩියක්, උක් ගස් කැබැල්ලක්, හඳුන්කූරු 5 ක්, කපුරු පෙති 5 ක් පුදා පහනක් තබා දිෂ්ටි මන්ත්‍රයකින් අටෝ (108) රැසක් දපා ජීවම් මන්ත්‍රවලින් 108 වරක් මතුරා පහන් දැල්ලෙන් බැලූ විට එළිය පෙනෙනු ඇත.



එසේම හෙප්පුවකට කපුරු අඳුන බස්සා මල් බුලත් පුටුව මත තබා දිෂ්ටි මන්ත්‍රයෙන් 108 වරක් දිෂ්ටි කර ජීවම් මන්ත්‍රවලින් 108 වර බැගින් 7 දිනක් මතුරා ගත යුතුයි. එළිය බැලීමට වුවමනා වූ විට 7 වරක් දිෂ්ටි කර 21 වරක් ජීවම් කර මන්ත්‍ර මැතුරූ විට සූනියන් දේවතාවා පැමිණේ.

ජය පරාජය පිළිබඳ, අනාවින, සතුරු කරදර, වියවුල් බලා ගැනීමටත් මෙම අංජනම ඉතාම සුදුසුය. භක්තිය ඇතුව සූනියන් දේවතාවාට නිතර පහනක් තබන අයට මෙයින් බොහෝ ප්‍රයෝජන ලබා ගත හැකිය. එක් අතකින් අංජනමක් වන අතරම මෙය අනෙක් අතින් ජීවිතාරක්ෂක මන්ත්‍රයකි. මීට සෝම අංජනම යයි නම් කර තිබෙන්නේ සෝම නම් ඍෂිවරයකු විසින් සංග්‍රහ කරන ලද බැවිනි. අවශේෂ දෙවි දේවතාවුන් ද ගෙන්විය හැකි මහාසෝම අංජනමක් ද වේ. මේ මන්ත්‍රය සිද්ධි කර ගත් අයට පහනට මතුරා පහන් දැල්ලෙන් ද එළිය බැලිය හැකියි.

## 55. මහා සෝම අංජනම

ඖෂධ :-

සෞවීරාංජන, රසාංජන, ශ්‍රෝතාංජන, පුෂ්පාංජන, නීලාංජන, රක්තමාණික්‍යය, වජ්‍රමාණික්‍ය, ගෝමේද මාණික්‍ය, නීලමාණික්‍යය, වෛඩූර්ය මාණික්‍යය, පුෂ්පරාග මාණික්‍යය, මරකත මාණික්‍යය, මුක්තා මාණික්‍යය, කොකුම් පොතු, වැල්මී, එන්සාල්, මනෝසීල, සැවැන්න මුල්, පලොල් මුල්, දේවදාර, පළිඟු, ගජමද, බෙලි මුල්, රත්නෙළුම් මල්, කවඩි, සාම්බ්‍රානි, සක්, කොහොඹ පොතු, පුවඟු, බැවිල මුල්, ජටාමාංශ, රත්මල්, ඉරිවේරිය, නා මල්, ගෝරෝචන, කුකුරු මුවන්, පුෂ්කර, විලඳ, බුලත් දඬු, හෙළ අබ, ඇසමන් මල්, බෝලිද්ද මල්, හෙළ නෙළුම් මල්, විෂ්ණුක්‍රාන්ති මුල්, කළුතල, ලොත් සුඹුලු, කලාඳුරු අල, සතකුප්ප, සූදුරු, මාදුරු, සුදුහඳුන්, රත් හඳුන්, දෙළුම් මල්, රසකිඳ පිටි, ගොධුම (තිරිඟු), රත්තරන් කුඩු, තඹ කුඩු, රිදී කුඩු, පිත්තල කුඩු, ලෝකඩ කුඩු, යකඩ කුඩු, කළු ඊයම් කුඩු, සුදු ඊයම් කුඩු, කසිස් මිනිරන්, සාදිලිංගම්, ශිලාජතු, සිවන්ගුරු,

කනේරු මල්, රසදිය, ගෙන්දගම්, රත්හිරියල්, රිදීතුත්තං, අමු කපුරු, මයුරතුගු, රිදී පාට දිය රත්තරන් (රිදී මැසිඳැ), කාන්දම් කුඩු, කුඹුක් මුල්, ඉඟිනි ඇට මද, රණවරා මුල්, එළවරා මුල්, එළ බින්තඹුරු මුල්, කිරිගරුඬ කුඩු, තිත්ත ලබු ඇට, වැටකොළු ඇට, පෙනෙල මුල්, කපු ඇට මද, පොල්පලා මුල්, රන්මැසිඳැ (රත්තරන් පාට දිය රත්තරන්), වෙනිවැල්ගැට, සැවැන්දරා මුල්, සීන මුල්, අමුක්කරා මුල්, ඉරමුසු මුල්, හාතවාරිය අල, ගොකටු මුල්, හිඹුටු මුල්, දෙහි මුල් සහ ඇට, දොඩම් මුල් සහ ඇට, නාරන් මුල් සහ ඇට, පිනිජම්බු මුල් සහ ඇට, යකිනාරන් මුල්, පඹුරු මුල්, වැල් කහඹිලියා මුල්, හිඟුරුපියලි, මුගුණුවැන්න මුල්, පැපිලිය මුල්, ඇහැළ මුල්, දුම්මැල්ල මුල්, ආඩතෝඩ මුල්, මුඩ මහණ මුල්, කටුපිල මුල්, අනෝද මුල්, අතිවිඩයන්, බෝ ඇට, කෙළිඳ හාල්, සාරණ මුල්, අසමෝදගම්, තුන්බෝ අත්තන මුල්, මානෙල් මල්, රත්නෙටොල් මුල්, මයිල මුල් සහ මල්. මදුරුතලා මුල්, කරල් හැබ මුල්, අසෝක, බින්තල් අල, මාදම් පොතු, රුක්අත්තන මුල්, කංසා මුල්, කුංකුමප්පු, ගිනිහිරියා මල්, දුම්මල, වියළි කහ, අගිල්, සුවඳ කොට්ටන්, මකුලු, කීකිරිඳිය මුල්, වැටකේ අරළු සහ මල්, සූරියකාන්ත මල් සහ මුල්, මදාරා ඇට, යක්වනස්ස ඇට, කපුකිනිස්ස ඇට, යක්බේරිය මුල්, අඩනහිරියා මුල්, හීන්මැඩියා කොළ, හීන් බෝවිටියා මුල්, සපු මල්, සස්සඳ මුල්, බටකිරිල්ලා කොළ, ජවාදු, ඉඹුල් මැලියන්, දලුක් ලාටු, දිඹුල් මුල්, අරලිය මල්, ඕලු මල්, ඉද්ද මල්, වතුසුද්ද මල්, අඹ මුල්, අරළු, බුළු, නෙල්ලි, රමනිස්ස මුල්, සමදරා මුල්, කැප්පෙට්ටියා ලාකඩ, පුවක් මල් ඇට, රත් තැඹිලි මල් ඇට, කාමරංගා මුල්, දිවිකඳුරු ඇට, තලිස් මුල්, මදුරුතලා මුල්, තල් ඇට, කිතුල් ඇට, කතුරු මුරුංගා මුල්, මුරුංගා මුල්, දොඹ ඇට, කළුදුරු, තොලබෝ මුල්, හීරැස්සපලු, වී කරල්, වඳුරු මෑ ඇට, ගොඩකදුරු ඇට, නුග මුල්, බුජ පත්‍ර, මොනරකුඩුම්බිය මුල් සහ මල්, දුටු සතුටු මුල්

සාදන ක්‍රමය :-

මෙම ඔසු සම සමව ගෙන මුල්, ඇට වර්ග කබලෙන්



බැද සම බරට කිරා ගත යුතුය. දෙවනුව ඉහත කී බෙහෙත් සියල්ල වංගෙඩියක ලා කොටා පෙනේරයකින් හෝ කම්බි ලේන්සුවකින් හලා එම පිටි සිකුරාදා ගිතෙලින් ද, සෙනසුරාදා දුම්මල තෙලින් ද, ඉරිදා අබ තෙලින් ද, සඳුදා සඳුන් තෙලින් ද, අඟහරුවාදා තල තෙලින් ද, බදාදා මී තෙලින් ද, බ්‍රහස්පතින්දා එරඬු තෙලින් ද, අඹරා ගත යුතුය. මෙය සිකුරාදා දිනක සුබ මුහුර්තියෙන් ආරම්භ කරනු.

පංච මහා භූතයින්ට හිමි පංචදේවතාවෝ මේ අංජනමට අධිපති වෙති. එසේ ද වුවත් තමන්ට කැමති දෙවි දේවතා කෙනෙක් ඔවුන්ගේ අනු දැනුම ඇතිව එළියට පමුණුවා ගත යුතුය. ඉහත කී පංච දේවතාවුන්ගෙන් "සේ සෝමා" නමැති දේවතාවා ප්‍රධානය.

අඳුන ජීවම් කිරීමට ගත යුතු පුද :-

බුලත් විටි 5, පස්තෙල් පහන් 5, තැඹිලි ගෙඩි 5, කෙසෙල් ඇවරි 5, පස් පාටින් මල් වර්ග 5, කැවිලි වර්ග 5, පලතුරු වර්ග 5, පංච වර්ණ බත් ගුළි 5, පුවක් මලයි, කපුරු, පිනි දිය, හඳුන්කූරු, උක් ගස් කැල්ලයි.

එළිය බලන්නට වුවමනා විට තැබිය යුතු පුද :-

බුලත් 5, පස් පාට මල් වර්ග 5, උක් ගස් කැල්ලයි, කපුරු පෙති 5, හඳුන්කූරු 5, තැඹිලි ගෙඩියයි, කෙසෙල් ගෙඩි 5 ක ඇවරියයි.

විශේෂ මල් ආසනයක් අවශ්‍යයි. කිසිවකු වාඩි නොවූ පුටුවකින් හෝ කෝටු නැතහොත් ලී පතුරු දොළහකින් කුඩා මල් යහනක් මෙන් සාදා ගැනීම සුදුසුය.

නියමිත ලෙස පුද තබා පළමුව කහ දිය කොතලයක් ගෙන මේ මන්ත්‍ර දැහැනින් මතුරා මල් අස්නටත්, ගෙටත් ඉස විධි ලෙස ජපාරම්භ කළ යුතුයි.

කහ දිය මැතිරීමට :-

1. "ඕම් - සොවුමා - පොවුරි - නොවුහා - නම් - ස්වඃ - හුම්

- සේ සෝමා"෴ මෙය 7 වරක් මතුරන්න.

තටුව පේ කරන මන්ත්‍රය :-

2. "ඕම් - සෙස් සොවුමරා - පොවුරිසිං - නොවුහා - නම් - ස්වා - හුම් සේ සෝමා"෴ මෙය 7 වරක් මතුරන්න.

කපුරු දල්වන මන්ත්‍රය :-

3. "ඕම් සේ සොවුරා - පොස්සිං - නොවුහා - නාහුම් සේ සෝමා"෴ මෙය 7 වරක් මතුරන්න.

කට්ටකුමංජල් දුම් දෙන මන්ත්‍රය :-

4. "ඕම් - හනොබුම් - සිනොවුහාරා - පොවුරි - රිසේ සෝමා හුම්"෴ මෙය 7 වරක් මතුරන්න. දුම් අල්ලා ජීවම පටන් ගන්න.

ජීවම් මන්ත්‍ර :-

5. "ඕම් - සේ සෝමා"

6. "ඕම් - ශ්‍රීවරිදි - හස්වින් - සේයාර් - කිවුමක්කිරා - තිරන් -ලහ්මා අස්සිං - සේසත්යාදි - හල්ලාඩා - මාපාකාම් - ගේයා යාහක් - ස්වාහුම් සේ සෝමා"෴

7. "ඕම් - හනොවු - මිසිං - නොවුහාරා - පොවුරි - සස්සොවුමාරා පොවුරි - සිං - නොවුහා - හනොවුම් - සෙස්සොවුරා - පොස්සිං නොවුහා - නාහස්සිං - රාහා - අස්සෙර් රාහා - අන්නා අන් ඕ - පොස්සොවු - පොඩන් - නොන්නා අවු - ඊහා - ආරිම් - අස්සෙව් - ඊහුම් - සේ සෝමා"෴

8. ඕම්ව - අස්සෙව් - මුහරචින්දි - ඉරාදික්කිවුල් - ඊනික්කා - සිංලි - ඉලායායරිය - ගෙස්වයා - අලිව් - ඉසලා - අවුක්කිරහා - අග්ගෙල් - ඉද්දම් - ඌහා - අස්සිං - රා අසෙර් - ඉක්කාදි - ඉයන් - ඉන්වා - අම්සා - අශ්ගෙහා - අරියා - අයලා - අලිසිංකා - ආං - ඊලික්කිවුරා - දින්වි - ඉහරමුස්සෙවු - අවුවාදිසිංගේ - ඒල් අලි - ස්වාහුම් - සේ සෝමා."෴ අඳුනට 1080 වරක් දිනකට 108 වර බැගින්



දින 10 ක් මතුරනු. එළිය බලන විට 21 වරයි.

9. "ඕම් - සොවුමාරා - රිසිං - නොවුහා - හම්ස්වාඃ - හුම් සේ සෝමා."෴7 වරක් මතුරන්න. ජීවම් මන්ත්‍ර 108 වරක් මැතුරුවාට පසු මෙයින් මතුරා දෙවිවරුනට මල් තටුව කැප කරනු.

කළුවර වුණොත් එළිය කරන්නට මතුරන මන්ත්‍රය

"ඕම් - හනොවුම් - සිංනොවුහාරා - පොවුරි - සෙස් සොවුම් මාරා පොවුරි - සිංනොවුහා - හනොවුම් - ස්වාඃ - හුම් සේ සෝමාඃ"෴ තෙල් පහනට මලක් හෝ බුලත් කැබැල්ලක් තබා 7 වරක් මතුරනු. දමනු. එළිය වේ.

එයටම තවත් මන්ත්‍රයක්

"ඕම් - පුලෙයි - ලුහුම් - ස්වා - හුම් - සේ සෝවාඃ"෴ 7 වරක් කපුරු මතුරා දල්වනු. අඳුර දුරු වේ. එළිය විශාල වීමට පළමු හෝ දෙවෙනි හෝ මන්ත්‍රයෙන් මතුරන්න.

**සෝම අංජනම බැලීමේ දී පහනටත්, තිරය ඇඹරීමටත්, වාඩි වීමටත් ජප කරන මන්ත්‍ර දැහැන් තුනක්.**

1. "ඕම් සා හික්සුම් සේ සෝමාඃ"෴ පත්තු කරන පහනට 7 වරක් මතුරනු.
2. "ඕං සේ සෝමා හුම් හුම් ස්වාහාඃ"෴ පාත් තිරේ අඹරන විට 7 වරක් මතුරනු.
3. "ඕං ටං ටං රුද්‍රග සේ සෝමා ස්වාහාඃ"෴ වාඩි වන විට 7 වරක් මතුරනු.

(මේ මන්ත්‍ර තුන මැතිරිය යුත්තේ සෝම අංජනමට පමණි.)

සෝම අංජනම එළිය පිටත් කිරීමට සෝම අංජනමේ අංක 5, 6, 7, 8 දරන ජීවම් මන්ත්‍රවලින් මතුරා දුම් ඇල්ලීමෙන් පංච දේවතාවුන්ගෙන් ඉක්මනින් වැඩ ගත හැකිය. මෙම අංජනමට අධිපති දේවතාවෝ සිතන කියන වැඩ කඩිසරව කරති. ශ්‍රේෂ්ඨ අංජනමක් වූ මෙය කිසිම දිනක බොරු නොකියයි. සමහර විට කිලි කුණු නිසා අංජනම් එළිය නොපෙනී

යාමට ඉඩ ඇතත් සෝම අංජනමේ එළිය වැටී යමක් කිවොත් තුන් කාලයටම නිවැරදිය. අතීත, වර්තමාන, අනාගත තුන් කාලයම අංජනමට පෙනේ.

සේ සෝම නම් දේවතාවා ප්‍රධාන මෙම අංජනම සිද්ධි කර ගනු. මෙහි සඳහන් සමහර ඖෂධ වර්ග අද යුගයේ ඉතාම අමාරුවෙන් සොයාගත යුතුව ඇත. පංච දේවතාවුන් ලවා රෝගීන්ට කෂාය නියම කිරීමටත්, අමනුෂ්‍ය දෝෂවලට තෙල් මැතිරීමටත් මේ අංජනම අත්දුටුවකි. මිත් අඳුන් ටිකක් බුලත් කොළයකට ගෙන මල් අස්නේ තබා එළියක් බලවන අතර පංච දේවතාවුන් ලවා මතුරවා රෝගීන්ට පිස්සන්ට තිලක තබනු. අඳුන දේවතාවුන් ලවා මතුරවා සූරයක ලා ගෙල බඳිනු. සියලුම දේව ආරක්ෂාව ලබා දෙනු ඇත.

## 56. රාත්‍රී වතුර වීදුරුවෙන් බලන සෝම අංජනම

පාවිච්චි නොකළ කැටයම් වැඩ නැති චාම් වීදුරුවක් ගෙන ඊට හත් වරක් පෙරූ පිරිසිදු වතුර පුරවා සුදු මල් තුනක් දමා බුලත් කොළයකින් වසනු. සුදු පිරුවට එළූ මේසයක් පිට එම වීදුරුව තබනු. වීදුරුව වටේ පස් පාට මල් පුදනු. මේසය ළඟ පුටුවක් තබා වාඩි වී වීදුරුව ඉදිරිපිට පහනක් පත්තු කර අංක 6 දරන සෝම මන්ත්‍රයෙන් කට්ටකුමංජල් දුම් දෙමින් 108 වරක් මතුරනු. අංක 3 දරන සෝම මන්ත්‍රයෙන් කපුරු දල්වනු. අංජනම පෙනේ. පංච දේවතාවෝ පැමිණ සියලු වැඩ අවැඩ කියා දෙත්. සෝම මන්ත්‍රවලට අයත් එකම මන්ත්‍ර දැහැනකින් වතුර වීදුරුවකට මතුරා මෙසේ එළිය බැලිය හැකි නම් ඊට ඖෂධ බලයක් එක් කොට සියලුම මන්ත්‍රවලින් මැතුරුවොත් ඉන් කළ හැකි හාස්කම් අපමණය.

ඉහත කියන ලද්දේ රාත්‍රී කාලයට වතුර වීදුරුවෙන් එළිය බලන ක්‍රමයකි. දවල් කාලයේ වතුර වීදුරුවෙන් එළිය බලන සූර්ය අංජනම් ක්‍රමය ද මෙහි පළ වනු ඇත.



## 57. සූර්යය සෝම අංජනම

### වතුර වීදුරුවෙන් දහවල් කාලයේ අංජනම් එළි බැලීම

දහවල හිරුගේ ආලෝකය වැටෙන ස්ථානයක එළිමහනේ මේසයක් තබා ඒ පිට සුදු ඇතිරිල්ලක් එළනු. මේසය පසකින් බුලත් කොළ පහ බැගින් ගොඩවල් පහක් ගෙන පස් පැත්තට නැටි විහිදුවා තබනු. එම බුලත් ගොඩවල් පහ පිට, තෙල් පෙඟවූ පහන් තිර පහක් පත්තු කර තබා මැද පහනක් තබනු. පෙරා ගත් වතුර වීදුරුවක් ඊට නුදුරින් තබා අංක 6 දරන සෝම මන්ත්‍රයෙන් කට්ටකුමංජල් දුම් අල්ලමින් 108 වරක් මතුරා වතුර වීදුරුව තුළ බලනු. ඊට වැටෙන හිරුගේ ආලෝකයෙන් අංජනම පෙනේ.

වතුර වීදුරුවෙන් එළිය බැලීමේ දී අංක 6 දරන සෝම මන්ත්‍රයෙන් පමණක් මැතිරීමට අතීත පරපුර ක්‍රියා කර ඇත. අංක 6 න් ලද අත්දැකීම තුළින් පසුව අංක 5, 6, 7, 8 යන සෝම මන්ත්‍ර හතරෙන්ම මතුරා දෙවි දේවතාවුන්ගෙන් වැඩ අරගෙන ඇත.

අංක 5, 6, 7, 8 යන මන්ත්‍ර එකට මතුරන විට 108 වරක් මැතිරීම අනවශ්‍යය. 40 වාරයක් පමණ ජප වූ පමණින් එළිය පෙනෙන්නට පටන් ගත් බව පැරණි ග්‍රන්ථයක සඳහන් වේ. ඊට හේතු වශයෙන් පෙන්වා ඇත්තේ සෝම මන්ත්‍ර සිද්ධිය විය හැකිය. එහෙත් අලුතෙන් අංජනම් එළි බැලීමට යන අය 108 වරක් මැතිරීම සුදුසුය.

## 58. කුඩා සෝම රාජ අංජනම් සර්වාරක්ෂක හා සර්වජන වශීයක්

සෝම මහා අංජනම සාදා ගත නොහැකි අය පහත දැක්වෙන කුඩා සෝමරාජ අංජනම්වලින් එකක් පිළියෙල කර ගැනීමෙන් ප්‍රතිඵල ලද හැකිය.

ඖෂධ :-

ඉරරාජ කොළ, සඳරාජ කොළ, වනරාජ කොළ, ගරුඩරාජ

කොළ, කුඩා හැඩය කොළ, මහ හැඩය කොළ, අංජන කැට, රත්හිරියල්, ඉද්ද මුල්, සමන්පිච්ච මල්, කංසා කොළ, අබිං, තුන්බෝ අත්තන ඇට, සිරිවැඩි බැබිල මුල්, එළ ඔලිඳ මුල්, නෙළුම් මල්, ඕලු මල්, මානෙල් මල්

මල්, මුල් , කොළ වර්ග වේළා අනෙක් බෙහෙත් සමග පන්දම ඔතා හෙප්පුවක දුහුදු තෙල් ගා අංජනම බස්සවා ගෙන අංක 5, 6, 7, 8 දරන සෝම මහා අංජනමේ මන්ත්‍රවලින් ජාම තුනක් 108 වර  බැගින් මතුරා සූරකිව තබා ගත යුතුයි.

පුද පූජා :-

පස් පාට මල් වර්ග 5, බුලත් 5, පහන් 1, කෙසෙල් ගෙඩි 5, උක් ගස් කැල්ලයි, කපුරු පෙති 5, හඳුන්කුරු 5, තැඹිලි ගෙඩි 1.

අංජනම කිරීමටත්, එළිය බැලීමටත් මේ පුද සාධාරණය. එළිය  බැලීමට 48 වරක් මතුරනු. මේ අඳුන ශ්‍රියාවට, සර්වාරක්ෂාවට, සර්වජන වශියට, නළලට තිලක තබනු. නඩුවල දී යුක්තිය දිනනු ඇත.

## 59. තවත් කුඩා සෝම අංජනමක්

ඖෂධ :-

සෞවීරාංජන, රසාංජන, ශ්‍රොතාංජන, පුෂ්පාංජන, නිලාංජන

මෙම පංචාංජන කුඩු කර පස් තෙලින් අඹරා එම ගල ලිප් ගල් දෙකක් පිට යට අතට හරවා තබා, ලිපේ කපුරු පත්තු කොට දමමින් ඊට දුම් ගස්සවා නැවත ගල උඩ පැත්තට හරවා අඹරා පිරිසියට දමා (පෙර කල හෙප්පුවකට දැමිය යුතු යයි අංජනම්වල සඳහන් වේ.  අතීතයේ විශේෂ හෙප්පු වර්ගයක් සාදාගෙන තිබෙන්නට ඇත. වර්තමානයේ පිරිසියේ යටි පැත්තේ කුඩා රවුම පාවිච්චියට ගනියි. අඳුන ප්‍රමාණයට වඩා අඹරා ගන්නේ නම් ආරක්ෂිතව තබා ගත යුතුයි.) අඳුන මල් බුලත් පුටුවක් පිට තබා අංක 5, 6,7, 8 දරන සෝමමහා අංජනමේ මන්ත්‍රවලින් 108 වර බැගින් ජාම තුනක් මතුරා සූරකිව තබාගත යුතුයි. එළියක් බලන්නට වුවමනා වූ විට 21 වරක් මතුරනු.



අංජනම පෙනේ.

ඉහත සඳහන් බෙහෙත් පහසුවෙන් ලබා ගත හැකිය. සිංහල ඔසු සැල්වලින් හෝ රස සින්දූරම් බෙහෙත් සාදන වෛද්‍ය වරයකුගෙන් ලබා ගත හැකිය.

සෞවීරාංජන දම් පාටය. රසාංජන කහ පාටය. ශ්‍රොතාංජන හිම පාටය. පුෂ්පාංජන සුදු පාටය. නිලාංජන නිල් පාටය. පුද පූජා කුඩා සෝම රාජ අංජනමට කී අයුරුමය.

## 60. තවත් කුඩා සෝම රාජ අංජනමක්

ඖෂධ :-

යක්ගැට, වලස් පහුරු, දිවි පහුරු, හෙන අඟුරු, කළු අල, සුවඳ හොට, සුවඳ කොට්ටන්, අමු කපුරු, ජටාමාංශ, ඉරිවේරිය මුල්, සුදුහඳුන්, කුංකුමප්පු, රසදිය, සාදිලිංගම්, ශිලාජතු, සිවංගුරු, පල්මාණික්කම්, ගෙන්දගම්, කරපිංචා මුල්, කළු අත්තන මුල්, බෝ මුල්, නා මුල්, නුග මුල්, ගලිස් මුල්, දේවදාර, බෙලි මුල්, කොළොන් මුල්, කස්තුරි, ගෝරෝචන, දුටු සතුටු මුල්, කැබෙල්ල මුල්, කිරිඅඟුණ මුල්, හිඹුටු මුල්, කුඹුක් මුල්.

මෙහි මුල් ගෙන කබලෙන් බැද අනෙක් බෙහෙත් සමග පන්දම ඔතා තල තෙලෙන් පොඟවා ගිනි දල්වා දුම්මල තෙල් ගෑ භාජනයක් අල්ලනු. අඳුන් බසී. එම අඳුන් හෙප්පුවකට ගෙන මල් බුලත් තටුවක තබා සෝම මහා අංජනමේ අංක 5, 6, 7, 8 දරන මන්ත්‍රවලින් අටෝරැස බැගින් (108) ජාම තුනක් මතුරා සූරකිව තබා ගත යුතුයි. එළිය බලන්නට වුවමනා විට එකී මන්ත්‍රවලින් 21 වරක් මතුරා බලනු. අංජනම පෙනේ. මේ අංජනම ද ශාන්ති කර්මවලට, ආරක්ෂාවලට, සූරවලට දමා ගෙල පැලඳීමට සහ යක්දොස් ඇති අයට තිලක දීමට යහපති. සර්වාරක්ෂක අංජනමට කියූ පුද පූජා තබන්න.

## 61. තවත් කුඩා සෝම අංජනමක්

ඖෂධ :-

පිටවක්කා මුල්, ලුණුවරණ මුල්, ඉද්ද මුල්, ගෙන්දගම්,

මිනිරන්, හිරියල්, මනෝසිල, රිදී තුත්තම්, මයුරතුඟු, අංජන කැට, කවඩි, සක්නැබ, ගල්සෙවෙල්, ලප්නාරන් මුල් හෝ යකිනාරන් මුල්, දිඹුල් මුල්, කොකුම් පොතු, කස්තුරි මංජල්, අමු කපුරු, රත්නිටුල් මුල්, කුප්පමේනිය මුල්

මුල් වර්ග සමව ගෙන කබලෙන් බැද අනෙක් බෙහෙත් සමග සම බරටම ගෙන කුඩු කර රෙදි කඩක ලා දෙකට නවා පන්දම් ඔතා එරඬු තෙලෙන් පොඟවා ගිනි අවුළා දුම්මල තෙල් ගෑ බඳුනකට දුම් අල්ලනු. අඳුන බසී. එය මල් බුලත් තටුවක තබා පංචෝපචාරයෙන් 108 වර බැගින් තුන් ජාමයක් මතුරා හෙප්පුවක ලා සුරැකිව තබා ගනු. එළිය බැලීමට වුවමනා වූ විට 21 වරක් ජප කළ යුතුයි. (සර්වාරක්ෂක) කුඩා සෝම රාජ අංජනමේ නියම කළ පරිදි පුද තබනු. පාතාලය බැලීමට මෙම අඳුන විශේෂයි.

## 62. අංජනම් එළියට පෙනී සිටින පංච දේවතාවෝ

| | | |
|---|---|---|
| 1. සේ සෝමා | - සුදු පාට | සිංහ වාහන |
| 2. සෙරසි | - රතු පාට | ඇත් වාහන |
| 3. අස්සිං | - පච්ච පාට | මුව වාහන |
| 4. ගතානොවුසි | - නිල් පාට | නාග වාහන |
| 5. සෙව්රාජසි | - කහ පාට | ගුරුළු වාහන |

*පංච දේවතාවුන්ගේ අධිපතිකම් සහ ඔවුන්ගේ සිංහල නම්*

අංජනම් දේවි

මයුර පක්ෂි
ඔකාරස්වර
මුව වාහන
ආකාශ භූත
නිල් පාට
- ආකාශයට හිමි දේවතාවි



හනුමා

කාක පක්ෂි
උකාරස්වර
නාග වාහන
වායුභූත
පච්ච පාට
- වායුවට හිමි දේවතාවා

රාමා

හෙරුණ්ඩ පක්ෂි
අකාරස්වර
ගුරුළු වාහන
ජලභූත
සුදු පාට
- ජලයට හිමි දේවතාවා

කතරගම

පිංගල පක්ෂි
ඉකාරස්වර
සිංහ වාහන
අග්නිභූත
රතු පාට
- ගින්දරට හිමි දේවතාවා

කාලි

කුක්කුට පක්ෂි
එකාර ස්වර
ඇත් වාහන
පඨවිභූත (පාතාල)
කළු පාට
- පොළොවට හිමි දේවතාවා

මෙම පංච දේවතාවුන් ගැන ඔබට අවබෝධයක් ඇත. පංච දේවතාවුන් අංජනම් එළියට අමුත්තන් නොවේ. අංජනම් දේවිත්, හනුමන්තාත්, රාමාත්, ස්කන්ද කුමාරයා සහ කාලිත් දේවත්වයට පත් වීමට පෙර මනුෂ්‍ය ආත්ම ලබා සිටියෝය. ඔවුහු ඔවුන්ගේ ගති ගුණ අනුව පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ යන පංච භූතයින්ට අධිපතිව ඉපදී සිටිති. අප වෙනුවෙන්

අංජනම් කියා දීමෙන් පංච දේවතාවුන් කරන මහඟු සේවය වෙනුවෙන් අප ඔවුන්ට කෘතඥ විය යුතුව ඇත.

අංජනම්වලට පෙනී සිටින ජින්නු දේවතාවා

අංජනම්වලට නියමිත ගණනට වඩා ජප කිරීමට නුසුදුසුය. එය සමහර විට නරකට සිටීමට හැකියාව ඇත. ගිනි අඟුරු කබලට කට්ටකුමංජල් දමමින් සෝම මන්ත්‍රය නියමිත ගණන ඉක්මවා ජප කරන්නේ නම් පංච දේවතාවුන් අන්තර්ධාන වී “ජින්නු” නමින් මහා දේවතාවෙක් පෙනී සිටී. ඔහුගේ සිරුරෙන් නික්මෙන තේජෝ රශ්මි මාලාව ඉතා සැරය. එනිසා ඔහුගේ පැමිණීමෙන් පසු විනාඩි 10 කට වඩා එළිය බලන්නට නොහැකිය. ඔහුගේ තද රශ්මිය ඇස්වලට අගුණය.

## 63. දේවතා පිරිසක් එකවර පමුණුවන මහා සෝම රාජ අංජනම

ඖෂධ :-

උන කපුරු (උණ ගහේ සෑදෙන කපුරු), අමු කපුරු (අමු ගස්වල සෑදෙන කපුරු), කණාමැදිරි හතු, රුක් අඟුණ මුල්, නඟා මැරූ අල, තඹ කුඩු, තුත්තනාගම් කුඩු, කළු ඊයම් කුඩු, සුදු ඊයම් කුඩු, කාන්තපාසාන, කිරිගරුඬ, අංජන කැට, සාම්බ්‍රානි, කැප්පෙටියා ලාකඩ, සක් කුඩු (පිඹින සක් ගෙඩියක කුඩු), තිප්පිලි, රසදිය, කරවිල ඇට, ජාපාල මුල්, නියඟලා අල, කිඩාරම් අල, නික මුල්, හොර අරටු, කලාඳුරු අල, ගොරක මැලියම්, ඉඹුල් මැලියම්, ඉරිවේරිය මුල්, කප්පරවල්ලිය මුල්, ඉඟිනි ඇට, කරල් සැබෝ ඇට, දෙහි ඇට, මොනර ඇට, තෝර ඇට, ගල්මද, සුද්ධාෂ්ටක, බෝදි ඇට, ගල්නහර, මී ඉටි, සුදු පාසානන්, නාග පාසානන්, එළබිංතඹුරු මුල්, මයුර පාසානන්, ගරුඬ පාසානන්, සිවන්ද පාසානන්, කුඩුමිරිස්ස මුල්, කිරිබඳු අල, දලුක් ලාටු

මෙම ඔසු සම ප්‍රමාණ ගෙන කබලෙන් බැද පිරිසිදු ගලක ලා දුම්මල තෙලෙන් අඹරනු.

දුම්මල, කවඩි, සාම්බ්‍රානි, කපුරු, එරඬු ඇට, මී ඇට, කපු



ඇට, සාදිලිංගම්, මනෝසීල, හිරියල්, ඇත්ත, කළු අගිල්, දේවදාර, නෙළුම් මල් රේණු, නා මල් රේණු, වදකහ, හිඟුරුපියලි, සැවැන්දරා, සුදු හඳුන්, රත් හඳුන්, එරමුදු නැටි, කරපිංචා නැටි, කරාබු නැටි, වසාවාසි, එන්සාල්, කුරුඳුපොතු, අමුක්කරා, මුඩ මහණ, තනිවැල්ල, පෙරුමාල, කංසා මුල්, කටුපිල, අමුකහ, හරන්කහ, රුක්මල්, පල්මාණික්කම්.

මෙකී ඖෂධ ගෙන පන්දම ඔතා පස් තෙලෙන් පොගවා ඉන් පසු අඳුන් සහිත ගල ලිප් ගල් දෙකක් පිට අඳුන යටිකුරුව හිටින්නට තබා බෙහෙත් පන්දම දල්වා එම ගලට දුම් අල්ලනු. දුම් අල්ලා අවසන් වූ හැටියේ ජීවම් මන්ත්‍ර 108 වරක් කියමින් යළිත් ඖෂධ අඹරනු.

ඉහත සඳහන් අංජනමට නියමිත ජීවම් මන්ත්‍ර

1. “ඕම් ගාරිහුම් සේ සෝමා”෴
2. “ඕම් සුරිහුම් සේ සෝමා”෴
3. “ඕම් ස්වාරිහුම් සේ සෝමා”෴
4. “ඕම් ස්වයි හුම් සේ සෝමා”෴
5. “ඕම් ස්වඃ හුම් සේ සෝමා”෴
6. “ඕම් තෙ සයිරි හුම් සේ සෝමා”෴
7. “ඕම් තයි වයිරි හුම් සේ සෝමා”෴
8. “ඕම් සයි වයිරි හුම් සේ සෝමා”෴
9. “ඕම් සෛවරි හුම් සේ සෝමා”෴
10. “ඕම් කිලවුඩි හුම් සේ සෝමා”෴
11. “ඕම් තාලා කි හුම් සේ සෝමා”෴
12. “ඕම් වොරි හුම් සේ සෝමා”෴
13. “ඕම් ත්වාලි හුම් සේ සෝමා”෴
14. “ඕම් සෛතලි හුම් සේ සෝමා”෴
15. “ඕම් තෛවලී හුම් සේ සෝමා”෴
16. “ඕම් සෛලරි හුම් සේ සෝමා”෴

17. "ඕම් ස්තාක්කි හුම් සේ සෝමා"~

18. "ඕම් ස්මාහී හුම් සේ සෝමා"~

19. "ඕම් ඊසාබි හුම් සේ සෝමා"~

20. "ඕම් දදුක්කුරහුම් සේ සෝමා"~

21. "ඕම් ත්‍රඩිහුම් සේ සෝමා"~

22. "ඕම් ජාලී හුම් සේ සෝමා"~

23. "ඕම් සාලාහි හුම් සේ සෝමා"~

24. "ඕම් ස්ථාහුම් සේ සෝමා"~

මින් අඳුනට 108 වරක් මතුරමින් අඹරාගෙන හෙප්පුවක ලා මල් බුලත් පුටුවක් පිට පහත සඳහන් පුද සමග තබා පංචෝපචාර සහිතව 108 වර බැගින් ජාම තුනක් මතුරා සුරැකිව තබා ගනු.

පුද පූජා :-

බුලත් 24, මල් වර්ග 24, පලතුරු 24, කැවිලි 24, කෙසෙල් ගෙඩි 24, දෙහි ගෙඩි 24, කපුරු පෙති 24, හඳුන්කූරු 24, කිරිබත් ගුළි 24, පොත්ත හැර දෙපළු කළ කඩල, වී පොරි, තැඹිලි ගෙඩි 1, පහන් 1, කට්ටකුමංජල්, කිරි, බිත්තර.

එළියක් බලන්නට වුවමනා වූ විට බුලත් කොළ 5 ක්, කෙසෙල් ගෙඩි 5 ක්, මල් 24 වර්ගයක්, පලතුරු 5 ක්, පහනක්, තැඹිලි ගෙඩියක් පුද තබා 21 වරක් මතුරනු. එළි 24 ක් පෙනේ. ඒ එළි එකට එක්වීමට සිතනු. එක් වේ. ඉන්පසු මෙම එළියට අරක් ගත් දේවතාවුන්ට පැමිණෙන්නට ආරාධනා කරනු. දේවතාවෝ 24 ක් පැමිණෙත්. මේ අවස්ථාවේ එළිය කියා දීමට සූදානම් කවුදැයි අසා ඔහුට නතර වෙන්නට සිතා, අනෙක් දේවතාවුන්ගෙන් පුද කැපගෙන යන ලෙස ඉල්ලා සිටිනු. ඔවුන් ගිය පසු නැවතුණ දේවතාවාගෙන් අවශ්‍ය කරුණක් ඇසුවාම පවසනු ඇත. විදේශීය රටකට වුව ද යවා අවශ්‍ය කරුණු දැන ගත හැකිය. පොළොව යට සියලු වස්තු බලාගත හැකිය. දේවතාවා ලවා මතුරවා රෝග සුව කර ගත හැකිය.



## 64. ශ්‍රී කාන්තා සෝම අංජනම

ඖෂධ :-

සිරිවැඩි බැවිල මුල්, සිරිතේක්කු, නෙළුම් මල් රේණු, ඇත් දළ, සක් කුඩු, බෙලි මල්, සමන් පිච්ච මල් කැකුළු, රන් තැඹිලි මුල්, මුතු, සුදු අරලිය මල්, සේපාලිකා මල්, කුංකුමප්පු, පිටසුදු සාරණ මුල්, මල් සුදු තුඹ මුල්, එළ කටරොලු මල්, එළ රත් මල්, මී නාම්බර, පොන්නම්බර, සුවඳ කොට්ටන්, කළු අගිල්, කස්තුරි, කපුරු, ජවාදු, තුවරලා, සැවැන්දරා, රත්හඳුන්, සාම්බ්‍රානි, කපුකිනිස්ස ඇට, ඉරිවේරිය

සාදන ක්‍රමය :-

මෙම ඖෂධ විධි ලෙස ගෙන සම බරට කිරා අමුද්‍රව්‍ය වේළීම පිණිස සතියක් පවනේ තබා පිරිසිදු ඇඹරුම් ගලක් පිට දමා සඳුන් තෙල් ලා ගිනි දල්වනු. අඟුරු වූ පසු ශ්‍රීකාන්තා ජීවම 108 වර බැගින් ජප කරමින් ජාම තුනක් අඹරා හෙප්පුවකට ගෙන මල් බුලත් පුටුවක් මත තබා පහත සඳහන් පුද ඇතිව 108 වරක් නැවතත් මතුරා සුරැකිව තබා ගනු. එළිය බැලීමට වුවමනා වූ විට 21 වරක් මතුරනු.

ශ්‍රී කාන්තා සෝම ජීවම

"ඕම් ශ්‍රී අදරසන්ති කමලාසනාය නමඃ අන්ත යෝග පිහිත් වනේ කූර්ම රූපාය බිග්නවේ හුම් සේ සෝමා."~

"ඕම් ශ්‍රී ශ්‍රීයාකාන්තාවී දිෂ්ටි දිෂ්ටි වර වර ඒස්වාහාඃ"~

මීට ශ්‍රියාකාන්තාව හෙවත් ලක්ෂ්මී පැමිණ වැඩ අවැඩ කියා දෙයි.

පුද පූජා :-

නෙළුම් මල්, සමන් පිච්ච මල්, කිරිබත්, තැඹිලි පොල් මලක් ඇමූ කළයක්, බුලත්, කෙසෙල් ගෙඩි, රන්තැඹිලි ගෙඩියක්.

## 65. සිරිදේවි අංජනමට ගෙන්වා මූදේවි පලවා හැරීම

මූදේවි බන්ධන කොට සොහොන් අළු දමා නිවාස වෙළෙඳසැල් විනාශ කර ඇති විට මේ අංජනමට දිෂ්ටි කර ශ්‍රී කාන්තාව වැඩියාට පසු වතුර මතුරා ඉසිනු. මූදේවියගේ දෝෂ, ගොඩ පාළු, නිවාස පාළු නැති වේ. අඳුන් ටිකක් ගෙන බුලතක ගා මල් බුලත් පුටුවේ තබා ශ්‍රී කාන්තාව අංජනමට ගෙන්වා ශ්‍රී කාන්තා සෝමජීවෙන් 108 වරක් මතුරුවා රන් සුරයක ලා ගෙල පලඳවනු. සම්පත් ලැබේ.

අඳුන් හෙප්පුවට හිමිකම ඇත්තේ ශ්‍රියා කාන්තාවටයි. සියලු කල එළි වැඩවලට මේ අඳුන් හෙප්පුව අත තබාගෙන යනු. ශ්‍රී කාන්තාව වස්තුවට අධිපති නිසා ධන ධාන්‍ය ලැබෙන වේලාවත් මෙම අංජනමෙන් බලවා ගැනීමට හැකිය.

## 66. වේතාල සෝම අංජනම

ඖෂධ :-

අංජන කැට, අමු කපුරු, මුතු බෙල්ලන්ගේ කටුවල කුඩු, රුක් අඟුණ මුල්, නා මුල්, සුලුනයි මුල්, කිඹුල් වැන්න මුල්, රත්මල්, කණාමැදිරියන්, ඊ බදුල්ලන්

මෙම ඔසු විධි ලෙස ගෙන නැවුම් වළඳක ලා අඟුරු වන තුරු බැඳ පිරිසිදු ගලක ලා දුම්මල තෙලෙන් අඹරනු.

ඊට පසු :-

කපුරු, සාම්බ්‍රානි, අගිල්, තුවරලා, ගලිස්, රත් හඳුන්, සුදු හඳුන්, කලාඳුරු අල, පිටසුදු සාරණ මුල්, සැවැන්දරා, දේවදාර, කිකිරිඳිය, මොනර පිල්, නා මල් රේණු, එන්සාල්, සාදික්කා, දුටු සතුටු, කරාබු නැටි, හිඟුරුපියලි, කලාඳුරු

සාදන ක්‍රමය :-

මෙම බෙහෙත් කොටා රෙදි පටියකට ලා දෙකට නවා පන්දම ඔතා එඬරු තෙල්, දොරන තෙල්, තල තෙල්, එළඟි තෙල්, මී තෙල්, අබ තෙල්වලින් පොඟවා ගනු. මුලින් අඳුන



ඇඹරූ බෙහෙත් ගල ලිප් ගල් දෙකක් මත තබා පන්දම ගිනි අවුළා ගලේ බෙහෙත් තිබෙන පැත්තට දුම් ගස්සා නැවතත් අඹරා අඳුන් හෙප්පුවකට දමනු.

"ඕම් හ්‍රීං ශ්‍රීං වේතාල ක්ෂිංපුං හුම් සේ සෝමා"~

අඳුන් හෙප්පුව මල් බුලත් තටුවක තබා බුලත්, මල් පස් වර්ගයක්, කෙසෙල් ඇවරියක්, තැඹිලි ගෙඩියක්, කිරිබත්, සක්කර පොරි, කඩල (බැද) පුද ඇතිව 1000 වරක් ජප කරනු.

එළිය බලන්නට වුවමනා වූ විට 108 වරක් මතුරා ගෙන යන විට වේතාල දේවතාවා අංජනමට පෙනේ. වේතාල දේවතාවාට අපේ රටේ සිටුවටුක දේවතා නම කියනු ඇත. පිස්සන්, යකුන් වැහුණු අය වේතාල දේවතාවාට භය වී මූර්ඡා වේ.

## 67. බලගතු හනුමා දලු අඳුන

ළමයකු ආවේශයෙන් ඇවිද කඩා ගන්නා දලු 108 ක අඳුනකි.

ඖෂධ :-

| | |
|---|---|
| 1. වඳුරු මෑ දලු | 2. අරුද දලු |
| 3. බටකිරිල්ල දලු | 4. මොනරකුඩුම්බිය දලු |
| 5. මුරුංගා දලු | 6. කතුරු මුරුංගා දලු |
| 7. මදු දලු | 8. ගිනිතිල්ල දලු |
| 9. කබරොස්ස දලු | 10. පැණිතෝර දලු |
| 11. ඇහැළ දලු | 12. මැල්ල දලු |
| 13. වන රාජ දලු | 14. විසකුම්භ දලු |
| 15. යක්වනස්ස දලු | 16. නාපිරිත්ත දලු |
| 17. එරබදු දලු | 18. දවුල් කුරුඳු දලු |
| 19. ඔලිඳ දලු | 20. පෙතන් දලු |
| 21. එළකටරොලු දලු | 22. මුකුණුවැන්න දලු |

23. එළ බිංතඹුරු දළු
24. කොක්මොට දළු
25. කුඹුක් දළු
26. කුඹුරු දළු
27. සස්සඳ දළු
28. සියඹලා දළු
29. කවුඩු කැකිරි දළු
30. රන්කිරි ගොකටු දළු
31. වැල්පෙනෙල දළු
32. වැල් තිබ්බටු
33. තැළුම් බටු දළු
34. පිල දළු
35. දෙළුම් දළු
36. දුම්මැල්ල දළු
37. සූරිය දළු
38. මල්කැර දළු
39. ගොරක දළු
40. වද දළු
41. අඹ දළු
42. තොටිල දළු
43. නික දළු
44. කරපිංචා දළු
45. හිඟුරුපට්ටා දළු
46. තුඹ දළු
47. කුඩුමිරිස්ස දළු
48. කැටකැල දළු
49. රමනිස්ස දළු
50. ඇත්දෙමට දළු
51. දඹ දළු
52. සිංහලජම්බු දළු
53. මඟුල් කරඳ දළු
54. කරල්හැබ දළු
55. කිරිඅඟුණ දළු
56. අට්ටික්කා දළු
57. කුප්පමේනිය දළු
58. රණවරා දළු
59. නුග දළු
60. බෝ දළු
61. නා දළු
62. කැබෙල්ල දළු
63. වැරැල්ල දළු
64. උඳුපියලි දළු
65. ඇඹුල් ඇඹිලිය දළු
66. ඇඹරැල්ල දළු
67. ඇඹිල්ල දළු
68. ගොටුකොළ දළු
69. කොහොඹ දළු
70. එළවරා දළු
71. මදුරුතලා දළු
72. ඉරමුසු දළු
73. ඉද්ද දළු
74. සමන් පිච්ච දළු
75. පාවට්ටා දළු
76. ලුණුවරණ දළු



77. බෙලි දළු
78. දිඹුල් දළු
79. රුක් අත්තන දළු
80. එරමුදු දළු
81. අනෝදා දළු
82. කිකිරිඳිය
83. සුළුබුබැවිල දළු
84. මූණමල් දළු
85. හීන්බෝවිටියා දළු
86. හීන්මැඩියා දළු
87. තුන්බෝ අත්තන දළු
88. විෂ්ණුක්‍රාන්ති දළු
89. කපුකිනිස්ස දළු
90. යක්බෙරිය දළු
91. කතුරුපිල දළු
92. අංකෙන්ද දළු
93. කංසා දළු
94. සමදරා දළු
95. අඬනහිරිය දළු
96. මී දළු
97. රදලිය වැලේ දළු
98. ඇට්ටඹුරා වැලේ දළු
99. මාදම් දළු
100. කැහිපිත්තන් දළු
101. කොට්ටම්බා දළු
102. පිටසුදු සාරණ දළු
103. මඩු දළු
104. දොඹ දළු
105. රුක් අඟුණ දළු
106. තිත්ත ලබු දළු
107. කුකුරුමුවන් දළු
108. හීන් උඳුපියලි දළු

එක් වර්ගයකින් දළු තුන බැගින් ගෙන පවනේ වියළා කස්තුරි, මංජල්, කුංකුමප්පු, ගෝරෝචන, කපුරු, අංජන කැට මංචාඩි 3 බැගින් ගෙන සියල්ල වංගෙඩියක ලා කොටා රෙද්දකින් හලා දුම්මල තෙලෙන් පිරිසිදු ගලක අඹරනු. කිරි අබින් පදමට ඇඹරුණාට පසු අඳුන හෙප්පුවක ලා මල් බුලත් පුටුවක් පිට තබා හනුමා පුදට - මල් ජාති 9, බොඩ ජාති 9, දළු ජාති 9, කොඩි 9 (මුල් පෙළේ පොත්වල සඳහන්) පලවැල 9, බුලත් 9, පුවක් 9, රිදී පඬුරු 9, තඹ පඬුරු 9, සඳුන් ගුළි 9, කැවිලි 9, පහන් 9, කපුරු පෙති 9, හඳුන්කූරු 9, කඩල සේරු 1, විලඳ සේරු 1, හබල පෙති සේරු 1, තැඹිලි 1 “සියලු අංජනම් ක්‍රියා ආරම්භයට මතුරන ජීවම” එක් වරක් කියා “ශ්‍රී රාම දිෂ්ටියෙන් 108 වරක් දිෂ්ටි කරනු. ඊට පසු හනුමා දිෂ්ටියෙන් කට්ටකුමංජල් දුම් දෙමින් 108 වර බැගින් ජාම දෙකක් මතුරනු.

ඨ ජාමේ මතුරන විට හඳුන් හෙප්පුවට එළියක් වැටුණා සේ පෙනෙනු ඇත. අවටින් ශබ්ද වෙයි. අමුතු සුවඳක් හමයි. ලකුණු දුටු පසු හනුමා දිෂ්ටි කිරීම නවතා හනුමා මන්ත්‍රයෙන් පුද දී,

"ඕං ත්‍රිවාරුම් රූපි තබුදා ඌම් හිරහිත් නිලවාරුං වර වර තෝස්වාහාඃ ඕං පළමු හද්‍රකාම දිෂ්ටි ඉගිල වර වර ඒස්වාහාඃ ඕං රූඪ ගුරුධාරණී එර්දි දිෂ්ටි ලා වර වර ඒස්වාහාඃ ඕං බ්‍රහ්ම ධාරණී නිලකංච යක්ෂයෝ දස දහසක් සක්වළින් යක්ෂයින් පිරිවරා වරේන්ද්‍ර වර වර ඒස්වාහාඃ ඕං කෙවීර හනුමා වෙරඩඩු මක්කයිරේ පොයිලේ වෙත්තිලේ සුංනාම්බුං පතියාරුං වාලප්පලං තෙක්කා අවුරාල් අවුරාල් කෙවිරාල් ත්‍රිනාල් ආරාම් තින්නවා තින්නවා තින්නු තින්නු." — හනුමා උදාසීනව වැඩ කරන විට බුලත්, පුවක්, හුනු, කෙසෙල් ගෙඩි ආදිය පුද තබා කැප කරනු. හනුමා ප්‍රසන්න වේ. හොඳට වරම් කියා දෙන ලෙස ඉල්ලා සිටිනු. බිසිබිල්ලා මන්ත්‍රයෙන් 21 වරක් ද (අන් තැනක සඳහන්ව ඇත.) හනුමා සෙයියදූවෙන් 40 වරක් ද (අන් තැනක සඳහන්ව ඇත.) හනුමා වෛරෝඩියෙන් 108 වරක් ද මතුරා අඳුන කිලිකුණු නොවදින තැනක පිරිසිදුව තබා ගනු.

අංජනමක් බැලීමට වුවමනා වූ විට මල් බුලත් පුටුවක් තනා සියලුම අංජනම්වලට සාධාරණ න්‍යාය යටතේ සඳහන් සාමාන්‍ය පුද පූජා තබා විෂ්ණු ගෙන්වන මන්ත්‍රයෙන් 21 වරක් මතුරනු. විෂ්ණු එයි. ඉන් පසු අංජනම් දේවි ගෙන්වන මන්ත්‍රයෙන් 21 වරක් මතුරනු. අංජනම් දේවී එයි. හනුමා ගෙන්වන මන්ත්‍රයෙන් 21 වරක් මතුරනු. හනුමා එයි. විෂ්ණු දෙවියන්ට ආසනයක් පනවා ගෙන වැඩ සිටින්නට කියා "එළිය වුවමනා තැනකට යැවීමේ" මන්ත්‍රයකින් හනුමාත්, අංජනම් දේවිත් යවනු. සියලුම සුබ අසුබ වැඩ කියා දෙනු ඇත. මෙය මහා බලසම්පන්න සර්වාංජනමකි.

කෙසේ නමුත් මෙහි සඳහන් අංජනමට දලු සොයා ගැනීමට ආවේශ කර ළමයකු යැවීම සුදුසු නැත. එය භයංකර තත්ත්වයකි. පෙර තිබූ වන පෙත් දකින්නත් අමාරු



යුගයකි. ආවේශයක් නොමැතිව මෙම දලු වැඩිහිටියෙක් සොයා ගැනීමේ වරදක් නැත.

## 68. නැකැත් යෝග බලයෙන් හා ඖෂධ බලයෙන් මන්ත්‍ර රහිතව බලන කන්ද කුමාර අඳුන

ඖෂධ :-

රත් මල්, වද මල්, රත්තම්පලා මුල්, රත්නිවිති ඇට, රත් නෙළුම් රේණු, හෙන්දිරික්කා මල් රතු, රතු අරලිය මල්, මොනර පිල්, මොනරකුඩුම්බිය මුල්, රතුදලන් (රතුපාට මල්, රතුදලන් මැණික් කැබලි විශේෂයකි.) සාදිලිංගන්, සිවංගුරු, මනෝසිල, රතු බූත්සරණ මුල්, රතු සියන් මල්, දෙළුම් මල්.

මෙහි සඳහන් මල්, මුල් වර්ග විධි ලෙස ගෙන පවනේ වියළා ගනු. ඉන් පසු රන් තැඹිලි තෙලෙන් අඹරා ගනු. අඳුන ප්‍රවේසම් කරගෙන කුජ දින කුජ හෝරාවෙන් බලනු. පළමුව රතු එළියක් පෙනේ. දෙවනුව කදිර දෙවියා එයි. මෙයට වෙනත් දෙවිවරු ගෙන්වා ගත නොහැක.

## 69. මන්ත්‍ර නැතිව බෙහෙත් සහ නැකැත් බලයෙන් එළිය බැලීමට විෂ්ණු අංජනමක්

ඖෂධ :-

විෂ්ණුක්‍රාන්තිය මුල් සහ මල්, මදුරුතලා මුල් සහ මල්, තුඹ මුල් සහ මල් (නිල් පාට මල් ඇති වර්ගය) කටරොලු මුල් සහ මල් (නිල් පාට) කොබෝනීල මුල් සහ මල් (නිල් පාට) මානෙල් අල සහ මල්, ගිනිහිරියා මුල් සහ මල්, නිල් දලන් හෝ මැණික්, අංජන කැට, නිල්.

සාදන ක්‍රමය :-

මුල් වර්ග සමානව ගෙන පවනේ වියළා අනෙක් බෙහෙත් වර්ග සමග කුඩු කර ගත යුතුයි. දෙවනුව අවරිය, කිකිරිඳිය සහමුලින් ගෙන කොටා යුෂ ගෙන පොල් කිරට ලා තෙල් සිඳ ගත යුතුයි. ඉන් පසු වියළා කුඩු කර ගත් බෙහෙත් සියල්ල

ගලක ලා සිඳ ගත් තෙලෙන් අඹරා හෙප්පුවක සුරැකිව තබා ගනු.

බදාදා බුද හෝරාවෙන් එළිය බලනු. නිල් එළියක් පෙනේ. විෂ්ණු දෙවියන් පෙනෙන්න යැයි සිතුවාම පෙනේ. මෙයට වෙන දෙවිවරුන් ගෙන්වා ගන්ට නොහැකිය. අවශේෂ වේලාවල දී එළිය පෙනෙන්නේ නැත.

## 70. කුජ දින - කුජ හෝරා බුද දින - බුද හෝරා

ඉහත කී කතරගම විෂ්ණු අඳුන් දෙක බැලීමට කුජ දින කුජ හෝරාත්, බුද දින බුද හෝරාත් සොයා ගන්නා ක්‍රමය පහත සඳහන් වේ. උදය ඉර පායන වේලාව 6 ට අඩු හෝ වැඩි වේ. එය පංචාංගයකින් දැන ගත යුතුය.

කුජ දින හෝරා ලබන ගෙවෙන වේලාවල්

උදේ 6 - 7 අතර කුජ හෝරාවයි.
දවල් 1 - 2 අතර කුජ හෝරාවයි.
රාත්‍රී 8 - 9 අතර කුජ හෝරාවයි.
රාත්‍රී 3 - 4 අතර කුජ හෝරාවයි.

බුද දින බුද හෝරා ලබන ගෙවෙන වේලාවල්

උදේ 6 - 7 අතර බුද හෝරාවයි.
දවල් 1 - 2 අතර බුද හෝරාවයි.
රාත්‍රී 8 - 9 අතර බුද හෝරාවයි.
රාත්‍රී 3 - 4 අතර බුද හෝරාවයි.

## 71. නාථ, සමන්, විභීෂණාදී දෙවිවරුන් වැඩ කර දෙන මහා විෂ්ණු අඳුන

ඖෂධ :-

ඉද්ද මල්, මයිල මල්, අරලිය මල්, එළ බිත්තඹුරු මල්, එළවරා මල්, දුනුකෙයියා මල්, සමදරා මල්, කලාමැදිරි හතු, දුවු සතුටු මුල්, රිදී කුඩු, රත්තරන් කුඩු, හා දිව (හාවාගේ දිව)



මේවා සමව ගෙන මල්, මුල් සහ හා දිව කබලෙන් කළු වන තුරු බැද රන්, රිදී කුඩු සමග එඬරු තෙලෙන් අඹරනු. ඉන් පසු හෙප්පුවක ලා ශ්‍රීරාම දිෂ්ටියෙන් 108 වරක් නියමිත දිෂ්ටි 2 න් 108 වරක් ද ජීවමෙන් 108 වරක් ද මතුරා සුරැකිව තබා ගත යුතුයි.

නියමිත දිෂ්ටිය :-

"ඕං නමෝ සූර්ය දිව්‍ය රාජයා වාරුන් වා වා - චන්ද්‍ර දිව්‍ය රාජයා වාරුන් වා වා - හනුමන්තා වාරුන් වා වා - අංජනම් දේවි වාරුන් වා වා - විෂ්ණු දිව්‍ය රාජයා වාරුන් වා වා - සමන් දිව්‍ය රාජයා වාරුන් වා වා - විභීෂණ දිව්‍ය රාජයා වාරුන් වා වා - කතරගම දිව්‍ය රාජයා වාරුන් වා වා - නාථ දිව්‍ය රාජයා වාරුන් වා වා - ශ්‍රියාදේවි වාරුන් වා වා - සැණින් වර වර ඒස්වාහා"~ 108 වරක් මතුරනු.

නියමිත දිෂ්ටිය 2 :-

"ඕං නමෝ ආකාශ හනුමන්තා සූර්ය දිව්‍ය රාජයා අණින් වර වර ඒස්වාහා පාතාල හනුමන්තා භූමි පත්‍රකාලි අණින් වර වර ඒස්වාහ ශිව හනුමන්තා ශ්‍රී විෂ්ණු අණින් වර වර ඒස්වාහා රාම ගිනි හනුමන්තා ඊශ්වර අණින් වර වර ඒස්වාහාඃ"~ 108 වරක් මතුරනු.

නියමිත ජීවම :-

"ඕං ශ්‍රී විෂ්ණු භාහේස් - ගුරුලාඩී දේස් - ජෝමරාඩි කාහේ - බිසලාඩී - බිසලාඩී - දේවෝ රාජා කීලා හන්ති - කිකුලාඩී දේවි - දේසා ලංකා බාහෝ දේස් - කාලි හාරේ කට්ටු - කයිරාඩි තෝවාඩා - කාහර්ලන්ති - ජාකා - ජාකා - බීසල්ලා හේ හේ කට්ටු - ආවෝ ලංකෙයෑ භාහේස් - ගුරුලාඩා දේස් - ගුරු ගුරු මී - ලංකා දේ හෝ කට්ටු - හල්ලල්ලා දෙය්යා වාරේ - හර් ලා බී බිල්ලා බිස්මන්තා බිහිකට්ටු - කාමා ලාඩා මුඩු හුමාලාජා ඔරාකට්ටු - දෙසාඩී - ගිනි ගිනි - ජේසු - ජෝලා හේලා - ආඩා ලෝඩා - ජීමා ගිනි ගිනි විෂ්ණු දේවාගිනි ගිනි ශර්මාලාඩා දේහෝයාකාතෝ ගිනි ගිනි පූට්ටු කඩහයි"

පුද පූජා :-

මල්, බුලත්, කිරි, සඳුන්, කපුරු, පිනිදිය, සාම්බ්‍රානි, පලතුරු එළිය බලන විට මෙහි සඳහන් පුද තබා පහනක් දල්වා ශ්‍රී රාම දිෂ්ටියෙන් 7 වරක් ද නියමිත දිෂ්ටි දෙකෙන් 21 වරක් ද ජීවමෙන් 21 වරක් ද මැතිරීම කරනු.

විෂ්ණු, නාථ, සමන්, විභීෂණාදී දෙවිවරුන් සහ ශ්‍රී කාන්තාවත් පැමිණ අවශ්‍ය වැඩ කර දෙනු ඇත.

මෙම මහා විෂ්ණු අඳුනේ ජීවම විෂ්ණු බන්ධනය යනුවෙන් ද ගිනිකාම බන්ධනය යනුවෙන් ද සමහරු නම් කරති. දැඩි යකුන්ට නූල් බැඳීමට සියලු ආරක්ෂාවට සුදුසුය. අංජනමක් ලෙස ද ආරක්ෂාවක් ලෙස ද ප්‍රයෝජනයට ගත හැකිය. අංජනමෙන් සිහි නැති වන අයට වතුර මැතිරීමට ද සුබය.

මහා විෂ්ණු අඳුනේ එළිය පිට කරන මන්ත්‍රය

"ඕං දිරි දිරි සක්‍රාම් - දේවී ශක්‍රාම් - උච්චාඩු අම්මා උච්චාඩු"~ 7 ක් හෝ 21 වරක් මතුරනු.

මෙය ඉහත සඳහන් මහා විෂ්ණු අඳුනට පමණි.

## 72. අංජනම් මුදුව

ඔත්තු බැලීමට, ආරක්ෂාවට, වශීයට රාසිං දෙයියන් පැලැඳි අංජනම් මුදුව

සෝම අංජනමෙන් අංජනම් මුදුව සාදා ගැනීමට හැකියාව ඇත. සෝම අංජනම් මුද්ද ඉරට අල්ලා ඔත්තු හෝ වෙන ඕනෑම දෙයක් බලා ගන්නට හැකියාව ඇත. එයින් සර්වජන වශීය ලැබෙන අතර ආරක්ෂාවත් සැලසේ.

අංජනම් මුද්ද සෑදීම :-

පළමුව ආර තූලක් (ආර තූල මැණික් වර්ගයකි.) හෝ සුදු තූලක් ගන්න. දෙවනුව රන් මුද්දක් සාදවා ජීවම් කරන ලද ඉහත කී සෝම මහා අංජනමෙන් අඳුන් අඩියට බදාමක් මෙන් දමා උඩින් ගල් ඇල්ලිය යුතුය. අනෙක් මුදුවලට මෙන් මේ



මුද්දට කුහර හෝ කැටයම් නොතැබිය යුතුය. මෙසේ සාදන ලද මුද්ද දවල් කාලයේ ඉරට අල්ලා ගල දෙස බැලීමෙන් එළිය පෙනේ. විශාල වීමට සිතූ විට විශාල වේ. ඉන් පසු දෙවිවරුනට ආරාධනා කර දෙවිවරු පැමිණි කල වුවමනා කරුණු අසා ගනු. රාත්‍රී කාලයේ මුද්ද පහනට අල්ලා එළිය බැලීමට හැකිය. හස්ත අංජනම අල්ලේ ගා බැලීමට සහ මාපටැඟිල්ලේ නිය පිට ගා බැලීම ද නියම කර ඇතත් එයින් ද අංජනම් මුදු සාදා ගත හැකිය.

සෝම මහා අඳුන ලා ආර තූලක් අල්වා මුද්දක් සාදවා පාවිච්චි කිරීම් ඵලදායකය. හස්ත අංජනම්වලින් පේන මුදු සෑදිය හැකි බැව් පරම්පරානුගතව සඳහන් වේ.

## 73. කිලි කුණු වැළැක්වීම

අතීතයේ අංජනම හෙප්පුවක ලා තවත් භාජනයකට දමා වසා ආරක්ෂිත ස්ථානයක තබා ඇත. නිවසේ ආරක්ෂිත ස්ථානයක් නොවී නම් ගස් බෙනයක සඟවයි. හෙප්පුව ඒ යුගයේ ආරක්ෂිත ලීයෙන් තැනූ භාජනයකි. එදා දේශීය වෛද්‍යවරු අවශ්‍ය ඖෂධ ගෙන ගියේ එවන් භාජනවලය. අද ඒවා නැත. එනිසා අද තත්ත්වයේ පවතින ආරක්ෂිත උපකරණ භාවිත කිරීමට සිදුව ඇත.

එළිය බලන්නට පෙර එය බලන අය මෙන්ම මතුරන අය ද නා සුදු පිරුවට ඇඳ බලන ස්ථානය කහ දියර ඉස පිරිසිදු කර එළිය බලන තැනැත්තා ද කහ දියරෙන් මූණ සෝදා ගෙන මස් මාංස, කිලිකුණුවලින් වැළකී අංජනම් බැලිය යුතුය.

නොදැනුවත්ව කිලි අසු වී නම් පහත මන්ත්‍රයෙන් කිලි නැති කර ගත යුතුය.

"ඕං නමෝ නැගනන්ද නම් සෘෂීන් වහන්සේලා - ඕං නමෝ"~ කියන මන්ත්‍රයෙන් සත් වරක් මතුරාගෙන - "අමල කිලි ගම දෙටු දහසක් මැදින් ගොස් - තිරී කිලි ගම් දෙටු දහසක් මැදින් ගොස් - එරන් සල් ගස උඩ තිබුණු එරන්මිණි

සඟල ගත් ආඥාවෙන් අදත් මාගේ යන්ත්‍ර මන්ත්‍ර අඳුන් හඳුන් එවල කිලි නැතිය."— 7 වරක් පමණි.

මින් හෙප්පුවට (අංජනම ආරක්ෂිත භාණ්ඩය) මතුරා දුම් අල්ලනු. කහ දියර මතුරා නිවසට ඉසිනු. බලන අය ද කහ දියරෙන් මූණ සෝදා ගනු.

## 74. පංචෝපචාරය

ඇතැම් පංචෝපචාරයෙන් මැතිරීමට විවිධ ක්‍රම සහ ඔසු උපයෝගී කර ගනිතත් නියම පංචෝපචාර මෙහි සඳහන් වේ.

1. සුගන්ධ 2. දීප 3. ධූප 4. තාම්බූල
5. නෛවේද්‍ය

1. සුගන්ධ :- පිනිදිය, සඳුන්, හඳුන්කූරු, සුවඳ පැන් පිදීම.

2. දීප :- පහන් දැල්වීම.

3. ධූප :- කට්ටකුමංජල්, කපුරු දුම් ඇල්ලීම.

4. තාම්බූල :- බුලත් පිදීම.

5. නෛවේද්‍ය :- අංගන්‍යාස කරන්‍යාසාදිය පැවැත්වීම නොහොත් ශරීරාංගයන්ගෙන් ඇඟිලි අත්වලින් වන්දනා මාන කිරීම.

පෝය දින නිවාඩුව දෙවිවරුන්ගේ දිනයක් ලෙස සැලකේ. අපට දිනක් දෙවියන්ට තත්පර කීපයකි. පෝයත් යහපත් වැඩ කරන දිනයකි. මන්ත්‍රයත් අංජනමත් හරි නම් සියලු පෝය දිනයන්හිම දෙවිවරුන් ගෙන්විය හැකිය. වෙසක් පෝය දින වුව ද අංජනම් එළි බලා බෙහෙත් කර රෝගීන් මාර මුඛයෙන් ගොඩ ගැනීමට හැකියාව ඇත. පෝය දින මනුෂ්‍යයාට වුවමනා නිසා නිවාඩු ගන්නවා මිස දෙවි දේවතාවුන්ට නිවාඩු අවශ්‍ය නැත.